# නිදහසට මඟ

## නිදහස ගැන අදහස් එකතුවක්




සංස්කරණය

ආචාර්ය රිචර්ඩ් වෙලින්ංස්

# නිදහසට මඟ

© Nightwatchman Society

Website : www.nightwatchmansociety.org

ISBN : 978-624-5481-00-2

# නිදහසට මග

## නිදහස ගැන අදහස් එකතුවක්

### සංස්කරණය - ආචාර්ය රිචර්ඩ් වෙලින්ග්ස්

**ප්‍රථම ප්‍රකාශණය** - ඇඩම් ස්මිත් ආයතනය (Adam Smith Institute)
**පරිවර්ථනය** - නයිට් වොච්මන් සමාජය (Nightwatchman Society)

# පෙරවදන

# නිදහස පිළිබඳ ආධුනික මග

**පෙරවදන - ආචාර්ය සරත් රාජපතිරණ විසිනි**

ප්‍රසිද්ධ කතුවරුන් විසින් රචනා කරන ලද රචනා දහයක එකතුවක් වන මෙම පොත නිදහස පිළිබඳ වැදගත් තොරතුරු රැසක් ඔබ වෙත ගෙන එයි. රචනාවල මාතෘකා වනුයේ: නිදහසේ වැදගත්කම, වෙළඳපළ ක්‍රියාත්මක වන ආකාරය, නිදහස් වෙළඳාම, බදුකරණය සහ රජයේ වියදම්, දේපළ අයිතිවාසිකම්, රජයක් අසමත් වන්නේ ඇයි, ලිංගිකත්වය, මත්ද්‍රව්‍ය සහ නිදහස, රාජ්‍යයක් නොමැතිව සුබසාධනය, බැංකු, උද්ධමනය සහ අවපාතය සහ රජයේ භූමිකාව යනාදියයි. සංවර්ධිත රටවල පුද්ගලයන්ගේ නිදහස අඛණ්ඩව උල්ලංඝණය වන අතර, නූතන ලෝකයේ එවන් අභියෝග අවබෝධ කර ගැනීම සඳහා මෙම රචනා තනි තනිව හා සාමූහිකව වැදගත්වේ. කතුවරුන් පෙන්වා දෙන පරිදි, නිදහස ආරක්ෂා කළ යුතු වන අතර, මෙම රචනා නිදහස බුද්ධිමය වශයෙන් ආරක්ෂා කිරීමට දායක වෙයි.

මෙම රචනාවන් ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් ආවරණය කරයි. යෞවන මෙන්ම යෞවනෝදයේ සිටින්නන්ට ද හොඳින් අවබෝධ කරගත හැකි පරිදි සරලව මෙන්ම ගැඹුරින් ගෙන එන මෙම කරුණු ආර්ථිකය සහ නීතිය ආවරණය කරමින් රචනා කර තිබේ. තමා ජීවත් වන ස්ථානය කුමක් වුවත්, ඔවුන් ජීවත් වන පරිසරය තුළ නිදහස සඳහා වූ කැපවීම ශක්තිමත් කිරීම මෙම රචනාවන්හි අරමුණ යි. මෙම රචනාවන්, සැලසුම්කරණය කෙරෙහි ඇල්මක් දක්වන අයට වෙළඳපළ ක්‍රියාත්මක වන ආකාරය, රජය අසමත් වීමට හේතුව, සහ රාජ්‍යය නොමැතිව සුබසාධනය පිළිබඳ සාරගර්භ දැනුමක් සපයනු ඇත.

සියලු රචනා නිදහසේ වැදගත්කම අවධාරණය කරමින් නිදහස පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට අවශ්‍ය පසුබිම සපයයි. නිදහසක් නොමැතිව, කිසිවකුටත් ඉහළ ආදායමක් ලබමින් රන් කූඩුවක සිටින ගිරවෙකු මෙන් යහපත් ජීවිතයක් සහතික කළ නොහැකි බව පැහැදිලි ය. වැදගත් අදහස් රැසක් සරල භාෂාවෙන් ලියා ඇති මෙම පොත හොඳ මාර්ගෝපදේශයකි.

# හැඳින්වීම

# හැඳින්වීම

**රිචර්ඩ් වෙලිග්ස් විසිනි**

නිදහස ආරක්ෂා කළ යුතුව ඇත. ඇමරිකාව හා බ්‍රිතාන්‍යය ඇතුළු බටහිර රටවල ආණ්ඩු මහජනයාගේ ජීවිතවල පාලනය වැඩි වැඩියෙන් අත්පත් කර ගනිමින් සිටියි.

මෑත කාලයේ දී ඔවුහු නඩු නැතිව සැකකරුවන් සිරගත කරමින්, අලුතින් බොහෝ දේ අපරාධ ලෙස නම් කරමින්, නිදහස් අදහස් ප්‍රකාශ කිරීම මර්දනය කරමින් සහ වධ හිංසාවට පවා ඉඩදෙමින් සිටිති. එසේ වුව ද, නිදහසට ප්‍රහාර එල්ල කිරීම පොලිස් රාජ්‍යයක් කරා ක්‍රමානුකූලව ගමන් කිරීමට වඩා පුළුල්ව සිදුවන්නකි.

පසුගිය ශත වර්ෂය පුරා බදුවල සිදු වූ විශාල ඉහළයාමේ තේරුම නම් අද වන විට උපයන සෑම පවුමක ම, ඩොලරයක ම හෝ යුරෝවක ම විශාල කොටසක් රාජ සන්තක කර ඇති බවයි. ඉතිරිව ඇති වටිනාකමින් වැඩි කොටසක් ආපසු ගනු ලබන්නේ පාලනයන් මගිනි. පාලනයන් වැඩි කිරීමේ ඉහළ නගින රැල්ල මගින් සිදුවන්නේ අප මිල දී ගන්නා බඩුවල මිල ඉහළ යාමයි. කුමන හෝ ආකාරයකින් රජය මගින් මෙහෙයවනු නොලබන හෝ සීමා කරනු නොලබන ක්‍රියාකාරීත්වයන් සංඛ්‍යාව අඩු වෙමින් පවතියි.

අප තෝරාගන්නා ආකාරයට අපගේ ජීවිත ගත කිරීමට අපට ඉඩ දීමේ ප්‍රතිලාභ තේරුම් ගැනීමට දේශපාලන නායකයන් පැහැදිලි ලෙස ම අසමත් වී ඇත. අපගේ හැකියාවන් හා නිර්මාණශීලි බව නිදහස් කරමින්, නිදහස මගින් පෙර නොවූ විරූ සමෘද්ධියක් ගෙනෙන අතර නව අදහස් මත ප්‍රභාමත් අනාගතයක් ගොඩනැගීම සහතික කරයි. එමෙන්ම අති බලවත් රාජ්‍යයන්ගෙන් නිතර ඇති වන අයුතු බලපෑම් වලින් ආරක්ෂාවක්ද එමගින් අපට හිමිවෙයි.

අපගේ දේශපාලනඥයන්ගේ නොදැනුවත් භාවය ද සුවිශේෂී නොවේ. විශ්ව විද්‍යාල මගින් පෙර කිසිදාකට වඩා වැඩි සිසු පිරිසකට උගන්වන්නේ වී නමුත් ඔවුන්ට නිදහස ගැන අවබෝධය ලබාදෙන්නේ අඩුවෙනි. ඇත්ත වශයෙන්ම අධ්‍යාපනය තුළ ආධිපත්‍යය දරන්නේ ආණ්ඩුවට වඩා විශාල කාර්යභාරයක් ලබාදීමේ මතවාදය යි.

"නිදහස සඳහා බලපෑම්වලින් මග පෙන්වීමක්" නම් මෙම පොත ඉහත කී පක්ෂපාතිත්වය නිවැරදි කිරීමේ කුඩා පියවරකි. එය සැලසුම් කොට ඇත්තේ පළමුවරට නිදහසේ තර්කය හදාරන යම් අධ්‍යාපනයක් ඇති ජනයා සඳහා ය. ආර්ථික සහ දේශපාලන ප්‍රශ්න පිළිබඳව සාමාන්‍ය දැනීමක් අපේක්ෂා කළ ද, තාක්ෂණික භාෂාව යොදා ගැනීම හැකිතාක් දුරට අඩු කොට ඇත. සෑම පරිච්ඡේදයකින් ම නිදහස සම්බන්ධයෙන් ප්‍රධාන අංශයක් සාකච්ඡා කෙරෙන අතර ඒ ගැන වැඩිදුර තොරතුරු අවශ්‍ය අය සඳහා වැඩිදුර කියවීම්වල කෙටි ලැයිස්තුවක් අවසානයේ අඩංගු කොට ඇත.

මග පෙන්වීම ආරම්භ වන්නේ නිදහසේ අර්ථය සහ එම සංකල්පය එතරම් ම වැදගත් වන්නේ ඇයි යන්න පැහැදිලි කිරීමකින් ය. එමගින් වෙළඳ පොළ ක්‍රියාත්මක වන ආකාරය, නිදහස් වෙළඳාම, බදු සහ ආණ්ඩුවේ වියදම් මෙන් ම දේපළ අයිතිය ගැන ද සාකච්ඡා කෙරෙයි. මෙම රචනා මගින් නිදහසේ ප්‍රතිලාභ ඉතා හොඳින් පැහැදිලි කරන අතර නිදහස සීමා කිරීමට ගන්නා ක්‍රියාමාර්ග මගින් බරපතළ අයහපත් බලපෑම් ඇතිවන්නේ කුමක් නිසා ද යන්න පැහැදිලි කරයි. ආණ්ඩු අසාර්ථක වන්නේ ඇයි?, තහංචි, සුබ සාධනය සහ බැංකුකරණය ගැන ලියවුණු අවසන් පරිච්ඡේද ගොඩ නැගෙන්නේ රාජ්‍යයයේ මැදිහත් වීමේ විනාශකාරී ප්‍රතිවිපාක පිළිබඳව තියුණු අවධානයක් යොමු කිරීමේ තේමාව මත ය.

ලිපි පෙළ අවසන් වන්නේ ආණ්ඩුවේ සුදුසු කාර්යභාරය පිළිබඳ සාකච්ඡාවකිනි. දේශපාලනයට ඇති අවකාශය තදින් ම සීමා කළ යුතුය යන නිගමනයට එළඹීම අවසන් පරිච්ඡේදයෙන් සිදුකොට තිබේ. ඇත්ත වශයෙන් ම, වත්මන් යුගයේ ආණ්ඩු හොඳට ම ප්‍රමාණය ඉක්මවා ඇති බවට පැහැදිලි පණිවිඩයක් සමස්තයක් ලෙස පොතෙන් ලබා දෙයි.

මෙයින් පෙන්නුම් කරන්නේ බටහිර දී පවා අප ජීවත් වන්නේ ඇත්ත වශයෙන්ම නිදහස් සමාජ වල නොවන බවයි. ඇත්ත වශයෙන් ම අප එය තේරුම් ගත්තත් නැතත්, අපගේ ජීවිතවල බොහෝ අංශ තදින් ම පාලනයට ලක්ව ඇත. කෙසේ වෙතත් මෙම මග පෙන්වීම මගින් මහජනයා පීඩාවට පත් කිරීම ගැන දේශපාලනඥයන් හා නිලධාරීන් විවේචනයට ලක් කිරීමට වැඩි දෙයක් සිදු කරයි. එහි විශේෂඥ කතුවරුන් වඩා හොඳ විකල්පයක් ඉදිරිපත් කරයි. එනම් නිදහස මත පදනම් වූ ආකර්ෂණීය, ගතික හා සමෘද්ධිමත් ලෝකයකි. නිදහසේ ආධාරකරුවන් මතවාදී සටන ජය ගතහොත් එය කළ හැකි වෙයි. "නිදහස සදහා ආධුනිකයන්ට මග පෙන්වීමක්" පොත එම සටනේ කොටසකි.

# කර්තෘවරුන් පිළිබඳව

# කර්තෘවරුන් පිළිබඳව

**පීටර් ජේ බෝයිට්කේ** – මර්කේටස් මධ්‍යස්ථානයේ ධනවාදය අධ්‍යයනය සම්බන්ධ මහාචාර්යවරයා වන අතර ජෝර්ජ් මේසන් විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයා ද වෙයි . (www.gmu.edu)

**කැරොල් බෝඩ්රෝක්ස්** – මර්කේටස් මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ සාමාජිකාවකි. ඇය එන්ටර්ප්‍රයිස් අප්‍රිකා ව්‍යාපෘතියේ ප්‍රධාන පර්යේෂකවරියයි. (www.mercatus.org)

**ඒමන් බට්ලර්** – ඇඩම් ස්මිත් ආයතනයේ (www.adamsmith.org) අධ්‍යක්ෂවරයෙකි. ඔහු 2008 දී පළ කරන ලද 'the best book on the market' පොතේ කතුවරයා ද වෙයි.

**ස්ටීවන් ඩේවීස්** – මානුෂික අධ්‍යයනයන් පිළිබඳ  ආයතනයේ (www.theihs.org) වැඩසටහන්  නිලධාරිවරයා ය. මැන්චෙස්ටර් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයේ ඉතිහාස දෙපාර්තමේන්තුවේ ජේෂ්ට කථිකාචාර්ය වරයෙකි. 'empirisysm and history' (2003) පොතේ කතුවරයා ය.

**ඇන්තනි ජේ එවන්ස්** – ඊ එස් සී පී යුරෝපා ව්‍යාපාරික පාසලේ ආර්ථික විද්‍යා මහාචාර්යවරයා ය . ඔහු කොබ්ඩේන් මධ්‍යස්ථානයේ ආරම්භක සාමාජිකයෙකි . (www.cobdencentre.org)

**ඩැනියල් ග්‍රීස්වෝල්ඩ්** – කාටෝ ආයතනයේ වෙළඳ ප්‍රතිපත්ති අධ්‍යයන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයෙකි . 2009 දී පළ කරන ලද 'mad about trade' පොතේ කතුවරයා ය . (www.cato.org)

**ජේ සී ලෙස්ටර්** – නිදහස්වාදී  දර්ශනවාදියකු වන අතර 'escape from leviathan' පොතේ කතුවරයා ය. ඔහු දැන් ඉදිරියේ පළ කිරීමට නියමිත 'a dictionary of anti-politics' පොත සංස්කරණය කරමින් සිටියි.

**ජෝන් මිඩොක්රොෆ්ට්** – ලන්ඩන්, කිංග්ස් කොලේජ්හි (www.iea.org.uk) රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ කථිකාචාර්ය වරයා ය. ඔහු, 2006 දී පළකරන ලද 'the ethics of the market' පොතේ කතුවරයා ය.

**ඩැනියල් ජේ මිචෙල්** – කාටෝ ආයතනයේ (www.cato.org) ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකි. ඔහු, 2008 දී පළ කරන ලද 'global tax revolution' පොතේ සම කතුවරයෙකි.

**ක්‍රිස්ටීන් නීමිට්ස්** – ආර්ථික කටයුතු ආයතනයේ (www.iea.org.uk) දරිද්‍රතා අංශයේ සාමාජිකයෙකි. ඔහු, ලන්ඩන්, කිංග්ස් ආයතනයේ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ආචාර්ය උපාධි අපේක්ෂකයෙකි. එම ආයතනයේ ආර්ථික විද්‍යා කථිකාචාර්යවරයෙකි.

**ඩග්ලස් බි රොජර්ස්** – ජෝජ් මේසන් විවිශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳව තෙවන වසරේ ආචාර්ය උපාධි අපේක්ෂකයෙකි. ඔහු මර්කටස් මධ්‍යස්ථානයේ ද ආචාර්ය උපාධි සාමාජිකයෙකි. (www.mercatus.org)

**රිචර්ඩ් වෙලින්ග්ස්** – ආර්ථික කටයුතු ආයතනයේ නියෝජ්‍ය කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂවරයා ය. ඔහු අයි ඊ ඒ බ්ලොග් හි කතුවරයා ද වෙයි. (blog.iea.org.uk)

# පටුන

# පටුන


| | | |
|---|---|---|
| | හැඳින්වීම - රිචර්ඩ් වෙලිග්ස් | 3 |
| | පෙරවදන - නිදහස පිළිබඳ ආධුනික මග - ආචාරය රිචර්ඩ් වෙලිග්ස් | 11 |
| | කර්තෘවරුන් පිළිබඳ | 13 |
| 1 | නිදහසේ වැදගත්කම - ජේ සී ලෙස්ටර් | 17 |
| 2 | වෙළෙඳපොළ ක්‍රියාත්මක වන්නේ කෙසේ ද? - ඊමන් බට්ලර් | 27 |
| 3 | නිදහස් වෙළඳාම - ඩැනියල් ග්‍රීස්වෝල්ඩ් | 37 |
| 4 | බදුකරණය හා ආණ්ඩුවේ වියදම් - ඩැනියෙල් ජේ මිචෙල් | 45 |
| 5 | දේපළ අයිතීන් - කැරොල් බෝඩ්රෝක්ස් | 57 |
| 6 | ආණ්ඩු අසාර්ථක වන්නේ ඇයි ? - පීටර් ජේ බෝයිට්කේ සහ ඩග්ලස් බී රොජර්ස් | 67 |
| 7 | ලිංගිකත්වය, මත්ද්‍රව්‍ය සහ නිදහස ආණ්ඩුවේ තහනම්වලට එරෙහිව කරුණු දැක්වීම - ජෝන් මෙඩෝක්රෝෆ්ට් | 79 |
| 8 | රජය නොමැතිව සුභසාධනය - ක්‍රිස්ටියන් නීමීට්ස් | 89 |
| 9 | බැංකුකරණය, උද්ධමනය සහ අවපාතය - ඇන්තනි ජේ. එවන්ස් | 101 |
| 10 | ආණ්ඩුවේ කාර්යභාරය - ස්ටීවන් ඩේවිස් | 109 |

# 1

# නිදහසේ වැදගත්කම

# නිදහසේ වැදගත්කම

**ජේ සී ලෙස්ටර් විසිනි**

නිදහස යනු දේශපාලනයේ, ආර්ථික විද්‍යාවේ සහ දර්ශනවාදයේ ප්‍රධාන සංකල්පයකි. ජනතාවට සමෘද්ධිමත් හා පරිපූර්ණ ජීවිත ගත කිරීමට නිදහස අවශ්‍ය බව විශ්වාස කරන අතර ආණ්ඩු හා දේශපාලනඥයන් එය විනාශ කිරීමේ භයානක ප්‍රතිවිපාක පෙන්වා දෙන නිදහස්වාදීන්ට සහ සම්භාව්‍ය ලිබරල්වාදීන්ට එය විශේෂයෙන් වැදගත් වෙයි මෙම තර්ක වඩා විස්තරාත්මකව සාකච්ඡා කිරීමට පෙර නිදහසේ අර්ථය පිළිබඳ පැහැදිලි කිරීමකින් පරිච්ඡේදය ආරම්භ කෙරෙයි.

**නිදහස යනු කුමක් ද ?**

නිදහස සඳහා ඉංග්‍රීසියෙන් යෙදෙන ලිබර්ටි (liberty) හා ෆ්‍රීඩම් (freedom) යන වචන දෙකෙහි සැලකිය යුතු වෙනසක් නැති අතර ඒවා එකිනෙකට විකල්ප ලෙස යොදා ගනු ලබයි . ඒවාට ඇත්තේ ඉංග්‍රීසි භාෂාවේ විවිධ මූලයන් පමණකි. ලිබර්ටි යන්න ලතින් භාෂාවේ ලිබර්ටාස් (libertas) යන්නෙන් පැමිණි අතර ෆ්‍රීඩම් යන්න පැමිණියේ පැරණි ඉංග්‍රීසියේ ෆ්‍රීඕඩම් (freodom) යන්නෙනි.

යම්කිසි නිශ්චිත වචනයක තේරුම කුමක් ද යි සාකච්ඡා කිරීම සාමාන්‍යයෙන් අවශ්‍ය වන්නේ නැත. අනෙක් අය ද තේරුම් ගන්නේ අප අදහස් කළ දේ ම යයි අපට එය සුළු කොට තැකිය හැකි ය. එසේ වුව ද සදාචාර, සමාජ හෝ දේශපාලන සන්දර්භයකින් මතු වන මූලික වචන සම්බන්ධයෙන් හැම විට ම එසේ වන්නේ නැත. එබැවින් එය වැදගත් වන්නේ ඇයි කියා කියන්නට පෙර 'නිදහස' යන්න සම්බන්ධයෙන් අර්ථ දැක්වීමක් හෝ ඇතැම් විට න්‍යායක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වෙයි.

'නිදහස' යන්න ඉතාම සාමාන්‍ය අර්ථයෙන් සඳහන් වන්නේ යම් කිසිවකට බාධා නැති බවයි. මෙහි දී අප උනන්දු වන්නේ මහජනයාට අනෙක් මහජනයාගෙන් බාධා නොමැති වීම පිළිබඳවයි.

අනෙක් අය විසින් මැදිහත් වීම් නොකිරීම හෝ බලෙන් නොපැටවීම (අනාක්‍රමණීය නිදහස) ලෙස නිදහස අර්ථ දැක්විය හැකි ය. ප්‍රහාරයට හෝ සොරා ගැනීමට ගොදුරු නොවීම නිදහසේ කොටසකි. මහජනයා ප්‍රහාරයට හෝ සොරකමට හෝ ලක් කිරීම නිදහසේ කොටසක් නොවේ.

එයින් පෙනී යන්නේ ඔබ අන් අයගේ සිරුර හෝ දේපළ මත බලපෑම් නොකරන තාක් කල්, ඔබගේ ම ශරීරයෙන් (ස්වයං හිමිකාරිත්වය පිලිබඳ මුලධර්මය) සහ ඔබගේ ම දේපළ මගින් ඔබට කැමති දෙයක් කිරීමේ හැකියාව යන්න නිදහසේ තේරුම බවයි. උදාහරණයක් ලෙස භයානක මත් ද්‍රව්‍ය ගැනීම වැනි ක්‍රියාවක් මගින් ඔබට හානි කර ගැනීමේ අයිතිය ඔබ සතු වුවත් ඔබ ඔවුන්ගේ කැමැත්ත නැතිව අන් අයකුට හානි කළොත් හෝ දේපළ විනාශ කළොත් ඔබ ඔවුන්ගේ නිදහස උල්ලංඝනය කරයි.

නිදහස සදහා පෙනී සිටින විට නිදහස්වාදීන් හා සම්භාව්‍ය ලිබරල්වාදීන් අදහස් කරන්නේ නිදහස පිළිබඳ මෙම අර්ථයයි. එමෙන් ම එය බටහිර ඉතිහාසය තුළ නිදහස සම්බන්ධයෙන් පැවති ආධිපත්‍යධාරී අදහස වන අතර එය සාමාන්‍යයෙන් 'ලිබරල් ' ලෙස විස්තර කෙරෙන ඕනෑ ම සමාජයකට අදාළ ය.

එබඳු නිදහසක් සැම දෙනා ම විසින් අපේක්ෂා කරනවා පමණක් නොව අඩු තරමින් විශාල ප්‍රමාණයකින් හැම දෙනාට ම සුදුසු වෙයි. එමගින් එක ම වෙලාවක සමාජයේ සියලු දෙනාට සම්පූර්ණ නිදහස ලබා දෙන අතර නිදහස උල්ලංඝනය වීම් හඳුනා ගැනීමට ද එමගින් හැකියාව ලැබෙයි. හොරකු හෝ මිනිමරුවකු වැනි ආක්‍රමණිකයකු කරන්නේ ඔහුගේ හෝ ඇයගේ නිදහස භුක්ති විඳීම නොවේ. ඇත්තෙන් ම ආක්‍රමණිකයාට ප්‍රතිවිරෝධය දක්වන්නා අන් අයගේ නිදහස සීමා නොකර තමන්ගේ නිදහස ආරක්ෂා කරයි.

වැදගත් කාරණය වන්නේ ආණ්ඩු තමන්ගේ සොරා ගැනීම 'බදුකරණය' ලෙසත් තමන්ගේ මිනීමැරුම් 'යුද්ධ' ලෙසත් හඳුන්වනු ලැබුව ද, සොරකම තවමත් සොරකම ම වන අතර මිනීමැරීම තවමත් මිනීමැරීම ම වන බවයි. මැදිහත් වීමට බලපෑමට සහ පාලනයට ඇති සීමාන්තික හඹා යාම නිසා අධි බලවත් ආණ්ඩු නිදහසේ විශාලතම සතුරෝ වෙති.

**ඔබ වෙනුවෙන් තීරණ ගැනීම**

ආණ්ඩු නිදහස සීමා කරන විට මහජනයාට තමන් තෝරා ගන්නා ආකාරයට තම ජීවිත ගත කිරීම අපහසු වෙයි. නිදහස ඉතා වැදගත් වන්නේ එමගින් සමෘද්ධිමත් වීමටත්, අපගේ අභිලාෂයන් සඳහා උත්සාහ දැරීමටත් අප තෝරා ගන්නා ජීවන මාර්ගයේ ගමන් කිරීමටත් අපට ඉඩ ලැබෙන නිසා ය.

උදාහරණයක් ලෙස ඔබ හැකියාව ඇති කතුවරයෙකු යයි සිතන්න. එසේ වුව ද ඔබ ලියන්නට කැමති වර්ගයේ පොත් ආණ්ඩුව විසින් තහනමට ලක් කොට ඇත. එසේ නැත්නම් ඔබ ව්‍යවසායකයකු, ගෘහ නිර්මාණ ශිල්පියකු, සිනමාකරුවකු හෝ නව නිර්මාණකරුවකු වුව ද ආණ්ඩුවේ පාලනයන් නිසා ඔබගේ අදහස් ක්‍රියාවට නැගිය නොහැකි ය.

වෙනත් උදාහරණයක් නම් ඉතා මෑත කාලයක් වන තෙක් බටහිර රටවල් බොහොමයක සමලිංගික හැසිරීම් විශාල ලෙස හෝ සම්පූර්ණයෙන් ම හෝ තහනම් කොට තිබිණි. ලෝකයේ බොහෝ තැන්වල එය තව ම නීතී විරෝධී ය. අත් අඩංගුවට ගැනීම සහ සිරගත කිරීම මගින් සහ මානසික රෝහල්වල බලහත්කාරයෙන් ප්‍රතිකාර කිරීමෙන් පවා සම ලිංගික ප්‍රජාවට තම ජීවිත සපුරා ගැනීමේ අවස්ථා ආණ්ඩු විසින් වළකාලනු ලැබී ය.

අපගේ අභිලාෂයන් හඹා යාමේ දීත් අපගේ පුද්ගලික අවශ්‍යතා තෘප්තිමත් කරගැනීම සඳහාත් නිදහස පැහැදිලිව ම අත්‍යවශ්‍ය ය. එසේ වුව ද එය ආත්මාර්ථකාමී වීම නොවේ. අන් අයට උපකාර කිරීමේ නිදහස ද එයින් අපට ලබා දෙයි .ඇත්ත වශයෙන් ම අප සදාචාරවත් වීම හෝ සදාචාරවත් නොවීම හෝ තීරණය වන්නේ අපට අපගේ හැසිරීම ගැන තීරණ ගැනීමට හැකි වන ප්‍රමාණයට ය.

පුද්ගලයින් ඔවුන්ගේ හැසිරීම් පිළිබඳව වගකීම් දරන තරමට, එනම්, අත්හදා බැලීම් කිරීමට, ඔවුන් කැමති ලෙස ජීවත් වීමට, නිදහස ඇති විට ඔවුන්ගේ වැරදීම්වලින් ඉගෙන ගැනීමටත් සංවර්ධනය වන අලුත් අදහස්වල ප්‍රයෝජන ලැබීමටත් අපට හැකි වෙයි. ආණ්ඩුවේ අප්‍රාණික හස්තයෙන් ගෙල අදහස්වල සිර කළ සමාජයකට වඩා නිදහස් සමාජයන් වඩා සාර්ථක හා විචිත්‍රවත් වීමට එක් හේතුවක් මෙය යි.

## ආර්ථික නිදහස

නිදහස් සමාජයක අන් අය සමග වෙළඳාම් කිරීමේ නිදහස ජනතාවට හිමි වන අතර නිදහස් වෙළඳ පොළක් සංවර්ධනය විය හැකි ය. (2 සහ 3 පරිච්ඡේද බලන්න). පුද්ගලික දේපොළට ඇති ආරක්ෂාව ව්‍යාපාර සංවර්ධනය දිරිමත් කරයි. එවිට අන් අයගේ වුවමනාවන් සපුරමින් ඔවුන්ට ලාභ ඉපයිය හැකි වන අතර එම ලාභ ආණ්ඩු විසින් රාජසන්තක කරනවා වෙනුවට ව්‍යාපාරවල ම රඳවා ගන්නා නිසා නැවත ආයෝජනය කළ හැකි වීමෙන් අනාගතයේ වැඩි ධනවත් බවක් ඇති කරයි.

වෙනත් අදහස් අත්හදා බැලීමටත් වෙනස් වන තත්ත්වයන්ට අනුව හැඩ ගැසීමටත් නිදහස නිසා ව්‍යාපාරිකයන්ට ඉඩ සැලසෙයි. භාණ්ඩ හා සේවා වඩා අඩු මිලට ලබාදිය හැකි වන ලෙස වඩා හොඳින් තාක්ෂණය සංවර්ධනය කළ හැකි වෙයි. ජීවිත වඩා යහපත් ලෙස පරිවර්තනය කරන අලුත් සොයා ගැනීම් හඳුන්වා දිය හැකි ය. භයානක රෝග සඳහා ප්‍රතිකාර මෙයට උදාහරණයකි.

සම්පත් ඒවායේ වඩාත් ඵලදායී ප්‍රයෝජන වෙත යොමු කිරීම හා සහතික කිරීම නිදහස් වෙළඳ පොළ මගින් සිදු වෙයි. (වෙළඳ පොළ මගින් කරන ආර්ථික ගණනය කිරීම් කළ හැකි වෙනත් විකල්පයක් සොයා ගෙන නැත). එහි ප්‍රතිඵලයක් ලෙස ජීවන මට්ටමේ විශාල වර්ධනයක් සිදු වෙයි. එබැවින් දුප්පත්කම අඩු කිරීම සඳහා නිදහස අත්‍යවශ්‍ය වෙයි.

එසේ වුව ද ආණ්ඩු නිතර ම ක්‍රියා කරන්නේ දේශපාලන හේතු මත වෙළඳ පොළ සීමා කිරීමට ය.

උදාහරණයක් ලෙස දේශපාලනඥයන් ඉහළ බදු පැනවිය හැකි ය (4 වන පරිච්ඡේදය බලන්න) නැතහොත් ඇතැම් භාණ්ඩ වෙළෙඳාම තහනම් කළ හැකි ය (7 වන පරිච්ඡේදය බලන්න). එබඳු මැදිහත් වීම් සාමාන්‍යයෙන් ධනවත් භාවයට මෙන් ම නිදහසට ද විනාශකාරි ය. ව්‍යාපාර දියුණුව වඩා දුෂ්කර කිරීමෙන් එය සමෘද්ධිමත් බව විනාශ කරන අතර මහජනයා සහ ඔවුන්ගේ දේපළට ආක්‍රමණශීලී ලෙස මැදිහත් වීමෙන් නිදහස සීමා කරයි.

නමුත් වෙළඳ පොළට යම් ප්‍රමාණයක ආණ්ඩුවේ මැදිහත් වීමක් අවශ්‍ය නැද්ද ? මෙහි දී නිදහස්වාදීන් හා සම්භාව්‍ය ලිබරල්වාදීන් අතර මත ගැටුමක් ඇත. ආරක්ෂාව හා අධිකරණ ක්‍රමය වැනි සේවා ලබා දෙමින් නිදහස ආරක්ෂා කරන කුඩා ආණ්ඩුවක් වන අවම රාජ්‍යයක් හා එය නඩත්තු කිරීම සඳහා ඉතා අඩු බදු තිබිය යුතු බවට සමහරු තර්ක කරති. මීට ප්‍රතිවිරුද්ධ ලෙස වෙනත් අය විශ්වාස කරන්නේ බදුවල අවශ්‍යතාවයක් නොමැතිව වෙළඳ පොළ හා පුණ්‍යායතන මාර්ගයෙන් මෙම සේවාවන් පවා ස්වේච්ඡාවෙන් වඩා හොඳින් ලබා දිය හැකි බව යි.

කෙසේ වෙතත් මෙම අදහස් දෙක දරන දෙපාර්ශවය ම එකඟ වන කරුණක් වන්නේ අද අප දකින ආණ්ඩුවේ මැදිහත් වීමේ මට්ටම නිදහසේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගත් විට කිසිසේත් පිළිගත නොහැකි බවයි. ඉහළ බදු සහ දැඩි පාලන නීති ආර්ථික වශයෙන් හානිකර අතර පුද්ගලික නිදහසට බාධා කරයි.

## සමානාත්මතාවය හා සමාජ සාධාරණත්වය

එහි ඇති පල ප්‍රයෝජන කුමක් වුවත් 'සමාජ සාධාරණත්වය සාක්ෂාත් කර ගැනීමේ උත්සාහයක් වශයෙන් ආණ්ඩු නිතර ම නිදහස සීමා කරයි. යම් ප්‍රමාණයක සමානතාවයක් (ආදායමේ හෝ ධනයේ) පැනවීමට හෝ කෙනෙකුගේ ජන වර්ගය, ලිංගිකත්වය හෝ අබල දුබල බව නිසා අසාධාරණයට ලක් වීම වැළැක්වීමට ඔවුහු උත්සහ දරති. දුප්පතුන් වැනි වෙනත් අයට දීම සඳහා ඇතැම් ජනයාගේ මුදල් රජයට පවරා ගැනීමට හෝ ඇතැම් කණ්ඩායමක සාමාජිකයන් සේවයේ යෙදවීමට ව්‍යාපාරිකයන්ට බල කිරීමට හෝ ඔවුන් ක්‍රියා කළ හැකි ය.

එසේ වුවද 'සමාජ සාධාරණත්වය යනු හානිකර හෝ නොවුවමනා සමාජ වෙනස්කම් සමාජයේ පැවතීම නම් එය අපට ලබාදෙන්නේ නිදහස පිළිබඳ ප්‍රවේශයක් මගින්

පමණකි. ඇත්තෙන් ම, නිදහස් වෙළඳ පොළේ ක්‍රියාකාරිත්වය එබඳු වෙනස් කම් ඉවත්කිරීමට උපකාරී වෙයි.

කාලයක් තිස්සේ ආදායමේ හා ලාභයන්ගේ විෂමතා ඉවත් කිරීමට තරඟය හේතු වීය. ඉතිරිව ඇති ඕනෑ ම වෙනසක් අවශ්‍ය වන්නේ වටිනා නිපුණතා සංවර්ධනය කර ගැනීමට වෙහෙසී වැඩ කිරීමට ජනයා දිරි ගැන්වීම සඳහාය.

හොඳ ආර්ථික හේතුවක් නොමැතිව සේවකයන් හෝ පාරිභෝගිකයන් අසාධාරණයට ලක් කරන ව්‍යාපාර එසේ නොකරන ව්‍යාපාර විසින් පරාජය කරනු ලබනු ඇත. එබැවින් අසාධාරණයට හා අසමානතාවලට විසඳුම් දීමේ දී නිදහස් වෙළඳ පොළ ඉතාමත් ප්‍රතිඵලදායක ය.

ඊට ප්‍රතිපක්ෂව 'සමාජ සාධාරණත්වය' ඇති කිරීමට ආණ්ඩු දරන උත්සාහයන් එයට ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵල ලබා දිය හැකි අතර ආර්ථික වශයෙන් විනාශකාරී විය හැකිය. උදාහරණයක් වශයෙන් ස්ත්‍රීන් සේවයෙන් ඉවත් කිරීම වඩා දුෂ්කර වන ලෙස නීති පනවා ඇත්නම් ව්‍යාපාරිකයන් පළමුවෙන් කරනු ඇත්තේ ස්ත්‍රීන් අඩුවෙන් සේවයේ යෙදවීමයි. එමගින් සැබවින් ම සිදු වන්නේ ලිංග අතර අසමානතාවය වැඩි වීමයි. එමෙන්ම රැකියා විරහිතයන්ට හොඳ දීමනාවක් දෙන්නේ නම් රැකියාවක් සොයා ගැනීමට ඔවුන් උනොදරනු ඇත. එමගින් දුප්පත්කම වැඩි වෙයි.

**නිදහස ගැන විකල්ප මත**

මෙම වර්ගයේ රාජ්‍ය මැදිහත් වීම් නිදහස සම්බන්ධයෙන් ඉහත සඳහන් කළ ආකාරයේ වෙනස් මත මගින් නිතර ම ශක්තිමත් කරයි.

උදාහරණයක් වශයෙන් නිදහස යන්න එකතුව බින්දුව වන ක්‍රීඩාවක් ලෙස දැකිය හැකි ය. වෙනත් ආකාරයකින් කිවහොත් එක් අයකුට නිදහස අහිමි වන විට හැම විටම එය තවත් අයකු නිදහස ලැබීමක් බවට පත්වෙයි. උදාහරණයක් වශයෙන්, යම් කිසිවකු මගේ අවසරයකින් තොරව මගේ මෝටර් රථය ගතහොත් එවිට එම රථය භාවිත කිරීමේ මගේ නිදහස අහිමි වන අතර එය ගන්නා තැනැත්තා එම මෝටර් රථය භාවිතා කිරීමේ නිදහස ලබයි.

මෙම මතයෙන් කියන්නේ සොරකුගේ හෝ වෙනත් ආක්‍රමණිකයකුගේ නිදහස සහ එහි වින්දිතයකුගේ නිදහස අතර තුලනය කිරීමක් අවශ්‍ය බවයි. එබඳු නිදහසක් සියලු දෙනාට උපරිම කළ නොහැකි ය. කළ හැක්කේ තරඟකාරී ලෙස ලබා ගැනීම හෝ යම් ආකාරයකින් බෙදා ගැනීමයි. මෙය ප්‍රශ්න ඇති කරයි. විශේෂයෙන් ම මෙහි දී කුමන වර්ගයේ නිදහසකට නැතහොත් කුමන කණ්ඩායමකට ප්‍රමුඛත්වය දෙනවා ද යන්න තීරණය කිරීම සඳහා නිදහස පමණක් ම නොව වෙනත් මූලධර්ම ද අවශ්‍ය වෙයි.

එක් පොදු වරදක් නම් නිදහස යනු ප්‍රජාතන්ත්‍රවාදය හා ඡන්දය දීමේ අයිතිය ලෙස දැකීමයි. නමුත් නිදහස විනාශ කරන දේශපාලනඥයකුට වැඩි දෙනා ඡන්දය දිය හැකි ය. උදාහරණයක් ලෙස, සුළුතරයේ දේපොළ සොරකම් කිරීම හෝ ආක්‍රමණකාරී යුද්ධ මෙහෙයවීම හෝ සිදු කළ හැකි ය.

රටක ජීවත් වෙමින් ප්‍රජාතන්ත්‍රවාදයට සහභාගී වෙමින් මෙලෙස නිදහස උල්ලංඝනයට අපට කැමැත්ත දිය හැකි ද ? නැත. නරක අඩු ම අපේක්ෂකයාට ඡන්දය දෙමින් අපගේ පාලකයන් කරන ඕනෑ ම හානියක් අවම කර ගැනීමට අප උත්සාහ කරන්නේ නම් එය ආණ්ඩුව කරන හානියට කැමැත්ත දීමක් නොවේ. අපරාධ පවතින බව දන්නා ප්‍රදේශයක අප ජීවත් වන නිසා පමණක් අප අපරාධ සඳහා කැමැත්ත දුන්නා වන්නේ නැත.

ආදායමේ හෝ ධනවත් බවේ සමානත්වය සහ නිදහස පටලවා ගැනීමට ඉඩ ඇත. ඔවුන්ට තමන්ට අවශ්‍ය දේ කිරීමට සම්පත් නැති නිසා දුප්පත් ජනයාට නිදහස නැති බව සමාජවාදීන් කිව හැකි ය. නිදහස පිළිබඳ මෙම වැරදි වැටහීම ඉතා ම භයානක ය. වෙනත් ජන කණ්ඩායමකට සම්පත් ලබා දීම සඳහා තවත් කණ්ඩායමකින් සොරකම් කිරීමට එමගින් හැකියාව ලැබෙයි . එය ස්වයං අයිතිය හා පෞද්ගලික දේපළ පිළිබඳ මූල ධර්මය උල්ලංඝනය කරයි.

**නිදහස මියගිය විට**

ආණ්ඩු එබඳු සමානත්වයක් පැටවීමට උත්සාහ දරන විට සැබෑ නිදහස විනාශ වෙයි. එයට හේතු වන්නේ ජනයා ඔවුන්ගේ කුසලතා, හැකියා සහ අපේක්ෂා අනුව විශාල ලෙස එකිනෙකාට වෙනස් වුවත් ඔවුන්ගේ වත්කම් මට්ටම් සමානව පවත්වා ගැනීම සඳහා ඔවුන්ව තදින් පාලනය කළ යුතු වීම නිසා ය.

දේශපාලනඥයන් බොහෝවිට උත්සාහ කර ඇත්තේ එබඳු 'සමාන' සමාජ ගොඩනැගීමට වන අතර එම උත්සාහයන්ගේ ප්‍රතිඵල විනාශකාරී වීය. උදාහරණයක් ලෙස 'කොමියුනිස්ට්' රුසියාවේ ජනතාවට ව්‍යාපාරික කටයුතු තහනම් කොට තිබූ අතර ආර්ථිකය කඩා වැටුණේ ය. පෞද්ගලික දේපළ සම්පූර්ණයෙන් සොරකම් කිරීමට විරුද්ධ වන ඕනෑම කෙනෙකුට ආණ්ඩුව මගින් සිරගත කිරීමේ, වධ හිංසාවට ලක් කිරීමේ හෝ මරා දැමීමේ  අනතුරට මුහුණ දීමට සිදුවෙයි. අවසානයේ තමන්ගේ ම ආණ්ඩුව විසින් දශ ලක්ෂ ගණනක් ජනයා මරා දැමුණු අතර තවත් දශ ලක්ෂ ගණනක් සිර කඳවුරු වෙත යවනු ලැබී ය.

දේශපාලනඥයන්ගේ වුවමනාවන් මගින් පුද්ගලයන්ගේ නිදහස යටපත් කරන විට, දේශපාලන බලය සඳහා නිදහස කැප කිරීම නිසා එබඳු කුරිරුකම් පොදු තත්වයට පත් වෙයි. එය හොඳින් දන්නා උදාහරණයක් වන්නේ  දෙවන ලෝක යුද්ධ සමයේ නාසි ජර්මනියයි. ආක්‍රමණික යුද්ධයක් මෙහෙය වූ හිට්ලර්ගේ ජාතික සමාජවාදී ආණ්ඩුව යුදෙව්වන්, අභිගුණ්ඨිකයන් හා සමලිංගිකයන් මරා දමමින්, සන්නද්ධ හමුදාවලට සම්බන්ධ වී සටන් කොට මිය යන්නට තරුණ ජනයාට බල කළේ ය.

අපට නිදහසේ ඇත්ත වටිනාකම දැනෙන්නේ එය නැති වූ විට ය . නිදහස නැති වූ විට අප අපගේ ම අරමුණු කරා යන  සහ අපගේ ම  ජීවන රටාවන් තීරණය කරන නිදහස් මිනිසුන් වන්නේ නැත .  එවිට අප රාජ්‍යයේ වහලුන්ට වඩා වෙනස් වන්නේ සුළු වශයෙනි.

## වැඩිදුර කියැවීම්

*Friedman" David D' [1973] ^1989& The Machinery of Freedom( Guide to Radical Capitalism ^2nd edition&" La Salle" IL'( Open Court'*

*Lester" J' C' ^2000& Escape from Leviathan( Liberty" Welfare" and Anarchy Reconciled" London( Palgrave Macmillan'*

*Narveson" Jan ^2008& You and The State( A Short Introduction to Political Philosophy" Lanham" MD( Rowman & Littlefield'*

*Rothbard" Murray N' [1973] ^2006& For a New Liberty( The Libertarian Manifesto ^2nd edition'&" Auburn" AL( Ludwig von Mises Institute'*
*Online at( http($$mises'org$rothbard$newlibertywhole'asp*

# 2

# වෙළෙඳපොළ ක්‍රියාත්මක වන්නේ කෙසේ ද?

# වෙළෙඳපොළ ක්‍රියාත්මක වන්නේ කෙසේ ද?

**ඒමන් බට්ලර් විසිනි**

වෙළඳ පොළවල් පුදුම සහගත ය. දශ ලක්ෂ ගණන් විවිධාකාර වූ පුද්ගලයන්ගේ උත්සාහයන් සම්බන්ධීකරණය කරමින් ඒවා ලෝක ජනගහනය සාමකාමී වෙළඳාම සඳහා එක්සත් කරයි. අපට අනවශ්‍ය දේ අපට අවශ්‍ය දේ සමග හුවමාරු කර ගැනීමට ඒවා අපට අවස්ථාව සපයයි. ඒවා මගින් සම්පත් ඒවාට ඉහළම වටිනාකමක් ලැබෙන තැන් වලට යොමු කරයි  ඒවා මගින් නාස්තිය අධෛර්යමත් කර අලුත් අදහස් දිරි ගන්වයි. වෙළඳ පොළවල් මගින්  මේ සියල්ල සිදු කරන්නේ එය කරන්නේ කෙසේදැයි කිසිදු ආණ්ඩුවක හෝ බලධාරියකුගේ මග පෙන්වීමකින් තොරව ය. එය පුදුමාකාර වුව ද ඇත්තකි.  ඉතින් ලෝකය තුළ වෙළඳ පොළ ඇත්තටම ක්‍රියාත්මක වන්නේ කෙලෙස ද ?

මහජනයාට වඩාත් හුරු පුරුදු වෙළඳ පොළවල් නම් භාණ්ඩ මිලදී ගැනීමට හා විකිණීමට මහජනයා එක්රැස් වන ස්ථානයි. එනම් පලතුරු සිට චීස් දක්වාත්, පොත්පත් සිට ඇදුම් පැලඳුම් දක්වාත්, අරුමෝසම් බඩුවල සිට ස්වර්ණාභරණ දක්වාත් සියලු දේ විකුණන යුරෝපයේ වෙළඳ චතුරශ්‍රයක දී ඔබට දැකිය හැකි වෙළඳ කුටිවල එකතුවකි. නැතහොත් චීනයේ ලාංශෝහි මා දුටු  පරිදි, උණු සුප්, ජීවි මාළු, පරවියන්, බාල්දි, පාපැදි කොටස්, සන්ෆ්ලවර් ඇට සහ සබන් ආදිය විකුණන සෙලවෙන මඩුවලින් පේළිවලින් සමන්විත මාවත් වැන්නකි. එසේත් නැතහොත් ලෝකයේ විශාලතම මල් වෙළඳ පොළ පිහිටි ඇම්ස්ටර්ඩෑම් අසල ආම්ස්මියර් මෙන් හෝ සෞදි අරාබියේ අල් කසිම්හි බුරයිඩා මහා ඔටු වෙළඳ පොළ වැනි විශේෂ ස්ථානයක් විය හැකි ය.

එම ඕනෑම ස්ථානයක සිය ගණන් ජනයා, විකිණීමට ඇති භාණ්ඩ කඩිමුඩියේ සසඳා බලමින්, මිල කේවල් කරමින්, මිලදී ගනිමින් හා විකුණමින් හුවමාරු කිරීමේ යෙදී සිටිති. නමුත් මේ අයිස් කුට්ටියේ පෙනෙන කොටස පමණකි.  බොහෝ වෙළඳ

පොළවල් එක් විශේෂ ස්ථානයක නොව අප වටාම පවතියි. නැව්, පාවහන්,සීල් කිරීමේ ආලේපන, තොග බැඳුම්කර, කොටස්, මුද්දර, පාසල් ගුරුවරුන්, සාප්පු සහායකයින්, සහ ශබ්දකෝෂයේ ඇති තවත් දශ ලක්ෂ ගණනක් භාණ්ඩ හා සේවා සඳහා වෙළඳ පොළවල් ඇත. හුවමාරුව අපගේ ජීවිතයේ කොටසකි. එසේ වුව ද අප එසේ කරන්නේ ඇයි ?

## හුවමාරුව වටිනාකම් එකතු කරයි

සරල ය. අප යම් දේවල් හුවමාරු කර ගන්නේ වටිනාකම අඩු යයි අප හිතන යම් දෙයක් වෙනුවට වටිනාකම වැඩි යයි අප හිතන යම් දෙයක් ලබා ගැනීමට හැකි වන නිසා ය. ළමයින් පවා මෙය දනිති. තමන්ට එපා වී ඇති සෙල්ලම් බඩු වෙනත් ළමයින් සතුව ඇති තමන් වඩා කැමති වන ඒවා සමග ඔවුහු හුවමාරු කර ගනිති. ඔවුහු පාපන්දු කාඩ් සහ ස්ටිකර් හුවමාරු කර ගනිති. ඉතාම වැදගත් කරුණ වන්නේ මෙයින් දෙපාර්ශවය ම ප්‍රතිලාභ හිමිකර ගැනීමයි. ඔබට එපා වූ සෙල්ලම් බඩුව වෙනත් ළමයකු ඉතාමත් කැමති වන්නක් විය හැකි ය. ඔබ සතුව දෙකක් ඇති මැන්චෙස්ටර් යුනයිටඩ් ස්ටිකරය හරියටම අනෙක් ළමයා සොයමින් සිටි දෙය විය හැකි ය. එමෙන් ම ඔහු සතුව වැඩිපුර ඇති ලිවර්පුල් ගෝලී ඔබ ලෝකය පුරා සොයමින් සිටි දෙය විය හැකි ය.

මෙම ගනුදෙනුවෙන් ඔබ දෙදෙනාට ම වාසි අත් වෙයි. ඔබ ඒ සඳහා දුන් දෙයට වඩා ඔබට වටිනා දෙයක් ඔබට ලැබෙයි. එසේ නොවන්නේ නම් කිසිවකු හුවමාරුවක් සඳහා ඉදිරිපත් වන්නේ නැත. මෙය සිදු වන්නේ අගයෙන් අඩු යමක් භාර ගැනීම සඳහා එක් පාර්ශවයක් අනෙක් පාර්ශවය රැවටීමක් හෝ එම පාර්ශවයට බලකිරීමක් ලෙස නොවේ. වටිනාකම ඇත්තේ එය දකින්නාගේ දැක්ම මත යි. එය ඔබ විකුණන දේ සම්බන්ධයෙන් පෞද්ගලික, විෂයබද්ධ අදහසකි. එය යම් වස්තුවක විශාලත්වය හා බර මෙන් පොදු, වාස්තවික, මැන බැලිය හැකි ගුණයක් නොවේ.

එකම දෙයක වටිනාකම විවිධ අය නියම කරන්නේ විවිධ ආකාරයෙනි. බුරයිඩාහි දරුණු හිරු රශ්මිය යටතේ සිටින අයකු වතුර භාජනයක් දියමන්ති වලට වඩා වටිනා බව සිතිය හැකි අතර වැසි අධික අල්ස්මියර්හි සිටින අයකු ඊට ප්‍රතිවිරුද්ධ ලෙස

ගණන් බැලිය හැකි ය. ඇත්තෙන් ම වටිනාකම ගැන ජනයා අතර එකඟතාවක් නැති වන තරමට ඔවුන්ට වෙළෙඳාම් කිරීම පහසු වෙයි.

**වෙළෙඳපොළවල් එකෙනෙකට වෙනස් ප්‍රයෝජන සමහන් කරයි**

ලෝක සාමය සම්බන්ධයෙන් ගත් විට එය තරමක ආශීර්වාදයකි. විවිධ ජන කණ්ඩායම් සමග වෙළඳාම් කිරීමට අප ඔවුන්ගේ දේශපාලනයට, සංස්කෘතියට හෝ ආගමට හෝ එකඟ වීම අවශ්‍ය නොවේ. අවශ්‍ය වන්නේ වටිනාකම ගැන අප අතර එකඟතාවයක් නොවීම පමණකි. එය ඉතා ම පහසු දෙයකි. විශේෂයෙන් ම ලෝකය හා එහි නිෂ්පාදිත භාණ්ඩවල ඇති විවිධත්වය නිසා ම එය පහසු ය. බ්‍රිතාන්‍යයේ රටඉඳි සහ වයින් හොඳින් වැඩෙන්නේ නැත. එසේ වුව ද නිෂ්පාදකයන් සමග ඔවුන්ගේ මිල ගැන හැර අන් කිසි දෙයක් ගැන එකඟ නොවී, මට ඒවා ඉරාකයෙන් හා චිලී රාජ්‍යයයෙන් මිල දී ගත හැකි ය.

පාසල් බිමේ දී ලිවරපුල් කඩුළු රකින්නකුගේ මිල යුනයිටඩ් ස්ටිකර් එකකි. එසේ වුව ද බොහෝ වෙළඳ පොළ සම්බන්ධයෙන් අප මිල ගණන් කතා කරන විට අප සමාන්‍යයෙන් සිතන්නේ මුදල්මය මිලක් පිළිබඳ ය. මුදල් යනු විශේෂ දෙයක් නොවේ. එය යම් දෙයක වටිනාකමෙහි මිනුමක් නොවේ. එය මහජනයා තමන්ගේ යම් දෙයක් සඳහා භාර ගැනීමට සුදානම් භාණ්ඩයකි. එසේ වන්නේ එය පසුව තමන්ට අවශ්‍ය වෙනත් දෙයක් සඳහා පහසුවෙන් හුවමාරු කර ගැනීමට හැකි බව දන්නා නිසා ය. එවිට බඩගින්නේ සිටින කරණවෑමියන්ට  කොණ්ඩය කැපීමට අවශ්‍ය ව සිටින බේකරිකරුවන්  සොයා යන්නට සිදු වන්නේ නැත. ඔවුන්ට මුදලට කාගේ හෝ කොණ්ඩය කපා පසුව වෙනත් අයකුගෙන් පාන් මි ගැනීමට එම මුදල් යොදා ගත හැකි ය.

**මිල මගින් සන්නිවේදනය සිදු වන්නේ කෙසේ ද ?**

මහජනයා යමක වටිනාකම මනින්නේ කෙසේ ද යන්න  මෙන් ම එය කොතරම් දුලබ ද යන්න ද මුදල්මය මිල මගින් හෙළිදරවු කෙරෙයි.  අලුත්, තිබිය යුතු ම නිෂ්පාදනයක් කිරීම සදහා ටින් ලෝහය අවශ්‍ය වන්නේ යයි සිතන්න. අලුත් භාණ්ඩය සැම දෙනාට ම අවශ්‍ය වෙයි. වැඩි වන ඉල්ලුමෙහි වාසිය ලබා ගෙන එයින් යම් මුදලක් උපාය ගැනීම සඳහා නිෂ්පාදකයන් තම නිෂ්පාදනය ඉහළ දමයි.

නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා තව තවත් ටින් මිලදී ගැනීමට නිෂ්පාදකයන්ට සිදුවෙයි. ඔවුන් ලෝහ සපයන්නන්ගෙන් වැඩියෙන් ඇණවුම් කිරීමත්, ලෝහ සපයන්නන් පතල් කරුවන්ගෙන් වැඩියෙන් ඇණවුම් කිරීමත් සිදුවෙයි. පතල් නිෂ්පාදනය එක් වර ම වැඩි කළ නොහැකි ය. එසේ වුව ද තමන්ගේ මිල වැඩි කළ හැකි බව පතල්කරුවන් මෙන් ම සපයන්නෝ ද තේරුම් ගනිති. පාරිභෝගික ඉල්ලීම ඉතා ඉහළ නිසා ඒම මිල ගෙවීමට ද නිෂ්පාදකයෝ සූදානම් ව සිටිති. නව නිෂ්පාදිතයේ ඉහළ මිල නිසා පාරිභෝගිකයන් එය ප්‍රතික්ෂේප කරන තෙක් හෝ වෙනත් අයකු ටින් අඩුවෙන් යොදා ගන්නා නිෂ්පාදිතයක් සොයා ගන්නා තෙක් ඔවුන්ට මිල ඉහළ දැමීම කළ හැකි වෙයි.

ඒ අතර ටින් මිල ඉහළ යාම සමස්ත වෙළඳ පොළට ප්‍රබල සංඥාවක් නිකුත් කරයි. මහජනයා ටින් සඳහා ඉහළ වටිනාකමක් නියම කරයි. එය දුලබ බවට පත් ව ඇත. ඔබ ටින් කරන්නේ නම් අඩුවෙන් භාවිත කරන්න. නැතහොත් වෙනත් ලාභ විකල්පයක් සොයා ගන්න.

මෙම මිල සංඥාවට ප්‍රතිචාර වශයෙන් පතල්කරුවන් තම පතල්වල නිෂ්පාදනය වැඩි කිරීමට හෝ නව නිධි සොයා ගැනීමට හෝ උත්සාහ දරනු ඇත. තම ගබඩාවල නිකරුනේ ගොඩ ගැසී තිබෙන තොග අඩු කිරීමට සැපයුම්කරුවන් තොග ඉක්මනින් විකුණා දැමීමට පෙළඹෙනු ඇත. ටින් අඩුවෙන් භාවිත කරන්නට හෝ ලාභ විකල්ප සොයා ගැනීමට හෝ පර්යේෂණ කිරීමට භාණ්ඩ නිෂ්පාදකයන් යොමු වනු ඇත. මෙතරම් මිල අධික ලෝහයක් මත රඳා නොපවතින ලෙස මහජනයාගේ ඉල්ලුම සපයන වෙනත් ක්‍රම සොයා බැලීමට වෙනත් නව නිෂ්පාදකයන් පෙළඹෙනු ඇත.

එලෙස මිල යනු සමස්ත සමජය ම එකට සම්බන්ධ කරන විශාල සන්නිවේදන ජාලයකි. නව ඉල්ලුමට ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය ගැන එමගින් සියලු දෙනා දැනුවත් කරයි. මෙය සිදු වන්නේ වෙළඳ පොළේ සිටින ජනයා සම්බන්ධයෙන් පමණක් නොවේ. ටින් වෙනුවට ක්‍රෝම් යොදා ගැනීමෙන් තමන්ට මුදල් ඉතිරි කර ගත හැකි වන බව වෙනත් නිෂ්පාදකයන්ට පෙනී ගියහොත් ඔවුන්ගෙන් ඇති වන අලුත් ඉල්ලුම නිසා ක්‍රෝම් මිල ද ඉහළ නගින්නට පටන් ගනියි. එවිට ක්‍රෝම් භාවිතා කරන්නන් ද ලාභ විකල්ප සොයනු ඇත. එලෙස සියලු වෙළඳ පොළවල් වෙත මෙම බලපෑම ගමන් කරනු ඇත.

ටින් භාවිතා කරන නව නිෂ්පාදිතය ලබා ගැනීමට පාරිභෝගිකයන්ගේ ඇති අවශ්‍යතාවය නිසා ආර්ථික නිෂ්පාදිතයේ සම්පූර්ණ ව්‍යුහය ම වෙනසකට ලක් වෙයි. ඒ සියල්ල සිදු වන්නේ මිල මගින් ලබාදෙන සංඥා වලට ප්‍රතිචාර දක්වන ස්වයංසිද්ධ ක්‍රියාවලියක් වශයෙනි. ටින් හෝ ක්‍රෝම් හෝ වෙනත් දේ හෝ නිෂ්පාදනය වැඩි කළ යුතු බව හෝ ඒවායේ භාවිතය අඩු කළ යුතු බව හෝ මහජනයාට කියා දීමට කිසිදු බලධාරියකු අවශ්‍ය වන්නේ නැත. පැතිරී යන මිල සංඥාවන්ට ස්තූති වන්නට අන් අයගේ ඉල්ලුම, සැලසුම් සහ ක්‍රියාවන් හා ගැළපෙන ලෙස ස්වයංසිද්ධ ලෙස තම සැලසුම් හැඩ ගසා ගැනීමට හා තම ක්‍රියා සම්බන්ධීකරණය කර ගැනීමට මහජනයාට හැකි වෙයි.

මෙය පාරිභෝගිකයන්ට හොඳ ආරංචියකි. මක්නිසාද, එමගින් ටින් වැනි දුලබ සම්පත් ඒවාට වැඩි ම වටිනාකමක් හිමි වන ස්ථාන වෙත යොමු වෙයි. වටිනා සම්පත් පාරිභෝගිකයන්ට ලබා දෙමින් නිෂ්පාදකයින්ට ඉහළ මිලක් ලබා ගත හැකි නම්, එය ම කිරීමට වැඩි නිෂ්පාදකයින් පිරිසක් වැඩි වෙහෙසක් දරනු ඇත. පාරිභෝගිකයින්ට ඒවා වැඩියෙන් ම අවශ්‍ය වන ස්ථාන වෙත හැම සම්පතක් ම යොමු වීම එවිට සිදුවන්නේ ස්වයංසිද්ධ ආකාරයෙනි.

ඒ ආකාරයෙන් ම එය ලෝකයට ද සුබ ආරංචියකි. දුලබ සම්පත් අඩුවෙන් භාවිතයෙන් මිලට ප්‍රතිචාර දැක්වීමට මහජනයාට හැකි නම් ඔවුන් එසේ කරනු ඇත. පාරිභෝගිකයන් මිලදී ගැනීමට කැමති වන ගුණාත්මක බවින් යුත් භාණ්ඩ නිෂ්පාදනය සඳහා සොයා ගත හැකි ලාභ ම යෙදවුම් මිශ්‍රණය යොදා ගැනීමට නිෂ්පාදකයන්ට ද සෑම දිරි ගැන්වීමක් ම ඇත.

## ස්වයංසිද්ධ විධිවිධානයක්

ස්වේච්ඡා හුවමාරුව හා එය තුළින් මතු වන මිල ගණන් මත පදනම් වූ මෙම විධිවිධානය නම් වෙළඳ පොළ ක්‍රියාවලියයි. එය ඉතා ම ස්වභාවිකව මතු වුවක් යන කරුණ පසෙක තිබිය දී මෙය අතිශයින් කාර්යක්ෂම ක්‍රමයකි. එය හොඳින් සිතා බලා දැනුවත්ව සැලසුම් කළ යුතු නොවී ය. භාෂාව හෝ සමාජ සම්මුති මෙන් එය ස්වයංසිද්ධ ලෙස වැඩුණි. එය දිගට ම පැවතුනේ එය අපට ප්‍රයෝජනවත් වූ නිසා ය.

ඇත්තෙන් ම මෙම ස්වයංසිද්ධ සමාජ ක්‍රමය පරිපූර්ණ නැත. මානවයා සම්බන්ධ කිසිවක් පරිපූර්ණ නැත. ටින් සඳහා වූ ඉල්ලුම වෙනස් වූ පමණින් නිෂ්පාදනයේ ව්‍යුහය

සැණකින් කිසියම් නව තුලනයක් කරා ඉබේ ම වෙනස් වන්නේ නැත. අනුගත වීමට හැම දේට ම කාලයක් ගතවන අතර ඒ අතර ජනයා අතින් වැරදි සිදු වෙයි. තමන්ට ආසන්නයේ සිදු වන දේ ඔවුන්ට දැන ගත හැකි වන නමුත් අනෙක් සියලු තැන්වල සිදු වන දේ හරියට ම  දැන ගැනීමට හැකියාවක් ඔවුනට නැත.  වෙනස්වීම්වලට අනෙක් හැම දෙනා ම ප්‍රතිචාර දක්වන ආකාරය හෝ හරියට ම කිවහොත් එම වෙනස්වන ප්‍රතිචාරවලට හොඳින් ම අනුගත වීමට ඔවුන්ට හැකි වන ආකාරය දැන ගැනීමට ඔවුන්ට හැකියාවක් නැත.

එවිට තොරතුරු අසම්පූර්ණ, විසිරුණු, බිඳී ගිය හා කෙටි කාලීන වෙයි. උදාහරණයක් ලෙස, කුමන වර්ගයේ මෝටර් රථ ලබා ගත හැකි වන්නේ ද, ප්‍රවාහනය බලාපොරොත්තුවෙන් කොපමණ පාරිභෝගික පිරිසක් සිටින්නේ ද ඔවුනට යාමට අවශ්‍ය කුමන ස්ථාන වලට ද යන කරුණු ටැක්සි සමාගමක් දැන ගත යුත්තේ ය. ප්‍රදේශයේ සිනමා ශාලා වසන අවස්ථාව වැනි වෙලාවල දී සැපයුමේ හෝ ඉල්ලුමේ ඉහල යාම් අපේක්ෂා කිරීම එයට අවශ්‍ය වෙයි. එය මේ සියල්ල දැනගත යුත්තේ මාසයෙන් මාසය සඳහා නොව මොහොතින් මොහොත සඳහා ය.

විශාල රටක මධ්‍යම සැලසුම්කරුවකුට මේ සියලු ප්‍රාදේශීය තොරතුරු එක්රැස් කරගෙන අවශ්‍ය වන හැම කෙනෙකුට ම  ටැක්සියක් ලබා දීම සහතික කිරීමේ ක්‍රමයක් නැත. සැලසුම් මණ්ඩලය වෙත තොරතුරු වාර්තා වීමටත් පෙර ඇතැම් විට ඒ සඳහා ක්‍රියාත්මක වීමටත් පෙර එම තොරතුරු යල් පැන තිබිය හැකි ය. එමෙන් ම ඇතැම් තොරතුරු වන්නේ ප්‍රාදේශීය ජනයාගේ අභ්‍යන්තර හැඟීම් වන අතර ඒවා වචනවලට කැටි කොට සැලසුම්කරුවන් වෙත යැවීම ද කළ නොහැකි ය. එනම් රූපවාහිනියේ පෙන්වන වැදගත් පා පන්දු තරඟය නිසා එදින සවස සිනමාශාලා වෙත යාමට අවශ්‍ය වන ජන සංඛ්‍යාව අඩු වීමට ඉඩ තිබීම වැනි කාරණා ය.

එබඳු විසිරුණු, ප්‍රාදේශීය, අසම්පූර්ණ හා  පෞද්ගලික තොරතුරු සම්බන්ධයෙන් ඕනෑ ම මධ්‍යම සැලසුම් ක්‍රමයකට වඩා ඉතා හොඳින් ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වෙළඳ පොළට ඇත. ඇත්තෙන් ම අපගේ සම්පත් බෙදීමේ විවිධ ක්‍රම රාශියක් තිබෙන නිසා කිසිදු මධ්‍යම සැලසුම්කරුවකුට මෙය කිරීමේ හැකියාවක් නොතිබිය හැකි ය.

අප නිෂ්පාදනය කළ යුත්තේ තෙල් ද? වයින් ද? මහජනයාට අවශ්‍ය කුමක්දැයි හා එයින් කොපමණ ප්‍රමාණයක් දැයි සැලසුම්කරුවා සොයා බැලිය යුත්තේ ය. ඉන්පසු කොපමණ වයින් ගස් වැවිය යුතු දැයි තිරණය කළ යුතු ය. නෙලන්නන් සංවිධානය කළ යුත්තේ ය. බැරල් හෝ බෝතල් නිෂ්පාදනය කළ යුතු අතර ඒ සඳහා ලෝහ හෝ විදුරු අවශ්‍ය වෙයි. අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සංවිධානය කළ යුතු ය. මේ නිෂ්පාදනයන් දෙකක් සදහා පමණකි. දශ ලක්ෂ ගණනක් වන විට කාර්යය දශ ලක්ෂ වාරයක් අපහසු වෙයි. එසේ වුව ද වෙළඳ පොළ ක්‍රියාවලිය මගින් මෙම සම්පූර්ණ නිෂ්පාදන තීරණ ගැනීම ඉක්මනින් හා පහසුවෙන් කළ හැකි වෙයි.

## අසම්පූර්ණතා වෙළඳ පොළ ක්‍රියාත්මක කරයි

වෙළඳ පොළ ක්‍රියාවලිය දිරි ගන්වන්නේ කිසියම් මධ්‍යම සැලසුමකින් නොවේ. සැපයුම හෝ ඉල්ලුම හෝ වෙනස් වී ඇති බව හෝ පාරිභෝගිකයන්ට ඇති අවශ්‍යතා සපුරාලීම සිදු නොවන බව හෝ නිෂ්පාදිතයන් වඩා හොඳ හෝ අඩු මිලට කළ හැකි බව හෝ දකින පුද්ගලයන්ගේ සෝදිසිමත් භාවය නිසා එය සිදු වෙයි. ඔවුන්ගේ දිරි ගැන්වීම වන්නේ ලාභ වන අතර වෙනත් අය නොදුටු මෙම හිඩැස් පිරවීමෙන් එය ලබා ගත හැකි ය. මෙම පිරිසට ව්‍යවසායකයින් යයි ඔබට කිව හැකි ය. එසේ වුව ද, උදාහරණයක් ලෙස, අප නව කුසලතා ලබා ගැනීමට හෝ රැකියා වෙනස් කිරීමට හෝ ක්‍රියා කරමින් අපගේ හැකියා සඳහා ඉහළ ම පිළිගැනීම ලබා ගැනීමට උත්සාහ දරන විට අපි සියලු දෙනා ව්‍යවසායකයෝ වෙමු.

ලාභ උපය ගන්නේ අනෙක් ජනයාට අවශ්‍ය දේ සැපයීමෙන් පමණකි. අප කළ යුත්තේ කුමක් ද? අප හැදිය යුත්තේ මොනවා ද? කියා තීරණය කරන විට පාලනය හිමි වන්නේ පාරිභෝගිකයන්ටයි. ගණන් ගැනෙන්නේ ඔවුන්ගේ ඡන්දයයි. එය සම්පූර්ණ දේශපාලන ප්‍රතිපත්ති පැකේජයක් සෑම වසර කිහිපයකට සැරයක් තීරණය කරන මැතිවරණයක දී දෙන ඔවුන්ගේ ඡන්ද නොවේ. වෙළඳ පොළේ දී ගණන් ගැනෙන්නේ පාරිභෝගිකයන්ගේ මුදල් ඡන්දයයි. පාරිභෝගිකයන් වැඩියෙන් ම වටිනාකම් දෙන්නේ මොනවාට ද? නිෂ්පාදනය කළ යුත්තේ මොනවා ද? යන්න හෙළි කරමින් දශ ලක්ෂ ගණන් එකිනෙකට වෙනස් භාණ්ඩ හා සේවා එකිනෙක ගැන දිනපතා කෙරෙන ජනමත විචාරණයක් ලෙස එය ක්‍රියා කරයි.

අනෙක් අය නිපදවන භාණ්ඩවලට හැම අතින්ම සමාන භාණ්ඩ නිපදවීමට ව්‍යවසායකයන්ට අවශ්‍ය නැත. පාරිභෝගිකයන් ආකර්ෂණය කර ගත හැකි වැඩි දියුණු කිරීම් මගින් තම නිෂ්පාදිතය වෙනස් ලෙස ඉදිරිපත් කිරීමට ඔවුන්ට අවශ්‍ය වෙයි. ඔවුන් තම තරඟකරුවන්ට මුහුණ දිය යුතු වීමත් එහි දී තමන්ට වාසිදායක තත්ත්වයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයත් එයට හේතුවයි. තරඟය ආර්ථික ජීවිතයේ කිසියම් අක්‍රීය සාධකයක් නොවේ. පාරිභෝගිකයන්ට ඇත්තට ම අවශ්‍ය මොනවා ද? ඔවුන්ගේ මුදලින් ඔවුන් ඒ සඳහා ඡන්දය ලෙස ලබා දීමට කොපමණ සූදානම් ද? යන්න අප අතරින් ඕනෑම කෙනකු විය හැකි ව්‍යවසායකයකුට සොයා ගැනීමට ආධාර වන, සමීක්ෂණ පටිපාටියක් වන ගතික ක්‍රියාවලියකි.

## වෙළඳ පොළෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම

අපගේ දේශපාලකයන් බොහෝ දෙනා හැදී වැඩී ඇත්තේ, සියලු නිෂ්පාදකයන් හැම අතින් ම එකිනෙකට සර්ව සම වූ, මිල ගණන් ස්ථාවර වූ සහ ඉල්ලුම හා සැපයුම හැම විටම තුලනය වූ සර්ව සම්පූර්ණ වෙළඳ පොළ පිළිබඳ අදහස සහිත පෙළ පොත් ආර්ථික විද්‍යාව සමග ය. එබදු ලෝකයක් කවදාවත් පැවතියේ නැත. දිගින් දිගට වැඩි දියුණු වීමට, වර්ධනය වීමට සහ කාර්යක්ෂම වීමට ආර්ථික ජීවිතය මෙහෙයවීම සිදු වූයේ වෙළඳ පොළේ ඇති අසම්පූර්ණ බව විසිනි.

ගින්නක් රඳවා ගැනීමට ගිනි කබලක් අවශ්‍ය වනවා සේ ම වෙළඳ පොළ පොළ සඳහා ද නීති අවශ්‍ය ය. එසේ වුව ද තමන්ගේ ම නීතී පනවමින් හෝ බදු, සුභසාධන සහ පරිපාලන නීතී මගින් මැදිහත් වෙමින් පරිපූර්ණ වෙළඳ පොළක් සඳහා දේශපාලනඥයන් උත්සාහ නොදැරිය යුතු ය. වෙළඳ පොළවල් බලවත් වන අතර ම ඒවා අවුල් කර ගතහොත් බරපතල අහිතකර ප්‍රතිවිපාක ඇති විය හැක්කේ ය. එමනිසා දේශපාලනඥයන් කළ යුතු වන්නේ ඒවාට ක්‍රියාත්මක වීමට අවශ්‍ය නීති පමණක් ක්‍රියාත්මක කිරීමයි. එනම් දේපළ, ගිවිසුම් හා අවංක බව සදහා නීති ක්‍රියාත්මක කොට ඉහළ නගින සමෘද්ධියේ උණුසුම් දීප්තියේ පහස විඳ ගැනීමයි.

**වැඩිදුර කියැවීම්**

*Butler" Eamonn ^2009& The Best Book on the Market( How to Stop Worrying and Love the Free Economy" Oxford( Capstone'*

*Hayek" Friedrich A' ^1945& zThe Use of Knowledge in Society'" American Economic Review" 35" 4" 519-30'*

*Kirzner" Israel ^1997& How Markets Work( D i s e q u i l i b r i u m " Entrepreneurship and Discovery" London( Institute of Economic Affairs'*

# 3

# නිදහස් වෙළඳාම

# නිදහස් වෙළඳාම

**ඩැනියල් ග්‍රිස්වෝල්ඩ් විසිනි**

ආණ්ඩුවේ සීමා කිරීම්වලින් තොරව ජාත්‍යන්තර දේශ සීමා හරහා භාණ්ඩ හා සේවා හුවමාරු කර ගැනීමට පුද්ගලයන්ට සහ සමාගම්වලට ඇති නිදහස ලෙස නිදහස් වෙළඳාම අර්ථ දැක්විය හැකි ය. අපගේ එදිනෙදා ජීවිතයේ දී මෙහි අදහස වන්නේ බංගලාදේශයේ මැසූ කමිසයක්, ඉක්වදොරයේ වැවුණු කෙසෙල්, ජර්මනියේ නිපද වූ මෝටර් රථයක්, චීනයේ එකලස් කළ අයිපොඩ් එකක් හෝ හොලිවුඩයේ නිපද වූ ඩීවීඩී යන්ත්‍රයක් මිලදී ගැනීමට තිබෙන නිදහසයි.

නිදහස් වෙළඳාම සඳහා තර්කය ආරම්භ වන්නේ පෞද්ගලික අයිතියෙනි. පාරේ එහා පැත්තේ සිටින්නකු, යාබද නගරයේ, පළාතේ හෝ රාජ්‍යයේ සිටින්නකු සමග අපට ගනුදෙනු කළ හැකි ආකාරයට ම, දේශ සීමාවෙන් හෝ සාගරයකින් එහා සිටින යම් කිසිවකු සමග අන්‍යොන්‍ය ප්‍රතිලාභ සඳහා නිදහසේ වෙළඳාම් කිරීමට අපට හැකියාව තිබිය යුතු ය. වෙළඳාම සඳහා සීමා පැනවීම මගින් අපගේ ම දේපළ වෙනත් රටක ජීවත් වීමට සිදු වී ඇති අයෙකු සමග ස්වේච්ඡාවෙන් හුවමාරු කර ගැනීමට ඇති නිදහස උල්ලංඝනය කරයි.

### ශ්‍රම විභජනය

තමන්ගේ පුරවැසියන් සතු සම්පත් හා නිෂ්පාදන වාසි භාවිත කරමින් ඔවුන්ට කළ හැකි ඉහළ ම දේ කිරීමට විශේෂඥතාවක් ලබා ගැනීමට නිදහස් වෙළඳාම නිසා ජාතීන්ට හැකි වෙයි. එකිනෙකට වෙනස් දේශගුණය, සම්පත්, ඉතිහාස, සහ අධ්‍යාපන මට්ටම් නිසා තිරිඟු වගාවෙන්, පරිගණක නිෂ්පාදනයෙන්, ඇඳුම් නිෂ්පාදනයෙන් හෝ මුහුදු වෙරළේ නිවාඩුවක් ලබාදීමෙන් ඇතැම් ජාතීන් අනෙක් ජාතීන්ට වඩා හොඳ

වෙන්නට පුළුවන. තමන්ට හොඳින් ම කළ හැකි දේ සම්බන්ධයෙන් විශේෂඥතාවක් ලබා ගැනීමෙන් සහ තමන්ගේ අතිරික්ත නිෂ්පාදිතය වෙනත් ජාතීන්ට වඩා හොඳින් නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ හා සේවා සමග හුව මාරු කර ගැනීමෙන් ජාතියක් තුළ කම්කරුවන්ට හා සමාගම් වලට වඩා හොඳ තත්වයක් උදා කරගත හැකි ය.

පුද්ගලයෝ මෙබඳු ගනුදෙනුවල දිනපතා නියැලෙති. ඔබගේ නිවාස ඔබ ම හදාගත යුතු බවටත්, ඔබගේ ඇඳුම් හා ගෘහ භාණ්ඩ සියල්ල හදාගත යුතු බවටත්, අන් අයගෙන් කිසිවක් මිලදී නොගෙන ආහාර සියල්ල වගා කරගත යුතු බවටත්, ඔබගේ මවුපියන් ඔබට බල කළේ නම් ඔබගේ පවුල කෙතරම් දිළිඳු වනු ඇති දැයි සිතන්න. ප්‍රතිඵලය වනු ඇත්තේ ස්වයංපෝෂිත දිළිඳු බවයි. ඒ වෙනුවට වෙළඳාම තුළින් තමන්ට වඩාත් හොඳින් කළ හැකි වැඩ සම්බන්ධයෙන් විශේෂඥතාවයක් ලබා ගැනීමට ජනයාට හැකි වන අතර ඉන් පසු තම වැඩ මගින් කළ නිෂ්පදන අන් අය සමග වෙළඳාම් කළ හැකි ය. ආර්ථික විද්‍යාඥයින් මෙය හඳුන්වන්නේ 'ශ්‍රම විභජනය' වශයෙනි .

වත්මන් ආර්ථික විද්‍යාවේ පියා ලෙස සැලකෙන ඇඩම් ස්මිත් තර්ක කළේ නිදහස් වෙළඳාම මගින් වෙළඳ පොළේ විශාලත්වය පුළුල් කරමින්, ජාතින් තුළ හා ජාතින් අතර සියුම් ශ්‍රම විභජනයකට ඉඩ සලසමින් වඩා විශාල සෘද්ධිමත් බවකට ඉඩ ලබාදෙන බවටයි.

1776 දී ඇඩම් ස්මිත් පල කළ ඔහුගේ සුප්‍රසිද්ධ කෘතිය වන 'ජාතීන්ගේ ධනය' හි ඔහු සදහන් කළේ මෙලෙසිනි.

> *"යමක් මිලදී ගන්නවාට වඩා ඔහුට එය නිපදවා ගැනීමට වැඩි වියදමක් යන්නේ නම් එය තම නිවසේ දී ම නිපදවා ගැනීමට කිසි විටක උත්සාහ නොදැරීම පවුලක විචක්ෂණශීලී ප්‍රධානියකුගේ උපරිම උත්සහය වනු ඇත. සෑම පෞද්ගලික පවුලකට ම විචක්ෂණශීලී වන දෙය විශාල රාජධානියක දී දුලබ වීමට මෝඩ විය හැකිද ? අප ම එය නිපදවා ගන්නවාට වඩා අඩු මිලකට යම් භාණ්ඩයක් සැපයීමට විදේශ රාජ්‍යයකට හැකි නම්, අපට වාසි ඇති ආකාරයේ නිෂ්පාදනයක යෙදෙමින් අප කරන නිෂ්පාදනයකින් කොටසක් ඔවුන්ට දෙමින් ඔවුන්ගෙන් එය මිලදී දී ගැනීම වඩා හොඳ ක්‍රමයයි."*

## සාපේක්ෂ වාසි

බ්‍රිතාන්‍යයේ කොටස් වෙළඳ පොළ තැරැව්කරුවකු කරුවකු වූ ඩේවිඩ් රිකාඩෝ නැමැත්තා 1817 දී තමන්ගේ ම න්‍යායයක් ලෙස 'සාපේක්ෂ වාසි' යන්න ඉදිරිපත් කරමින් ස්මිත්ගේ අදහස වඩාත් පුළුල් කළේ ය. රිකාඩෝට අනුව එක් රටක කම්කරුවන්ට අනෙක් රටේ කම්කරුවන්ට වඩා කාර්යක්ෂම ලෙස සියලු දේ නිපදවිය හැකි වුව ද, රටවල් දෙක අතර ලාභදායි ලෙස වෙළඳාම එම තත්ත්වය යටතේ ද සිදු කළ හැකි ය. එහි දී වැදගත් වන්නේ එම කම්කරුවන් නිපදවන අන් සියලු දේට වඩා ඉහළ ම කාර්යක්ෂමතාවයෙන් නිපදවන භාණ්ඩය කුමක් ද යන්නයි.

දුප්පත් රටක කම්කරුවන්ට වඩා දෙගුණයක කාර්යක්ෂමතාවයෙන් පොහොසත් රටක කම්කරුවන්ට පාවහන් නිපදවිය හැකි නමුත් පරිගණක චිප් නිෂ්පාදනයේ දී පස් ගුණයක් කාර්යක්ෂම නම් පොහොසත් රට පරිගණක චිප් නිෂ්පාදනයේ විශේෂඥතාවය පවත්වා ගනිමින් දුප්පත් රටින් පාවහන් මිලදී ගැනීම ජාතීන් දෙකට ම වාසිදායක වෙයි. තම තමන්ගේ සාපේක්ෂ වාසි සම්බන්ධයෙන් විශේෂඥතාවය තබාගත් විට රටවල් දෙකේ ම කම්කරුවන්ට භාණ්ඩ දෙකේ ම පරිභෝජනය වැඩි කළ හැකි වෙයි.

## තරඟකාරීත්වය හා ප්‍රමාණයේ ආර්ථිකයන්

වැදගත් වෙනත් ආකාරවලින් ද ප්‍රතිලාභ ලබා ගැනීමට නිදහස් වෙළඳාම මහජනයාට අවස්ථාව සලසයි. ගෝලීය වෙළඳ පොළකට නිෂ්පාදනය කිරීමෙන් සමාගම්වලට විශාල ප්‍රමාණයේ ආර්ථිකයන්ගේ වාසි ලබා ගත හැකි ය. රථවාහන, ගුවන් යානා හෝ මෘදුකාංග වැනි නිෂ්පාදනයක පර්යේෂණ, සංවර්ධන, සහ යන්ත්‍රෝපකරණ සඳහා විශාල ලෙස මුදල් ආයෝජනය කිරීමෙන් පසුව සමාගමකට දේශීය වශයෙන් විකිණීම සඳහා 1000ක් නිපදවීමට වඩා ලෝකය පුරා විකිණීමට 100 000ක් නිපදවීමෙන් එක් අයිතමයක් සඳහා අඩු වියදමකින් නිෂ්පාදනය කළ හැකි වෙයි. වෙළඳාම සඳහා තරඟය මගින් ද නවෝත්පදනයෙන් නව සහ වඩා හොඳ භාණ්ඩ නිෂ්පාදනයට සහ වියදම් අඩු කොට නාස්තිය නවතා ගැනීමටත් සමාගම් වේගවත් කරයි.

නිදහස් වෙළඳාමෙන් පාරිභෝගිකයන්ට අඩු මිලටත්, විවධ වර්ගවලිනුත් ඉහළ ගුණාත්මක බවිනුත් භාණ්ඩ ලබා ගැනීමට හැකි වෙයි. අපගේ ව්‍යාපාරයේ තරඟය සඳහා ඒකාධිකාරී සුළු පිරිසක් වෙනුවට සමාගම් විශාල ප්‍රමාණයක් තරඟ වදින විට

පාරිභෝගිකයින් වශයෙන් අපට වඩා හොඳ තත්ත්වයක් ඇති වෙයි. ආනයනවලින් ඇති වන තරඟය මගින් සිදුවන්නේ ඇඳුම්, ආහාර හා ඉලෙක්ට්‍රොනික භාණ්ඩ වැනි දේ සඳහා අපි දේශීය නිෂ්පාදනයට සීමා වී සිටිනවාට වඩා අඩු මිලක් ගෙවමින් තෝරා ගැනීමේ පුළුල් ම පරාසයක  වාසි ලැබීමට හැකි වීමයි.

**ආරක්ෂණවාදය**

නිදහස් වෙළඳාමේ ප්‍රතිවිරුද්ධ දෙය ආරක්ෂණවාදය ලෙස හඳුන්වනු ලැබේ. එනම් තීරුබදු, පංගු හෝ වෙනත් නීති රීති මගින් ඇතැම් දේශීය නිෂ්පාදකයන් ආරක්ෂා කිරීමට ආණ්ඩු ක්‍රියා කිරීමයි. තීරුබදු යනු වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස හෝ එක් අයිතමයක් සඳහා ගාස්තුවක් ලෙස ආනයන මත පනවන බද්දකි.  පංගු යනු ආනයනය කළ හැකි ප්‍රමාණයට පනවන සංඛ්‍යාත්මක සීමාවකි. බදු නොවන බාධක ලෙස හඳුන්වනු ලබන වෙනත් වෙළඳ බාධක පවතින්නේ වක්‍ර ලෙස ආනයන වැළැක්වීම සඳහා සැලසුම් කළ නීති රීති වශයෙනි.

සෑම ආණ්ඩුවක් ම පාහේ එක් වර්ගයක හෝ වෙනත් වර්ගයක ආරක්ෂණවාදයක යෙදී සිටියි. ජාතියට සමස්තයක් ලෙස තිබෙන විශාල ප්‍රතිලාභ නොතකා විදේශීය තරඟයෙන් ආරක්ෂාව අවශ්‍ය විශේෂිත නිෂ්පාදකයකු හෝ කර්මාන්තයක ප්‍රතිලාභ සඳහා දේශපාලනඥයන් ක්‍රියා කිරීම විශේෂිත තත්ත්වයක් නොවේ. ආරක්ෂාව පතන කර්මාන්ත සාමාන්‍යයෙන් හොඳින් සංවිධානය වී ඉහළ දිරිමත් භාවයකින් යුතුව සිටින අතර ඒ නිසා ම දේශපාලන ක්‍රමයට බලපෑම් කිරීමේ වැඩි හැකියාවකින් යුතුව සිටියි.

ආරක්ෂාවේ ප්‍රතිවිපාක වන්නේ ඉහළ මිලක් ගෙවීමට පාරිභෝගිකයන්ට සිදු වීමත්, රටේ සම්පත් අඩු නිෂ්පදකතාවක් පවතින ආකාරයෙන් යොදා ගැනීමත්, සහ නිදහස් වෙළඳාම තිබෙන තත්ත්වයකට වඩා සමස්ත ජීවන මට්ටම පහළ තත්ත්වයක පැවතීමත් ය.

ආරක්ෂණවාදයේ අනතුර සම්බන්ධයෙන් බරපතළ පාඩමක් බටහිර ජාතීන් 1930 ගණන්වල දී ඉගෙන ගත්තේ ය. 1929 දී  ඇති වූ ආර්ථික අවපාතය නිසා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය හා වෙනත් රටවල ආණ්ඩු තල්ලු වුයේ රැකියා ආරක්ෂා කර ගැනීම සඳහා යයි කියමින් තීරු බදු ඉහළ දැමීමට ය. එසේ වුව

ද වෙළඳ බාධක වැඩි වන විට අනෙක් රටවල් ද එකට එක කරන්නට පෙළඹුණු අතර වෙළඳ මට්ටම් පහත වැටී මහා අවපාතය වඩා දරුණු වී වැඩි කලක් පැවතිණි.

ඉතිහාසඥයන් විශ්වාස කරන්නේ ආර්ථික යුද්ධයෙන් ඇති වූ ජාත්‍යන්තර ආතතිය දෙවන ලෝක යුද්ධය ඇති වීමට හේතු වූ බව යි. 19 වන ශත වර්ෂයේ සිටි ප්‍රංශ දේශපාලන ආර්ථික විද්‍යාඥයකු වූ ෆ්‍රෙඩ්රික් බැස්ටියාට්ගේ යයි කියන කියමනකට මෙම කාලයේ සිදුවීම්වලින් සහයක් ලැබෙයි. "භාණ්ඩවලට දේශ සීමා තරණය කළ නොහැකි වන විට යුද හමුදා ගමන් කරනු ඇත."

**නිදහස් වෙළඳාම වෙත ගමන**

අවපාතයේ විනාශයෙන් හා දෙවන ලෝක යුද්ධයෙන් පසු එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය සහ තවත් රටවල් 20ක් පමණ තීරුබදු හා වෙළඳාම පිළිබඳ සාමාන්‍ය ගිවිසුමට (GATT) අත්සන් තැබී ය. වෙළෙඳ බාධක අඩුකොට එම අඩු මට්ටම දිගට ම පවත්වා ගැනීමටත්, අනෙක් රටවලටත් තීරුබදු මට්ටම් සමානව පවත්වා ගැනීමටත් එම ගිවිසුම මගින් සාමාජික රටවල් එකඟ වීය.

එක්සත් ජනපදයේ ඉල්ලීම අනුව තම රටවල් අතර වෙළඳාමට තිබූ බොහෝ බාධක ඉවත් කිරීමට බටහිර යුරෝපීය ජාතීහු එකඟ වූහ. එලෙස ඇති වූ පොදු වෙළඳ පොළ යුද්ධයෙන් පසු යුරෝපය නැවත ගොඩ නැගීමට ආධාර වූවා පමණක් නොව ආර්ථික සහයෝගිතාවය වර්ධනය කර ගනිමින් සාමය පවත්වා ගැනිමට ද උපකාරී වීය . එලෙස ඇති වූ ඨ්ඹඹ සංවිධානය 1995 දී ලෝක වෙළඳ සංවිධානය බවට පත් වූ අතර දැන් එහි සාමාජික රටවල් සංඛ්‍යාව 150කට වැඩි ය.

පසුගිය වසර 50ක කාලය තුළ නිදහස් වෙළඳාම වෙත චලනය බටහිර යුරෝපයේ, උතුරු ඇමෙරිකාවේ සංවර්ධිත රටවලින් හා ජපානයෙන් එපිටට ගමන් කළේ ය. ගෝලීය ආර්ථිකයට සම්බන්ධ වීම මගින් දකුණු කොරියාව, තායිවානය, සිංගප්පූරුව හා හොන්කොන් යන නැගෙනහිර ආසියානු 'කොටින්' ඔවුන්ගේ රටවල් දුප්පත් තත්ත්වයේ සිට පොහොසත් රටවල් තත්ත්වයට පත් කර ගත්තේ ය.

1970 වර්ෂය ආරම්භයේ සිට චීනය, චිලී රාජ්‍යය සහ තවත් නොදියුණු රටවල් කිහිපයක් ඔවුන්ගේ පෙර තිබූ ඉහළ වෙළඳ බාධක අඩු කරමින්, විදේශ ආයෝජන පිළිගනිමින් ලෝකයේ සෙසු ප්‍රදේශ සමග තම වෙළඳාම කැපී පෙනෙන ලෙස වැඩි කර ගත්තේ ය.

1989 දී බර්ලින් තාප්පයත් සමග ගෝලීය කොමියුනිස්ට්වාදය බිඳ වැටීමත් සමග සංවර්ධනයේ උපකරණයක් ලෙස ආරක්ෂණවාදයට තිබූ පිළිගැනීම දුර්වල විය. එතැන් සිට වැඩි වැඩියෙන් රටවල් තමන්ගේ ම රටවල වෙළඳාමට තිබූ බාධක අඩු කරමින් ගෝලීය ආර්ථිකයට සහභාගි වන්නට විය.

**ජීවන මට්ටම් ඉහළ නැගීම**

අද වන විට නිදහස් වෙළඳාම සඳහා වන තර්කයට ආධාර වන සාක්ෂි වර්ධනය වෙමින් පවතියි. වෙළඳාමට හා ආයෝජනවලට තමන් ම විවෘත වූ රටවල්, දිගට ම සංවෘතව පවතින රටවලට වඩා වේගයෙන් වර්ධනය වන අතර තම ඒක පුද්ගල ආදායම ඉහළ නංවා ගැනීමට සමත් වී ඇත.

උදාහරණයක් ලෙස හොන්කොන් භූමිය 1960 ගණන්වල සිට නිදහස් වෙළඳාම කළේ ය. කලෙක බ්‍රිතාන්‍යය අධිරාජ්‍යයේ දුප්පත් මුරපොළක්ව තිබූ එය මේ වන විට ලෝකයේ ධනවත් ම නගරයක් ව ඇත. එයට ප්‍රධාන හේතුව නම් එහි ජනතාවට ගෝලීය වෙළඳ පොළවලින් නිදහසේ මිී ගැනීමට, විකිණීමට හා ආයෝජන කිරීමට හැකි වීම යි. අනෙක් අතට උතුරු කොරියාව, බුරුමය හා දකුණු අප්‍රිකාවේ බොහෝ රටවල් වැනි ලෝකයේ දුප්පත් ම රටවල් ගත් විට ඒවා වෙළඳාම සඳහා වඩාත් ම සංවෘත රටවල් වෙයි.

පසුගිය දශක තුනේ දී වෙළඳාමත් ගෝලීයකරණයත් පැතිරී යාම ගෝලීය දිළිඳු බව අඩු වීමට ප්‍රධාන හේතුවකි. 1980 ගණන්වල මුල් භාගයේ සිට ගත් විට ලෝක බැංකු වාර්තා අනුව ඇමරිකානු ඩොලර් 1.50කට සමාන වන මට්ටමට අඩුවෙන් අදායම් ලබන ලෝක ජනගහනයේ ප්‍රමාණය අඩකට වැඩි ප්‍රමාණයකින් එනම් 52% සිට 25% දක්වා අඩු වී ඇත. දිළිඳු බවට එරෙහිව වර්ධනය වඩාත් කැපී පෙනෙන ලෙස පෙන්නුම් කොට ඇත්තේ චීනය, වියට්නාමය හා චිලී රාජ්‍යය වැනි ලෝකයේ සෙසු ප්‍රදේශවලට තම ආර්ථිකයන් වඩාත් ආක්‍රමණශීලී ලෙස විවෘත කළ රටවල් ය.

## වඩා හොඳ තත්ත්වයන් හා වැඩි සහයෝගිතාවය

වෙළඳාමේ විවේචකයන් ඇතැම් විට පවසනුයේ, අඩු දියුණු රටවල තිබෙන දුර්වල වැඩ කරන තත්ත්වයන් අප ඔවුන්ගේ භාණ්ඩ මිලදී නොගැනීමට හේතුවක් බවයි. එසේ වුව ද එම තර්කයේ දී නොතකා හැරෙන වැදගත් කාරණයක් වන්නේ මෙම රටවල එම තත්ත්වයන් වර්ධනය කිරීමේ ප්‍රධාන එන්ජිම වන්නේ වෙළඳාම බවයි.

අපගේ විවෘත ලෝකය ගමන් කරමින් තිබෙන්නේ ප්‍රපාතයක් වෙත නොවේ. එය ගමන් කරමින් තිබෙන්නේ අදායම් හා ජීවන මට්ටම් ඉහළ  නගින මාවතක ය. වෙළඳාම වැඩි වැඩියෙන් වර්ධනය වූ පසුගිය වකවානුව තුළ ඒ සමග ම දකින්නට ලැබුණේ සංවර්ධනය වන රටවල ජීවිත අපේක්ෂාවේ සහ සාක්ෂරතාවයේ වර්ධනය වීමත් සමග ළදරු මරණ, මන්දපෝෂණය සහ ළමා ශ්‍රමිකයන්ගේ අඩු වීමකි.

එයට සහයට තිබිය යුතු ආර්ථික න්‍යාය නොසෙල් වී තිබුන ද තාක්ෂණය මගින් වෙළඳාමේ ස්වරූපය වෙනස් කොට ඇත. ජාතීන් අතර ගනුදෙනු වන භාණ්ඩවලින් වලින් අඩක් තරම් ප්‍රමාණයක් මේ වන විට ප්‍රවාහනය කරන්නේ නැව් වලින්, මහා මාර්ග ඔස්සේ හෝ දුම්රියෙන් නොව ගුවන් මගිනි. මුහුදු මගින් වෙළඳාම් කරන භාණ්ඩ බොහොමයක් දැන් නැව්ගත කෙරෙන්නේ සම්මත දිග පළලින් යුතු කන්ටේනර් මගිනි. එමගින් සාගර වරායවල දී ඒවා පැටවීම හා බෑම පහසු වන අතර ට්‍රක් රථ හා දුම්රිය වෙත මාරු කිරීම ද පහසු වෙයි. රටවල් බොහෝ ගණනක තම අනුබද්ධ ආයතන සම්බන්ධීකරණය කරන බහු ජාතික සමාගම්වල වර්ධනය අන්තර්ජාලයේ හා චන්ද්‍රිකා සන්නිවේදනයේ පැතිරීමත් සමග වේගවත් වී ඇත.

සන්නිවේදනයේ වශයෙන් අද නිෂ්පාදිතයන් බොහොමයක් නිපදවනු ලබන්නේ එකිනෙකට වෙනස් රටවල් රාශියක කම්කරුවන්ගේ සහයෝගීතාවය තුළිනි. ජෙට් ගුවන් යානයක් හෝ මෝටර් රථයක් එක් රටක සැලසුම් කොට තවත් රටක එකලස් කරන්නේ තවත් රටවල් දුසිම් ගණනක කම්කරුවන් විසින් නිපදවනු ලබන කොටස් එකතුවකින් විය හැකි ය. එක්සත් ජනපදයේ හෝ යුරෝපයේ හෝ ගැටවරයකු මිලදී ගන්නා අයිපොඩ් උපාංගයක "චීනයේ එකලස් කරන ලදී" කියා සඳහන්ව තිබුන ද එය සැලසුම් කළේ හා ඉංජිනේරු කාර්යයන් කළේ කැලිෆෝනියාවේ ය. ඇමරිකානු සමාග මකින් සැකසුම් චිපය ද, කොරියානු සමාගමකින් මතක චිපය ද, ජපාන සමාගමකින් දෘඪ තැටිය හා දර්ශන තිරය ද, ලබා දුන්නා විය හැකි ය.

## ඉවසීම හා තේරුම් ගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමග වෙළඳාම මගින් පුද්ගලයන් අතර ඉවසීම හා තේරුම් ගැනීම ද වර්ධනය කරයි. වෙළඳාම සහ ගෝලීයකරණය අපට උගන්වන්නේ වෙනත් රටවල ජනයා දෙස අද්භූත හා භයානක පිරිසක් ලෙස නොව පාරිභෝගිකයන්, සැපයුම්කරුවන් සහ හවුල්කරුවන් විය හැකි පිරිසක් ලෙස දකින්නට ය. වෙළඳාම සන්නිවේදනය පහසු කරයි. දේශ සීමා හරහා යන්නේ භාණ්ඩ හා සේවා පමණක් නොවේ. අදහස් හා ජනතාව ද ගමන් කරති. එවිට ඔවුහු සාම්ප්‍රදායික අගතීන් බිඳ දැමීමට හැකි වන සබඳතා ගොඩනගා ගනිති.

ඉතිහාසය ගත්විට ඒ ඒ කාලවල ජාත්‍යන්තර වෙළඳාමේ පෙරමුණේ සිටි නගර හා රටවල් එම කාලවල තිබු වඩාත් විවෘත හා ඉවසන සුලු සමාජයන් වීය. 1400 ගණන්වල වැනීසිය සහ 1600 ගණන්වල ඕලන්ද සමුහාණ්ඩුව එම කාලවල තිබූ ප්‍රධානතම වාණිජ මධ්‍යස්ථාන විය. එම සමාජ දෙක ම යුදෙව්වන්ට, වෙනත් ආගමික මත දරන්නන්ට නිදහස සහ නීතිමය ආරක්ෂාව ලබා දුන්හ.  මෙම සමාජවල ජනයා විවිධ ආගම්වල හා ජනවර්ගවල ජනයා පිළිගැනීමට ඉගෙනගත් අතර එයට හේතු වුයේ නොඉවසීම එහි වෙනත් දුර්වලතා ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතුවලට ද හානිකර වීම යි. අදත්, වෙළඳාමට විවෘත රටවල ආගමික සහ භාෂණයේ නිදහසට වඩා විවෘත බවක් පෙනෙන්නට තිබේ.

## වෙළෙඳාම හා නිදහස

අවසානයේ දී නිදහස් වෙළඳාම වෙනුවෙන් කළ තර්කනයෙන් අප ළඟා වෙන්නේ මුලික යුක්තිය පිළිබඳ අදහසට ය. ඔහු හෝ ඇය විසින් කරන ලද නිෂ්පාදනයක් වෙනත් රටක කෙනෙකු හෝ කණ්ඩායමක් විසින් කරන ලද නිෂ්පාදනයක් සමග වෙළඳාම් කිරීමට කිසිවකුට අවශ්‍ය නම් , ආණ්ඩුව එයට මැදිහත් නොවිය යුතු ය. එයට සම්බන්ධ වන පාර්ශව දෙකට ම ප්‍රතිලාභ අත්වන ගනුදෙනුවක් තහනම් කිරීමට ආණ්ඩුවේ බලය භාවිත කරන්නේ නම් එය නිදහස් පුද්ගලයකුගේ ස්වාධිපත්‍යය උල්ලංඝනය කිරීමකි.

වෙළඳ බාධක මගින් මහජනයාට තම ශ්‍රමයෙන් ලැබිය යුතු ප්‍රතිලාභ අහිමි කරන අතර කොල්ල කෑ ධනය වෙනත් ජනයා අතර බෙදා හරින්නේ ධනය රාජසන්තක කිරීමට දේශපාලන බලය හැරුණු විට කිසිදු සදාචාරාත්මක අයිතියක් නොමැති තත්ත්වයක් තිබිය දී ය .

**වැඩිදුර කියැවීම්**


*Griswold" Daniel ^2009& Mad about Trade( Why Main Street America Should Embrace Globalization" Washington" D'C'( Cato Institute'*

*Bastiat" Frederic ^1848& zOn the Balance of Trade'" zA Petition'" and other essays on Economic Sophisms*

*Irwin" Douglas ^2009& Free Trade under Fire ^3rd edition&" Princeton" NJ( Princeton University Press'*

*Norberg" Johan ^2003& In Defense of Global Capitalism" Washington" D'C'( Cato Institute'*

*Roberts" Russell ^2006& The Choice( A Fable of Free Trade and Protection ^3rd edition&" Upper Saddle River" N'J'( Pearson$Prentice Hall'*

*Smith" Adam ^1776& An Inquiry into the Nature and Causes of the Wealth of Nations" especially B00k iv " various editions '*

# 4

# බදුකරණය හා ආණ්ඩුවේ වියදම්

# බදුකරණය හා ආණ්ඩුවේ වියදම්

**ඩැනියෙල් ජේ මිචෙල් විසිනි**

එක්සත් රාජධානිය වැනි රාජ්‍යයන් සමෘද්ධිමත් භාවයට පත් වන අවධියේ ආණ්ඩුව ඉතා කුඩා වීය. 1800 ගණන් පුරා රාජ්‍ය අංශයේ වියදම වුයේ ආර්ථික නිෂ්පාදිතයෙන් සියයට 10ක තරම් ප්‍රමාණයකි. බ්‍රිතාන්‍යයේ පමණක් නොව, වේගයෙන් සංවර්ධනය වූ අනෙකුත් බටහිර ජාතීන්ගේ ද තත්ත්වය වුයේ එයයි. එහි තේරුම නම් බදු අඩු වීමයි. ඇත්තෙන් ම යුරෝපයේ සහ උතුරු ඇමෙරිකාවේ බොහෝ රටවල වසර 100කට පමණ පෙර වන තෙක් ආදායම් බදු නොතිබිණි.

ඊට ප්‍රතිවිරුද්ධ ලෙස අද ආණ්ඩු ඉතා විශාල ය. එක්සත් රාජධානියේ, රාජ්‍ය අංශයේ වියදම් අද වන විට ආර්ථික නිෂ්පාදනයෙන් සියයට 50ක් පමණ වෙයි. වියදම් තරම් වේගයෙන් නොවුණත් බදු ද විශාල ලෙස වැඩි වී ඇත. වෙනත් රටවල් බොහොමයකට මෙන් ම බ්‍රිතාන්‍යයට ද අති විශාල බදු බරක් ඇත්තේ ඒ නිසා ය.

විශාල ආණ්ඩු තිබීම ආර්ථිකයට හොඳ ද ? ආණ්ඩුව යනු මහා මාර්ග හා සෞඛ්‍ය සේවා ආදිය ලබා දෙන විශාල නත්තල් පප්පෙකු ලෙස විටෙක පෙනී ගිය ද, ආණ්ඩුව වියදම් කරන හැම ශතයක් ම කාගේ හෝ පසුම්බියෙන් යා යුතු ය. ආණ්ඩුවේ වියදම් සඳහා ගෙවීම් සිදු කරන බදු (හා ණය ගැනීම්) ගැන සොයා බලන වෙනත් අයගේ නිගමනය වන්නේ ආණ්ඩු මහජනයාගේ මුදල් ගැනීම ආර්ථික වෘද්ධියට බාධාවක් බවයි.

කෙසේ වෙතත් සමීකරණයේ එක් පැත්තක් පමණක් බැලීම වැරදි ය. බදු සහ වියදම් යන දෙකෙහි ම වියදම් හා ප්‍රතිලාභ ගැන බැලීම වැදගත් වෙයි. මෙමගින් විග්‍රහය තරමක් දුෂ්කර වෙයි. මුදල් වියදම් කරන්නේ කෙලෙස ද, එම මුදල් එකතු කර

ගන්නේ කෙලෙස ද යන කරුණු දෙකම මත ආර්ථිකයේ යහපත් ක්‍රියාකාරිත්වයකට ආණ්ඩුවේ වියදම් හොඳ ද නරක ද යන්න තීරණය වෙයි.

කෙසේ වෙතත්, ආර්ථික පර්යේෂණ මගින් පෙන්නුම් කර ඇත්තේ සියලු ම කාර්මික රටවල ආණ්ඩු අවශ්‍ය තරමට වඩා අති විශාල බවයි. රාජ්‍ය අංශය වඩා විශාල වන විට ආර්ථික විද්‍යාඥයන් කියන්නේ ශ්‍රමය හා ප්‍රාග්ධනය වැරදි ආකාරයට යොදා ගැනීම සිදුවන බවයි. එය  මුදල් වඩා නිෂ්පදකතාවයෙන් වැඩි භාවිතයන්ගෙන් ඉවතට යොමු වන බව කීමේ වඩා සංකීර්ණ ක්‍රමයකි.

විශාල ආණ්ඩුවක් යන්නෙහි තේරුම වන්නේ බදු බර ද ඉතා විශාල වන බවයි.  එහි තේරුම නම් වැඩ කිරීම, ඉතිරි කිරීම, ආයෝජනය, සහ ව්‍යවසයකත්වය යන සියල්ල අධෛර්යමත් කරන බවයි. විශාල රාජ්‍ය අංශ ණය ගැනීමෙන් ද මුදල් ලබා ගනී යි. එනම් පෞද්ගලික අංශයෙන් මුදල් ඉවතට ගැනීමයි. රජයේ වියදම්, බදු සහ ණය ගැනීම් යන මේ සියල්ල ආර්ථිකයට බරකි.  එහි තේරුම නම් අඩු ආර්ථික වර්ධනය, වැඩි රැකියා විරහිත බව සහ තරඟකාරීත්වය අඩු වීමයි.

**කුඩා ආණ්ඩුවක් නමුත් දක්ෂ ආණ්ඩුවක්**

ආණ්ඩුවේ වියදම් සියල්ල ආර්ථිකයට හානිකර බව හෝ බදු කිසිවක් නොතිබිය යුතු බව හෝ මෙයින් අදහස් වන්නේ නැත. අවස්ථාව අනුව රාජ්‍ය අංශයේ වියදම් ඵලදායි හෝ හානිකර හෝ විය හැකි ය. වෙළඳ පොළට ක්‍රියාත්මක වීමට අවශ්‍ය කොන්දේසි නිර්මාණය කර දෙන නිසා පොලිස් ආරක්ෂාව වැනි 'පොදු භාණ්ඩ' සඳහා වියදම් කිරීම ආර්ථිකය සමෘධිමත් වීමට උපකාරී විය හැකි ය. හරි ආකාරයට වුවහොත් මාර්ග සහ පාසල් සඳහා කරන ප්‍රාග්ධන වියදම් මගින් ද ප්‍රතිලාභ ලබාගත හැකි වෙයි. හොඳ ප්‍රවෘත්ති වන්නේ ඒවා ය.

නරක ප්‍රවෘත්ති නම් සුභසාධක ප්‍රතිලාභ වැනි 'මාරු කිරීමේ වියදම් මගින් හා සෞඛ්‍ය පහසුකම් වැනි පරිභෝජන වියදම් ආර්ථිකයේ ක්‍රියාකාරීත්වය අඩපණ කරන බවයි. අවාසනාවකට මෙන් අද බොහෝ ආණ්ඩුවල වියදම් වෙන්ව ඇත්තේ මාරු කිරීම් සහ පරිභෝජනය යන ක්ෂේත්‍රවලටයි.

**හොඳ බදු ප්‍රතිපත්ති**

බදුකරණය සඳහා ද ඉහත විග්‍රහය වලංගු ය. සාමාන්‍යයෙන් බදු ගැන සිතන්නේ ඒවා ආර්ථික වර්ධනයට කිසිසේත් හොඳ නැති බවයි. එසේ වුව ද ඇතැම් බදු අනෙක් බදුවලට වඩා විශාල හානියක් සිදු කරයි. ආර්ථික විද්‍යාඥයන්ගේ සරල නීතිය නම් ආර්ථිකයට අහිතකර බලපෑම් අවම වන ආකාරයෙන් ආණ්ඩුව අදායම් ලබාගත යුතු බවයි. මෙම සරල මුලධර්ම තුන හොඳ මග පෙන්වීම් වෙයි.

- **අඩු බදු අනුපාතවලට වඩා ඉහළ බදු අනුපාත වැඩියෙන් හානි කර ය**

  දුම් පානය අධෛර්යමත් කිරීම තමන්ට අවශ්‍ය නිසා දුම්කොළ වැනි දේ සඳහා ඉහළ බදු පැනවීමට තමන්ට අවශ්‍ය බව දේශපාලනඥයෝ නිතර ම කියති. මහජනයාගේ ජීවිත පාලනය කිරීමට රජය මැදිහත් විය යුතු ද යන ප්‍රශ්නය පසෙක තිබිය දී, ආර්ථික ප්‍රතිවිපාක සම්බන්ධයෙන් දේශපාලනඥයන්ගේ අදහස නිවැරදි ය. හැසිරීම් අධෛර්යමත් කිරීම සඳහා බදුකරණය ඵලදායි ක්‍රියා මාර්ගයකි. එමෙන් ම ඉහළ බදු අනුපාතයක බලපෑම පහළ බදු අනුපාතයකට වඩා වැඩි ය. රැකියා සඳහා, ව්‍යවසායකත්වය සඳහා මෙන් ම වෙනත් ආකාරයේ ප්‍රයෝජනවත් හැසිරීම් සඳහා බදු පැනවීම සම්බන්ධයෙන් ද ඉහත විග්‍රහය වලංගු ය. ආර්ථික වර්ධනය සිදුවන්නේ වැඩි ජනතාවක් වැඩි ආදායමක් උපයන විට නිසා මෙහි තේරුම නම්, විශේෂයෙන් ම පුද්ගල ආදායම් බදු හා සමාගම් ආදායම් බදු සඳහා බදු අනුපාත අඩුවෙන් තබා ගැනීම ඉතා වැදගති.

- **ඉතිරිකිරීම් හා ආයෝජන මත අතිරේක බදු පැනවීම ඉතා වියදම් අධික ය**

  අද කරන ඉතිරිකිරීම් හා ආයෝජන අනාගතයේ වැඩි සමෘද්ධියක් සඳහා අවශ්‍ය බව ඕනෑ ම ආර්ථික න්‍යායක් පිළිගන්නා කාරණයකි. එසේ වුව ද, බොහෝ ආණ්ඩු කරන්නේ ඉතිරි කළ හා ආයෝජනය කළ අදායම් මත අතිරේක බදු තට්ටු පැන වීමයි. මෙය ඇතැම් විට හදුන්වන්නේ ද්විත්ව බදුකරණය යනුවෙනි. ලාභාංශ, පොලි සහ ප්‍රාග්ධන ලාභ මත බදු මෙන් ම ධන බදු හා උරුමය මත බදු මගින් ද මහජනයා ඉතිරි කිරීමට හා ආයෝජනය කිරීමට ඇති උනන්දුව ඉතා අඩු කරයි. මෙහි තේරුම වන්නේ ඉතිරි කර ආයෝජනය කරන ආදායම් මත ක්‍රියාත්මක බදු

අනුපාතය පරිභෝජනයට ගන්නා ආදායම් මත ක්‍රියාත්මක බදුවලට වඩා ඉතා ඉහළ බවයි. එවිට, අඩුවෙන් ඉතිරි කිරීම හා ආයෝජනයත්, වැඩියෙන් පරිභෝජනයත් මගින් මහජනයා ප්‍රතිචාර දැක්වීම ගැන පුදුම විය යුතු නැත. දිගු කාලීන ආර්ථික ක්‍රියාකාරිත්වයට මෙය හානිකර ය.

- **විශේෂ බදු අඩුලුහුඬුකම් ආර්ථික අකාර්යක්ෂමතාවයට හේතු වෙයි**

  ණය, අඩු කිරීම්, ආරක්ෂණ, බැහැර කිරීම්, අඩුලුහුඬුකම් සහ වෙනත් විශේෂ විධිවිධාන මගින් බොහෝ බදු ක්‍රම ප්‍රහේලිකා බවට පත් කොට ඇත. මෙමගින් සංකීර්ණතාවයක් ඇති කරන අතර දූෂණයට ඉඩ සලසයි. එමෙන් ම ඒවායින් නරක ආර්ථික ප්‍රතිවිපාක ද ඇති වෙයි. සාමාන්‍ය වෙළඳ පොළක දී මහජනයා වාසි ලබන්නේ වැඩියෙන් ම ධනය නිපදවන ආකාරයට ආයෝජන කිරීම මගිනි. (සියයට 10ක ලාභ අනුපාතයක් ලැබීම සියයට 5ක ලාභ අනුපාතයක් ලැබීමට වඩා හොඳ ය.) එසේ වුව ද, බදු ක්‍රමය මගින් ඇතැම් ක්‍රියාවන්ට වාසිදායක වන ලෙස අසාධාරණයන් සිදු වේ නම් ආර්ථික වර්ධනය ඇති වන ව්‍යාපෘති සඳහා මුදල් ආයෝජනය කරනවා වෙනුවට බදු ප්‍රතිලාභ ලබෙන ව්‍යපෘති සඳහා මුදල් යෙද වීමට ව්‍යවසායකයින් හා ආයෝජකයින් ආකර්ෂණය කරයි.

සමෘද්ධිය ඉහළ නැංවීමට නම් මෙම මූලධර්ම තුන පිළිගෙන බදු ක්‍රම සැලසුම් කිරීමට දේශපාලනඥයන් ක්‍රියා කළ යුතු ය. පැතලි බදු ක්‍රමයක් වඩාත් උචිත විය හැකි ය. එබඳු සරල හා සාධාරණ බදු ක්‍රමයකින් නැගෙනහිර යුරෝපයේ වර්ධනය ඉහළ ගියේ ය. නමුත් පැතලි බදු ක්‍රමයක් හොඳ වන්නේ එය පැතලි නිසා නොව එයින් අදහස් වන්නේ අඩු බදු අනුපාතයක් වන නිසා ය. මෑතක් වන තුරු අයිස්ලන්තයේ පැතලි බදු ක්‍රමයක් තිබූ නමුත් බදු අනුපාතය ආසන්න වශයෙන් සියයට 37ක් පමණ විය. ඉහළ නගින බදු ක්‍රමයක් ඇති සිංගප්පූරුව වැනි රටක ඉහළම බදු අනුපාතය සියයට විස්සක් වන ලෙස වඩා හොඳ බදු ක්‍රමයක් ඇත.

## වියදම් හා ප්‍රතිලාභ විශ්ලේෂණය

විවිධ ආකාරයේ ආණ්ඩුවේ වියදම් ආර්ථිකයට හොඳ ද ? නරක ද ? යන්න තීරණය කිරීම සඳහා වියදම් හා ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණයක් අවශ්‍ය වෙයි. පහත සඳහන් ප්‍රශ්න මාලාව ආණ්ඩුවේ වැඩසටහන සම්බන්ධයෙන් ආර්ථික පරීක්ෂාවක් ලෙස කල්පනාවට ගත හැකි ය. සියලු ම උත්තර ධනාත්මක නම් එවිට එම විශේෂිත වැඩසටහන හෝ ක්‍රියාකාරකම ආර්ථික ක්‍රියාකාරිත්වයට යහපත් බලපෑමක් ඇති කරයි.

**1. වැඩසටහන හෝ ක්‍රියාකාරකම කුමන හෝ ප්‍රතිලාභයක් ඇති කරන්නේ ද ?**

ආණ්ඩුවේ සෑම වියදමක් ම අවසන් වන්නේ කාගේ හෝ සාක්කුවෙනි. එබැවින් පටු අර්ථයෙන් එහි ප්‍රතිලාභයක් ඇත. එසේ වුව ද වැදගත් ප්‍රශ්නය වන්නේ වැඩසටහන හෝ ක්‍රියාකාරකම මගින් පුළුල් සමාජයට කුමන හෝ ප්‍රතිලාභයක් ලබා දෙන්නේ ද යන්නයි. තදබදය ඇති ප්‍රදේශයක නව මාර්ගයක් ඉදි කිරීම වැනි ඇතැම් සිදුවීමක දී එහි සැලකිය යුතු ප්‍රතිලාභ තිබිය හැකි ය. රැකියා විරහිතභාවයට සුභසාධන ලබා දීම වැනි වෙනත් සිදුවීමක දී සමාජයට ඇත්තේ අහිතකර බලපෑමකි.

**2. වැඩසටහන හෝ ක්‍රියාකාරකම මගින් ප්‍රතිලාභ ලබා දෙන්නේ නම් එම ලබා දෙන ප්‍රතිලාභ එම මුදල් පෞද්ගලික අංශයට තැබුවේ නම් එහි ප්‍රතිඵල ලෙස ඇතිවිය හැකි ප්‍රතිලාභවලට වඩා වැඩි ද ?**

ඕනෑ ම මොහොතක ආර්ථිකයක තිබිය හැකි ශ්‍රමයේ හා ප්‍රග්ධනයේ ප්‍රමාණයට සීමාවක් ඇත. සුළං බලාගාරයක් ඉදි කිරීම වැනි සාපේක්ෂ වශයෙන් අඩු ආර්ථික වටිනාකමක් ඇති කටයුත්තකට එම සම්පත් යෙදවීම රජයේ වියදම් මගින් සිදු වන්නේ නම්, එම සම්පත් ආර්ථිකයේ ඵලදායි අංශ සඳහා යොදා ගැනීමට නොහැකි වෙයි. පෞද්ගලික අංශය විසින් නිපදවන්නට ඉඩ තිබූ අතිරේඛ නිෂ්පාදනයට වඩා සුළං බලාගාරයෙන් ලැබෙන ප්‍රතිලාභ අඩු නම් එවිට ආණ්ඩුවේ වියදම මගින් ඇති කරන ශුද්ධ බලපෑම සෘණාත්මක වෙයි.

**3. වැඩසටහන හෝ ක්‍රියාකාරකම මගින් ඇතිකරන ප්‍රතිලාභ පෞද්ගලික අංශය මගින් ලබාදිය හැකි ප්‍රතිලාභවලට වඩා වැඩි නම් බදුකරණයේ හෝ ණය ගැනීමේ අහිතකර බලපෑම් පියවීමට ප්‍රමාණවත් තරම් එම ප්‍රතිලාභ වැඩි ද ?**

අවසන් නමුත් වැදගත්කමෙන් අඩු නැති කරුණය නම් ආණ්ඩුවේ වියදම් සඳහා මුදල් සපයා ගන්නේ කෙසේ ද යන්න යි. රාජ්‍ය අංශයේ වියදම් ආර්ථික වර්ධනයට හිතකර වන්නේ බදුකරණයේ (හෝ ණය ගැනීමේ) ආර්ථික හානිය පියවීමට තරම් ශුද්ධ ප්‍රතිලාභ ඉහළ මට්ටමක පවතින්නේ නම් පමණකි. ඇත්තෙන් ම බදු හා ඒවා එකුතු කරන අකාරය අනුව පිළිතුර වෙනස් වෙයි. ඇතැම් විට ආණ්ඩුවේ ඉතා වැදගත් ඵලදායි වියදම් පවා ශුද්ධ වශයෙන් සෘණාත්මක වීමට ඉඩ ඇත්තේ

ඒ සඳහා මුදල් සොයා ගත්තේ පෞද්ගලික අදායම් මත ඉහළ බදු අනුපාත පැනවීම මගින් නම් ය. එසේ වුව ද, පරිභෝජනය මත අඩු අනුපාතයකින් බදු පනවමින් මුදල් සපයා ගත්තේ නම් ඉහත සඳහන් කළ ආකාරයේ රාජ්‍ය අංශයේ වියදම් ම ආර්ථික වශයෙන් සාධාරණීකරණය කිරීමේ හැකියාව ඇත.

කොටස් තුනේ පරික්ෂාව පැහැදිලිව ම සරල කිරීමකි. බොහෝ අවස්ථාවල දී ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය මගින් සිදුවන ආර්ථික හානිය සම්පත් පුද්ගලික අංශයෙන් ඉවතට ඇද ගැනීමේ සහ අදායම් ඉපදවීමේ වියදමේ බලපෑමට වඩා එහා යයි. උදාහරණයක් ලෙස, ආණ්ඩුවේ ඇතැම් නීති රීති මගින් පුද්ගලික අංශය මත විශාල වියදමක් පටවයි. එමෙන් ම අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, නිවාස සහ විශ්‍රාම සුභසාධනය සඳහා වන වැඩසටහන් මගින් සාමාන්‍යයෙන් සිදු වන්නේ ඉතිරි කිරීම් සඳහා වන දිරි ගැන්වීම් දුර්වල කිරීමය. එයින් ඉහතින් සාකච්ඡා කළ බලපෑම්වලට වැඩියෙන් සහ දුර දිග යන අහිතකර බලපෑමක් ආර්ථික කාර්ය සාධනය මත සිදු වෙයි.

තවත් ප්‍රශ්නයක් වන්නේ ආණ්ඩුවේ ක්‍රියාකාරකම් මගින් කෙතරම් දුරට පෞද්ගලික සම්පත් වැරදි ලෙස යොදා ගැනීම දිරි ගන්වන්නේ ද යන්නයි. ආණ්ඩුවේ නීති රීති අනුව කටයුතු කිරීමට හා අනුග්‍රහ ලබා ගැනීමට ක්‍රියා කිරීම සඳහා (හෝ, වඩා ගෞරවනීය ලෙස කිවහොත්, ආණ්ඩුවේ මැදිහත්වීම් වළකා ගැනීමට ක්‍රියා කිරීම සඳහා) වන කාර්යභාරයට තමන්ට සිටින දක්ෂ ම පුද්ගලයින් අතරින් පිරිසක් යෙදවීමට කර්මාන්ත බොහොමයක් දැන් ක්‍රියා කරයි. මෙම ජනයා ඔවුන්ගේ හැකියාවන් වඩාත් ඵලදායි ආකාරයෙන් යොදා ගන්නේ නම් ජාතියේ ආර්ථිකය වඩාත් සමෘද්ධිමත් වන බව හොඳට ම විශ්වාස ය.

## ලාෆර් වක්‍රය

ඉහත සදහන් කළ කෙටි විග්‍රහය මගින් බදුකරණය හා ආණ්ඩුවේ වියදම් පිළිබඳ තේරුම් ගැනීමට ප්‍රයෝජනවත් රාමුවක් ඉදිරිපත් කෙරිණි. කෙසේ වෙතත්, තවත් ප්‍රතිපත්ති ප්‍රශ්න තුනක් කෙටියෙන් සඳහන් කිරීම අවශ්‍ය වන අතර ලාෆර් වක්‍රයෙන් එය ආරම්භ කෙරෙයි.

බොහෝ දේශපාලනඥයන් බොළඳ ලෙස කල්පනා කරන්නේ බදු අනුපාත හා බදු අදායම අතර ස්වයංක්‍රිය හා ස්ථාවර සම්බන්ධතාවක් පවතින බවයි. එනිසා ඔවුන් සිතන්නේ බදු

අනුපාත දෙගුණ කළ විට බදු අදායම දෙගුණ කළ හැකි වන බවයි. නව දිරි ගැන්වීම් අනුව, තම හැසිරීම් වෙනස් කර ගැනීමේ හැකියාව බදු ගෙවන්නන් සතුය යන කාරණය නොතකා හැරීම නිසා මෙම ප්‍රවේශය දෝෂ සහිත ය.

ලාෆර් වක්‍රය මගින් පෙන්නුම් කරන්නේ බදු අනුපාතය බින්දුව වූ විට ආණ්ඩුවේ අදායම ද බින්දුව වනවා සේ ම බදු අනුපාතය සියයට සියයක් වූ විට ද ආණ්ඩුවේ අදායම බින්දුවක් (හෝ ඉතා සුළු ප්‍රමාණයක්) වන බවයි. තමන් උපයන සියලු දේ ආණ්ඩුව පවරා ගන්නේ නම්, නිෂ්පාදනයේ යෙදෙනු ඇත්තේ ඉතා සුළු පිරිසකි. අදායම උපරිම වන බදු අනුපාතය පැහැදිලිව ම පවතින්නේ සියයට 0 හා සියයට සියය අතර කිසියම් ස්ථානයක ය.




ප්‍රධාන කාරණයක් වන්නේ ආර්ථික වර්ධනය උපරිම වන බදු අනුපාතය අදායම උපරිම කරන බදු අනුපාතයට වඩා අඩු බවයි. ආර්ථික පර්යේෂණ මගින් පෙන්නුම් කර ඇත්තේ දිගු කාලින වශයෙන් අදායම් උපරිම කරන බදු අනුපාතය පවතින්නේ සියයට 30 ආසන්නයේ කිසියම් ස්ථානයක බවයි. ඊට ප්‍රතිවිරුද්ධ ලෙස වර්ධනය උපරිම වන බදු අනුපාතය පවතින්නේ ඉතා අඩු මට්ටමක ය. (ඕනෑම බද්දක් ආර්ථික වර්ධනයට අහිතකර වන නමුත් ඉහත සාකච්ඡාවේ දී පෙන්නුම් කළ පරිදි පොදු භාණ්ඩ හා වර්ධනයට හිතකර වෙනත් ආකාරයේ වියදම් සඳහා මුදල් යෙදවීමට ඇතැම් බදු අවශ්‍ය වෙයි.)

## කෙන්ස්වාදී උත්තේජනය

ජෝන් මෙනාඩ් කේන්ස් ආර්ථික විද්‍යාඥයා 1930 ගණන්වල දී තර්ක කළේ ආණ්ඩුව මුදල් ණයට ගෙන වියදම් කිරීමෙන් දුර්වල ආර්ථිකයක් ඉහළ නැංවිය හැකි වන බවයි. මෙම න්‍යායට අනුව අලුත් වියදම් සඳහා යොදන මුදල් මහජනයාගේ සාක්කුවලට යන අතර එම මුදල් ලැබෙන අය ඒවා වියදම් කරන විට මුදල් සංසරණය සිදු වීමෙන් ආර්ථිකයේ ඉහළ යාමක් සිදු වෙයි.

මෙහි අදහස වන්නේ ආණ්ඩුව මුදල් ණයට ගෙන ඒවා වියදම් කරන ජනයා අතට කුමන හෝ ආකාරයකින් මුදල් ලබා දීම වන නිසා ඇතැම් බදු කපා හැරීම මගින් ද එම බලපෑම ම ඇතිවන බව කේනීසියානුවෝ පැවසුහ.

කෙනීසියානු අදහස් තුළ කැපී පෙනෙන තාර්කික වැරැද්දක් ඇත. පළමුවෙන්, ආර්ථිකයෙන් මුදල් ඉවතට නොගෙන ආර්ථිකයට මුදල් එන්නත් කිරීමේ හැකියාවක් සත්‍ය ලෝකයේ දී නැත යන කාරණය ඔවුහු නොතකා හරිති. ආණ්ඩුව විසින් ආර්ථිකයේ දකුණු සාක්කුවට දමන ඕනෑම මුදලක් කලින් ආර්ථිකයේ වම් සාක්කුවෙන් ඉවත් කර ගත් මුදලකි.

උත්තේජන පැකේජයක් සඳහා වියදම් කරන සෑම ඩොලරයක් ම ආණ්ඩුව පළමුවෙන් පෞද්ගලික ණය වෙළඳ පොළෙන් ණයට ගත යුතු වීම නිසා මෙහි දී ආර්ථිකයේ ඉහළ නැගීමක් සිදුවන්නේ නැත. කේන්ස්වාදය මගින් ජාතික අදායම ඉහළ නංවන්නේ නැති අතර සිදු වන්නේ එය නැවත බෙදා හැරීමක් පමණකි.

ඇත්ත ලෝකයේ සාක්ෂි මගින් ද පෙන්නුම් කර ඇත්තේ කේන්ස්වාදී උත්තේජනය සාර්ථක නොවන බවයි. 1930 ගණන්වල හුවර් සහ රුස්වෙල්ට් ජනාධිපතිවරුන් මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ ද එය සාර්ථක වුයේ නැත. 1990 ගණන්වල ජපානය උත්සාහ දැරුව ද සාර්ථක නොවී ය. එමෙන් ම මෙම දශකයේ දී එක්සත් රාජධානිය හා එක්සත් ජනපදය ඇතුළු බොහෝ රටවල දේශපාලනඥයන් සඳහා ද එයින් සාර්ථක ප්‍රතිඵල ලැබුණේ නැත.

## රාන් වක්‍රය

ආදායම උපරිම වන බදු අනුපාතය පෙන්නුම් කිරීමට ලාෆර් වක්‍රය තිබෙනවා මෙන් ම ආර්ථික වර්ධනය උපරිම වන ආණ්ඩුවේ වියදම් මට්ටම හඳුනා ගැනීම සදහා රාන් වක්‍රය ඇත.

රාන් වක්‍රය පදනම් වී ඇත්තේ ආණ්ඩුවක් නොමැති විට ඇති වන ආර්ථික වර්ධනය හෝ ක්‍රියාකාරකම් ඉතා අඩු ය යන සංකල්පය මත ය. නමුත් ආණ්ඩුව මුදල් වියදම් කිරීමට පටන් ගෙන හොඳ ආයතන පද්ධතියක් ලබා දීමටත්, පොදු භාණ්ඩ සැපයීමටත් පටන් ගත් විට වෙළඳ පොළ ආර්ථිකය වර්ධනය වීමට හා සමෘද්ධිමත් වීමට අවස්ථාව ලැබේ.

කෙසේ වෙතත්, එක්තරා අවස්ථාවක් වන විට මාරු කිරීමේ වැඩසටහන් හා පරිභෝජන වැඩසටහන් සඳහා මුදල් වියදම් කිරීම ආණ්ඩු පටන් ගනිති. මෙම වර්ගයේ වියදම්, ආර්ථික කාර්ය සාධනය අඩපණ කිරීමට හේතු වෙයි. ආණ්ඩුව වඩා විශාල වන විට සෑම වර්ගයක ම වියදම් අඩු කාර්යක්ෂමතාවයකින් යුතු වන බව ද එමෙන් ම සත්‍ය විය හැකි ය.

පර්යේෂණ මගින් පෙන්නුම් කර ඇත්තේ ආර්ථික වර්ධනය උපරිම කරන ආණ්ඩුවේ වියදම් මට්ටම වන්නේ ආර්ථික නිෂ්පාදිතයෙන් සියයට 20ක් පමණ වන මට්ටමක් බවය. දිගු කාලින ඓතිහාසික දත්ත අනුව බලන කළ මෙය ඊටත් අඩු ය. මෙය උතුරු ඇමරිකානු හා යුරෝපියානු රටවල වියදම් මට්ටමට වඩා ඉතා අඩු මට්ටමකි.



**නිගමනය : ඉහළ බදු සහිත ආර්ථික පාඩු ලබනු ඇත**

සංවර්ධිත රටවල් සියල්ලෙහි ම පාහේ ආණ්ඩුවේ වියදම් ආර්ථික නිෂ්පාදිතයෙන් විශාල කොටසක්ව පවතියි. හොන්කොන් වැනි කුඩා ආණ්ඩු ආර්ථික ඇත්තේ ස්වල්පයකි .එසේ වුව ද බොහෝ රටවල හා විශේෂයන් ම යුරෝපයේ දැන් ඇත්තේ ඉතා විශාල ආණ්ඩු ය. බුෂ් හා ඔබාමාගේ පාලන කාලවල් තුළ එක්සත් ජනපදය ද යුරෝපයට බොහෝ දුරට සමාන තත්ත්වයට පත් විය.

සාක්ෂි මගින් පෙන්නුම් කරන්නේ විශාල ආණ්ඩු වෙත සිදු වී තිබෙන මෙම පරිවර්තනය මගින් බරපතල ආර්ථික ප්‍රතිවිපාක ඇති කරන බවයි. ආණ්ඩුවෙන් ඇතිවන විශාල බර මගින් ආර්ථිකයේ ඵලදායි අංශ වෙතින් ඉවතට සම්පත් යොමු කරනු ලබන අතර ඉතා ම වියදම් අධික බදු ක්‍රමයක් ඇති කරයි. තරඟකාරී ගෝලීය ආර්ථිකයක් තුළ වඩා වගකීමෙන් යුතු වියදම් හා අඩු බදු පවත්වා ගෙන යන රටවල් වෙත වියදම් අධික සහ ඉහළ බදු සහිත රටවලින් රැකියා හා ආයෝජන ගලා යනු ඇත .

**වැඩිදුර කියැවීම්**

*Edwards" Chris and Daniel J' Mitchell ^2008& Global Tax Revolution( The Rise of Tax Competition and The Battle to Defend It" Washington D'C'( Cato Institute'*

*Heath" Allister ^2006& Flat Tax( Towards a British Model" London( Stockholm Network' fjí wvúh( http($$www'stockholm-network'org$ Publications*

*Smith" David B' ^2006& Living with Leviathan( Public Spending" Taxes and Economic Performance" London( Institute of Economic Affairs'*
*Online at (http($$www'iea'org'uk$record'jsp@ID}394&type}book*

# 5

# දේපළ අයිතීන්

# දේපළ අයිතීන්

කැරොල් බෝඩ්රෝක්ස් විසිනි

දේපළ සඳහා ඇති අයිතිය ආරක්ෂා කිරීම ආර්ථික වර්ධනය ඉහළ නැංවීමටත්, දිළිඳුකම පිටු දැකීමටත්, දුලබ සම්පත් ආරක්ෂා කර ගැනීමටත් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. නිර්මාණයට, නවෝත්පාදනයට සහ අන් අය සමග ස්වේච්ඡාවෙන් වෙළඳාම් කිරීමටත් දිරි ගැන්වීමක් දේපළ අයිතිය මගින් ජනතාවට ලබා දෙයි. දේවල් රැක ගැනීමට හා නඩත්තු කිරීමට හේතුවක් ඉන් අපට ලබා දෙන අතර අන් අයගෙන් අප ආරක්ෂා කිරීමට ද එය අපට ආධාර වෙයි.

එමගින් මෙම කාර්යයන් ඉටු කරන නිසා දේපළ අයිතීන් නිදහස් සහ සමෘද්ධිමත් සමාජයකට ආධාර කරන පදනමේ කොටසක් බවට පත් වෙයි. දේපළ අයිතීන් සම්බන්ධයෙන් කල්පනා කළ හැකි වෙනත් අකාරයක් නම් එය සමාජයන් එකට පවත්වාගෙන යන මැලියම්වල කොටසක් බවයි.

## දේපළ අයිතීන් යනු මොනවාද ?

දේපළ අයිතීන් යනු ප්‍රශ්න විසඳීම සඳහා සංවර්ධනය කරන ලද නීති ය. රථවාහන ගමන් කිරීම ඉතා මටසිලුටු කරමින් ගැටුම් ඇති නොවීමට මහජනයා නීති හැදුවා මෙන් ම, විවිධ ආකාරයේ දේපළ භාවිත කළ හැක්කේ කාට ද යන්න පිළිබඳව, ඔවුන්ට දේපළ භාවිත කළ හැක්කේ කෙසේ ද ? එම දේපළ වෙනත් අයට පැවරිය හැක්කේ හෝ නොහැක්කේ කෙසේ ද ? යන්න ආදිය පිළිබඳව නීති මහජනයා කාලයක් තිස්සේ ගොඩ නැගූහ.

විශේෂ ආකාරයකින් හැසිරීමට දේපළ අයිතිය විසින් මහජනයා දිරිමත් කරනු ලබයි. (උදාහරණයක් ලෙස 'ජලය කාන්දු වන වහලය වෙනුවට අලුත් වහලයක් යෙදීම වඩා කාන්දු වන, නැතහොත් නිවාස දිරාපත් වීමට ඉඩ ඇත') එමෙන් ම තමන් නීති කැඩුවොත් සිදු වන්නේ කුමක් දැයි මහජනයාට දැනගන්නට ලැබෙයි. (උදාහරණයක් ලෙස 'ඔබගේ අසල්වැසියාගේ ඇපල් වත්ත ඇගේ අවසරයකින් තොරව ඔබ කපා දැමුවහොත් ඇයට වන්දි ගෙවීමට ඔබට සිදු වෙයි.)

මෙම ඇතැම් නීති විධිමත් විය හැකි අතර ඒවා නීති හා රීති ලෙස ප්‍රකාශයට පත් කොට තිබිය හැකි ය. එමෙන් ම ඇතැම් නීති අවිධිමත්, ලිඛිත නොවන ඒවා විය හැකි අතර සමාජය අනුගමනය කරන සමාජ සම්මතයන්ගේ කොටසක් විය හැකි ය.

මෙම වර්ග දෙකේ ම දේපළ අයිතීන් එකවිට පවතියි. විධිමත් අයිතීන් ආණ්ඩු විසින් සාධාරණ ලෙස ක්‍රියාවට නගනු ඇතැයි අපේක්ෂා කරනු ලබන අතර අවිධිමත් අයිතීන් ක්‍රියාවට නගනු ඇතැයි අපේක්ෂා කරන්නේ සමාජයේ තෙරපුම මගිනි. මහජනයා නීතිවලට ගරු කරන තාක් කල් විධිමත් හා අවිධිමත් යන දේපළ අයිතීන් දෙවර්ග යෙන් ම ආර්ථික වර්ධනය, සංරක්ෂණය සහ පුද්ගලික නිදහස වර්ධනය කිරීම ඵලදායි ලෙස සිදු කළ හැකි ය.

වඩා විශේෂිත ලෙස කිවහොත්, ඔබට යම් දෙයක් අයිති නම්, සාමාන්‍යයෙන් ඔබට ඒ දේ සම්බන්ධයෙන් අයිතීන් ගණනාවක් හිමි වෙයි. සාමාන්‍යයෙන් ඔබට හිමි වන අයිතීන් නම් :

- ඔබගේ දේපළ පරිහරණයට හෝ පරිහරණය නොකිරීමට අයිතිය
- ඔබගේ දේපළෙන් ලැබෙන ලාභය (ඔබගේ පලතුරු වත්තේ වැවෙන ඇපල් විකිණීම)
- ඔබගේ දේපළ භාවිතයට වෙනත් අයට ඉඩදීම (උදාහරණයක් ලෙස එය කුලියට දීම)
- ඔබේ දේපළ විකිණීම හෝ එය පවරා දීම (උරුමය ලෙස හෝ ත්‍යාගයක් ලෙස)
- අනවශ්‍ය තැනැත්තන් ඔබගේ දේපළෙන් ඉවත් කොට තැබීම

විවිධ දේ සම්බන්ධයෙන් අපට මෙම අයිතීන් තිබිය හැකි ය .

- සැබෑ දේපළ - මෙයින් අදහස් වන්නේ ඉඩම් සහිත දේ ය. එනම් ඉඩමට සම්බන්ධව ඇති නිවාස හා කර්මාන්ත ශාලා වැනි දේ ය.
- පෞද්ගලික දේපළ - මෙයින් අදහස් වන්නේ තැනින් තැනට රැගෙන යා හැකි අපට අයිති දේ ය. එනම් ඔබගේ ජංගම දුරකථනය, ඇඳුම් සහ ඔබගේ ආභරණ ආදියයි.
- බුද්ධිමය දේපළ - මෙයින් අදහස් වන්නේ අලුත් නවෝත්පාදනයක් හෝ සංගීත ඛණ්ඩයක් වැනි නිර්මාණාත්මක හෝ කලාත්මක උත්සාහයක ප්‍රතිඵල ලෙස හිමි වන දේපළයි. පේටන්ට් බලපත්‍ර හා ප්‍රකාශන හිමිකම් බුද්ධිමය දේපළ වෙයි.

අවසන් වශයෙන් මෙම අයිතීන් විවිධ පුද්ගලයින් හෝ කණ්ඩායම් විසින් දැරිය හැකි ය .

- පුද්ගලයින් හා සංවිධාන (හවුල්කාර හෝ සංස්ථාපිත) විසින් හෝ පුද්ගල කණ්ඩායම් (මෙය ප්‍රජා දේපළ වෙයි.) විසින්
- ආණ්ඩුව විසින් (උදාහරණ නම් ජාතික උද්‍යාන භූමි හා බොහෝ අවස්ථාවල ආණ්ඩුවේ පාසල් ඉදිකොට ඇති ඉඩම් ආදියයි.)
- ඇතැම් විට යම් දෙයක් හෝ ප්‍රදේශයක් සම්බන්ධයෙන් කිසිවෙක් හිමිකම් නොදරති. මෙබඳු අවස්ථාවල දී එම ප්‍රදේශය හෝ දෙය හඳුන්වනු ලබන්නේ විවෘත සම්පතක් වශයෙනි (ඉතා ම පැහැදිලි උදාහරණය වන්නේ කිසිවකුට, කිසිදු කණ්ඩායමකට හෝ ආණ්ඩුවකට හෝ අයිති නැති ගැඹුරු මුහුදයි).

**දේපළ අයිතීන් ක්‍රියාත්මක වන්නේ ඇයි ?**

දේපළ අයිතීන් ක්‍රියාත්මක වන්නේ විශේෂ ආකාරයකට හැසිරීමට මහජනයාට එමගින් දිරිගැන්වීමක් ලැබෙන නිසා ය. දේපළ සඳහා අයිතිය සීමිත හෝ අයිතිය නැති තත්ත්වයකදීට වඩා දේපළ අයිතියේ ආරක්ෂාව තහවුරු වී ඇති තත්ත්වයක දී තමන්ගේ දේපළේ සංවර්ධනයට, ආරක්ෂාවට, සංරක්ෂණයට සහ නඩත්තුවට ඔවුන් ආයෝජනය කිරීමට වැඩි ඉඩකඩක් ඇත.

දේපළ සංවර්ධනය, ආරක්ෂාව සහ සංරක්ෂණය වියදම් අධික ය. එම දේවල් කිරීම සදහා මහජනයා වෙලාව යොදවා වෙහෙස වන්නේ ඔවුන්ගේ දේපළ අයිතිය සුරක්ෂිත නම් ය. යම්කිසි අධිකාරයක් මගින් මෙම අයිතීන් පවත්වාගෙන යන්නේ නැති නම් තම දේපළ ආරක්ෂාවට මහජනයා කාලය හා වෙහෙස යොදවන්නේ අඩුවෙනි.

දෙපළක් ආරක්ෂා කරන්නේ හෝ සංරක්ෂණය කරන්නේ කුමකට ද ? පිළිතුර නම් අනාගතයේ යම් අවස්ථාවක මෙම ක්‍රියාවලීන්හි ප්‍රතිඵල ඔබ අපේක්ෂා කිරීම නිසා ය යන්නයි. නිවසේ ජලය කාන්දු වන වහලය ඔබ අලුත්වැඩියා කරන්නේ, එසේ නොකළහොත් නිවස දිරාපත් විය හැකි නිසා ය. නිවස දිරා පත් වුවහොත් එය විකිණීමක් කළ විටක දී ඔබට වැඩි ලාභයක් ලබාගත නොහැකි වීම හෝ එය වාසයට අප්‍රසන්න තැනක් වීම හෝ සිදු විය හැකි ය. කුමන අකාරයෙන් හෝ ඔබගේ ක්‍රියාත්මක නොවීමට යම් ගෙවීමක් කිරීමට ඔබට සිදුවෙයි. නඩත්තුව හා සංරක්ෂණය සඳහා දිරිගැන්වීමක් දේපළ මගින් ඇති වන්නේ ඔබගේ උත්සාහය ඔබ ලබන ප්‍රතිලාභ සමග කෙලින් ම බැඳී පවතින නිසා ය.

ඇත්තෙන් ම, තමන්ගේ දේපළ අලුත්වැඩියා කර ගැනීමට හෝ සංරක්ෂණය කිරීමට හැකියාව සෑම දේපළ හිමිකරුවකුට ම හැම විට ම නැත. ඕනෑ ම මොහොතක අවශ්‍ය අලුත්වැඩියා කටයුතු කිරීමට කෙනෙකුට මුදල් නැති විය හැකි ය. කෙසේ වෙතත් සාමාන්‍ය ප්‍රවණතාව වන්නේ ඔබට අයිති දේ රැක බලා ගැනීමයි. එසේ වන්නේ ඔබගේ දැක්ම අනුව කළ යුතු ඥානවන්ත දේ එය වන නිසා ය. අද ඔබගේ දේපළ රැක බල ගැනීමෙන් අනාගතයේ දී ඔබට ප්‍රයෝජන ලබා ගත හැකි ය.

**වෙළඳාම වර්ධනය කිරීම හා ආර්ථික වර්ධනය**

දේපළ සඳහා මහජනයාගේ අයිතිය සුරක්ෂිත වූ විට ඔවුහු අනෙක් ජනයා සමග වෙළඳාම් කරති. දේපළ අයිතිය නොමැතිව වෙළඳාම කළ නොහැකි ම නොවේ නම් අපහසු ය. එබැවින් වෙළඳාම මගින් ලබාගත හැකි ප්‍රතිලාභ සීමා සහිත ය.

මේ ගැන කල්පනා කළ හැකි තවත් අකාරයක් නම් දේපළ අයිතිය මගින් මහජනයාට දුලබ සම්පත් යොදා ගැනීමට ඉඩ ලබාදෙන බවයි. උදාහරණ නම් ඔවුන්ගේ දුලබ කාලය හා වෙනත් වටිනා සම්පත් ය. දුලබ සම්පත් යොදා ගන්නා ආකාරය ගැන

සාමාන්‍යයෙන් පිළිගත් නීති සමාජයන්හි ඇත්නම්, සම්පත් යොදා ගැනීම ගැන ඔවුන් අතර ගැටුම් ඇතිවන්නේ අඩුවෙනි. ඒ අකාරයෙන් දේපළ සම්බන්ධයෙන් පැහැදිලි නීති තිබීම සාමය වර්ධනය කිරීමට හේතු වෙයි.

එමෙන් ම තමන්ගේ ශ්‍රමය හා වෙනත් වටිනා සම්පත් පාලනය කරන ජනයා එම වටිනා දේ භාවිතා කරන ආකාරය ගැන තීරණය කරති. එක දෙයක් හෝ වෙනත් දෙයක් හෝ කිරීමට කිසියම් අධිකාරයක් ඔවුන්ට නියෝග කරන්නේ නැත. මෙමගින් පුද්ගලයින් බලසතු කරන අතර එමගින් සිත් ගන්නා සුලු යයි ඔවුන් සිතන අවස්ථා හඹා යාමට ඔවුන්ට ඉඩ ලබා දෙයි. වටිනා බව අනෙක් ජනයා සිතන දේ කිරීමට එමගින් ඔවුන්ට දිරිගැන්වීමක් ලැබෙයි.

උදාහරණයක් ලෙස ඔබ බේකරි කර්මාන්තයට කැමති යයි සිතමු. ඔබට ඔබේ ශ්‍රමයේ අයිතිය (පාලනය) ඇත්නම් සහ ස්ථානයක් බදු ගැනීමට මුදල් ඉතිරි කර ගැනීමට හැකි නම්, ඔබට බේකරියක් ආරම්භ කළ හැකි ය. ඔබගේ ආශාවක් ලුහු බැඳීමට ඔබ ඔබගේ ශ්‍රමය සහ ප්‍රාග්ධනය යොදවන අතර එම ක්‍රියාවලිය තුළ, ඔබ නිෂ්පාදනය කරන දේ සහ ඔබ සතු දේ වෙනත් අය සතු දේ (ඔබගේ කේක් හා පේස්ට්‍රි මිලදී ගැනීමට ඔවුන් අත ඇති මුදල්, ඔබට බදු දීමට ස්ථානයක් ආදී වශයෙන්) සමග වෙළඳාම් කිරීමේ ද ඔබ යෙදෙයි.

විවිධාකාර වෙළඳාම්වල ප්‍රතිඵල වශයෙන් මහජනයාගේ තත්ත්වය වඩා යහපත් වෙයි. ඔබ ඔබගේ ව්‍යාපාරය ගොඩ නගයි. නිවාස හිමිකාරිනිය ඇගේ දේපළ ලාභදායක ලෙස යොදා ගනියි. පාරිභෝගිකයාට අවශ්‍ය කේක් ලැබෙයි. හැම දවසක ම ලොව පුරා සිදුවන බිලියන, බිලියන ගණනක් වෙළඳාම් සිදුවීමේ පදනම නම් වෙළඳාම සඳහා දේ මහජනයා සතු වීමයි.

වැඩියෙන් වෙළඳාම් කරන ජනයා වැඩි වැඩියෙන් සමෘද්ධිමත් වන බව පෙන්වීමට ප්‍රබල සාක්ෂි ඇත. මහජනයාට තම දක්ෂතා, භාණ්ඩ හා සේවා අනෙක් ජනයා සමග වෙළඳාම් කිරීමට නිදහස ඇති රටවල ජනයාගේ ජීවන මට්ටම් ඉහළ නගින අතර සාමාන්‍යයෙන් දිගු කාලයක් ජීවත්වන බවත් සෞඛ්‍යය සම්පන්න වන බවත් පෙනී ගොස් ඇත. ආර්ථික සංවර්ධනයේ හා දිළිඳු බව පිටු දැකීමේ ප්‍රධාන සාධකය වන්නේ වැඩි වැඩියෙන් වෙළඳාමයි. වෙළඳාම රඳා පවතින්නේ දේපළ අයිතිය මතයි.

**පරිසරය ආරක්ෂා කිරීම**

දේවල් සංරක්ෂණයට හා නඩත්තුවට දිරිගැන්වීමක් දේපළ අයිතිය මගින් මහජනයාට ලබා දෙන  නිසා පරිසරය අරක්ෂා කිරීමේ ඉතා වැදගත් කාර්යයක් දේපළ අයිතිය මගින් ඉටු කරයි. මේ සම්බන්ධයෙන් අප්‍රිකාවේ උදාහරණයකින් පැහැදිලි වෙයි.

කළු සහ සුදු ජනයාට එකිනෙකට වෙනස් ආකාරයෙන් සැලකූ 1990 පෙර අප්‍රිකාවේ පැවති වර්ණභේදවාදී ආණ්ඩුව අසල්වැසි නැමීබියාව ද පාලනය කළේ ය.  එම ආණ්ඩුව නැමීබියාවේ ජනතාව පමණක් නොව  එරට වන ජීවීන් ද පාලනය කළේ ය. එනම් සුදු ජාතික ගොවීන්ට අයිති ඉඩම්වල හමුවන වන ජීවීන් හැර අනෙක් සතුන් ය.

සුදු ජාතිකයන්ට අයිති ඉඩම් හැර අනෙකුත් සියලු ඉඩම්වල වන සතුන්ගේ අයිතිය ආණ්ඩුව සතු වීය.  නීත්‍යානුකූලව දඩයමේ යෙදීම කළු නැමීබියානුවන්ට මෙමගින් ඉතා දුෂ්කර කොට තිබිණි.  දේශීය ජනයාට වන ජීවීන්ගෙන් ලැබුණු ප්‍රතිලාභ සීමිත වූ අතර ඔවුන්ට විශාල හානි සිදු විය. (අලින් වගා  කෑම විනාශ කිරීම, එළුවන්ට හා බැටළුවන්ට තණ කෑ හැකි තැන්වල වන තුරඟුන් තණ කෑම සහ සත්ව ගොවිපොළවල් සතුරු සතුන්ගේ ප්‍රහාරයට ලක්වීම). මෙමගින්  අලි, කුඩු, ඔරික්ස්, රයිනෝ වැනි සතුන් දඩයමටත්, සිංහයන් හා කොටින් වැනි සතුරු සතුන් මරා දැමීමටත් දිරි ගැන්වීමක් ඇති විය).

සුදු ගොවීන්ටත් එම දිරිගැන්වීම ම තිබුණේ හෝ එලෙස ම හැසිරුනේ නැති ද ? ඔවුන් එසේ හැසිරුනේ නැත . ඒ වෙනුවට ඔවුන් කළේ වන ජීවීන් ද ඇතුළත් වන පරිදි තම ඉඩම් වැටවල් ගසා ආරක්ෂා කිරීමයි. ගවයන් ඇති කිරීම නවතා දැමූ ඔවුහු පෞද්ගලික ක්‍රීඩා උද්‍යාන ආරම්භ කළහ. වන ජීවීන්ගෙන් නීත්‍යානුකූලව ප්‍රතිලාභ ලැබීමේ ක්‍රමයක් ඔවුන් සතු විය.

නව ස්වාධින ආණ්ඩුව 1990 දී නැම්බියාවේ පාලනය භාර ගත්තේ ය. අවසානයේ ආණ්ඩුව රටේ දේපළ නීති වෙනස් කරමින් වන ජීවීන් කළමනාකරණය කරමින් ප්‍රතිලාභ ලැබීමේ අයිතිය ප්‍රාදේශීය ප්‍රජාවන්ට ලබා දුන්නේ ය. 1997 දී මෙම ප්‍රතිපත්තිය හඳුන්වා දීමෙන් පසුව වන ජීවීන් කළමනාකරණයට හා එම සම්පත්වල ප්‍රතිලාභ ලැබීමට  ප්‍රජා සංවිධාන 50කට වැඩි සංඛ්‍යාවක් ආරම්භ කොට ඇත.

මෙම ප්‍රජා ඉඩම්වල දඩයම් කටයුතු සම්පූර්ණයෙන් ම නතර වූයේ දැන් මේ ප්‍රාදේශීය ජනයාට වන ජීවින්ගෙන් කෙලින් ම ප්‍රතිලාභ හිමිවන නිසා ය. ඔවුන් සංචාරක නවාතැන් ඉදි කළ අතර එමගින් ප්‍රදේශයේ ජනතාවට රැකියා මෙන් ම අදායම් ද ලැබිණි. ඔවුන්ගේ අවශ්‍යතා සඳහා ඇතැම් සතුන් දඩයම් කිරීම සිදු විය. වෙනත් රටවල විනෝද උද්‍යාන සඳහා ඇතැම් ජීවී සතුන් විකුණන ලදී. සමහර අවස්ථාවල කුසලාන දඩයම් සඳහා ඉඩ ලබාදීම සිදු විය.

මෙම සියලු ක්‍රියාකාරකම්වලින් ප්‍රාදේශීය ජනයාට ප්‍රතිලාභ හිමි වූ අතර එම සියලු ප්‍රතිලාභ වන ජීවින් හා සම්බන්ධව තිබිණි. ප්‍රාදේශීය ජනයා එවිට කළේ සතුන් දඩයම් කිරීම වෙනුවට උන් රැක ගැනීම හා සංරක්ෂණය කිරීමයි.

පරිසරය සුරැකීමට ඇති එක් බලගතු ක්‍රමයක් වන්නේ සම්පත් ආරක්ෂා කිරීමෙන් ප්‍රතිලාභ හිමිවන ජනයාට පරිසර සම්පත් පිළිබඳ දේපළ අයිතිය ලබා දීමයි.

## පුද්ගලයන් සවිබල ගැන්වීම

සුරක්ෂිත දේපළ අයිතිය මගින් සිදුවිය හැකි ඉතාමත් වැදගත් කාර්යයක් වන්නේ මානව සමෘද්ධිමත් භාවය වර්ධනය කිරීමයි. තමන්ගේ සම්පත් භාවිත කරන ආකාරය ගැන තීරණ ගැනීමට පුද්ගලයන්ට හෝ පුද්ගල කණ්ඩායම්වලට හැකියාව ලැබුණු විට තමන්ගේ සුවිශේෂී දක්ෂතා උපයෝගී කර ගැනීමටත් වටිනා යයි තමන්ට තේරෙන ආකාරයෙන් සමෘද්ධිමත් භාවයට පත් වීමටත් මහජනයා සවිබල ගැන්වීම සිදු වෙයි.

වෙනත් ආකාරයකින් කිවහොත්, අධිකාරීන් (රජයේ හෝ සාම්ප්‍රදායික) දේපළ පාලනය කරන විට ඔවුන් නිතර ම කරන දෙයක් නම් සමාජයේ සිටින ඇතැම් කණ්ඩායම්වලට සම්පත් භාවිතයට හෝ ඇතැම් වෘත්තීන්වල යෙදීමට හෝ අවස්ථාවන් භාවිතයට හෝ ඇති හැකියාවට සීමා පැනවීමයි. වෙනත් වචනවලින් කිවහොත් සුළුතර කණ්ඩායම්වලට, දේශපාලන විරුද්ධවාදීන්ට හෝ ඕනෑම අකමැති කණ්ඩායමකට ආර්ථික හෝ වෙනත් අවස්ථා සීමා කිරීම සඳහා නිතර ම දේපළ අයිතීන්ට බාධා පමුණුවනු ලබයි. බොහෝ සමාජවල ස්ත්‍රීන් සබන්ධයෙන් මෙය විශේෂ ප්‍රශ්නයක් ලෙස පවතියි. ඉඩම් හා වෙනත් සම්පත් අයිති කර ගැනීමේ දී, උරුමයේ දී හෝ පාලනය පවත්වා ගැනීමේ දී බරපතල අසාධාරණයන්ට ලක් වීමට ඔවුන්ට සිදු වෙයි.

**නිදහස සහ සමෘද්ධිය සඳහා යතුර**

මේ හේතු සියල්ල නිසා, ධනවත් බව හා මානව සමෘද්ධිය සඳහා අවස්ථා විවෘත කර ගැනීම සම්බන්ධයෙන් ආයතනික යතුර වන්නේ සුරක්ෂිත දේපළ අයිතීන් ය. එමගින් වෙළඳාමත්, දුලබ සම්පත් සාමකාමී ලෙස බෙදා හැරීමත් වර්ධනය කරයි. දිළිඳුකම පිටු දැකීමට එය උපකාර වෙයි. ස්වභාවික සම්පත් ගැන සැලකිල්ල දැක්වීමට හා පවත්වාගෙන යාමට එමගින් ජනයාට දිරිගැන්වීම් ලබා දෙනවා මෙන් ම ඔවුන්ගේ සුවිශේෂී දක්ෂතා සහ හැකියා හඹා යාමේ අවස්ථා ඔවුන්ට ලබා දෙමින් මහජනයා සවිබල ගන්වයි.

මෙම අයිතීන් නොමැති විට සමාජයන් දුප්පත් වීමත්, වැඩියෙන් ගැටුම් හට ගැනීමත් සිදුවන අතර පුරවැසියන්ගේ සුවිශේෂී නිර්මාණාත්මක හැකියාවන් ප්‍රකාශ වීමට ඉඩ ලබා දීමේ හැකියාව ද අඩු වෙයි. සත්‍ය වශයෙන් ම නිදහස් සහ සමෘද්ධිමත් සමාජයක ගොඩනැගිලි කොටස් වන්නේ දේපළ අයිතීන් ය.

**වැඩිදුර කියැවීම්**

*Anderson" Terry L' and Fred S' McChesney ^2003& Property Rights( Cooperation" Conflict and Law" Princeton" NJ( Princeton University Press'*

*Bethell" Tom ^1999& The Noblest Triumph( Property and Prosperity Through the Ages" New York( Palgrave Macmillan'*

*Libecap" Gary D' ^2008& Contracting for Property Rights" Cambridge( Cambridge University Press'*

*Pipes" Richard ^1999& Property and Freedom" New York( Alfred A'Knopf'*

*Ostrom" Elinor ^1990& Governing the Commons( The Evolution of Institutions for Collective Action" Cambridge( Cambridge University Press'*

# 6

# ආණ්ඩු අසාර්ථක වන්නේ ඇයි ?

# ආණ්ඩු අසාර්ථක වන්නේ ඇයි ?

**පීටර් ජේ බෝයිට්කේ සහ ඩග්ලස් බී රොජර්ස් විසිනි**

ආණ්ඩුවේ ප්‍රතිපත්ති හා සසඳන විට වෙළඳ පොළ කෙතරම් හොඳින් ක්‍රියා කරන්නේ ද යන්න ගැන සාකච්ඡා ආරම්භ කරන විට බොහෝ ආර්ථික විද්‍යාඥයන් භාවිත කරන පැරණි කතාවක් ඇත. ගායකයින් දෙදෙනකු අතර තරඟයක් විනිශ්චය කරන ලෙස රෝම අධිරාජ්‍යකුගෙන් ඉල්ලා සිටිනු ලැබී ය. පළමු තරඟකරුවාගේ ගීතයට සවන් දීමෙන් පසුව දෙවන ගායකයාට ත්‍යාගය ලබා දීමට අධිරාජ්‍යයා තීරණය කළේ පළමුවැන්නාට වඩා නරක ලෙස ගායනා කිරීමට දෙවන්නාට ස්ථිරව ම නොහැකි වන්නේ ය යන උපකල්පනය යටතේ ය.

මෙහි ඇති වරද කුමක් ද ? පැහැදිලිව ම, තරඟය දක්ෂතා පිළිබඳ නිවැරදි මැනීමක් වීමට නම්, තීන්දුව දීමට පෙර අධිරාජ්‍යයා දෙවන තරගකරුට ගායනා කිරීමේ අවස්ථාව ලබා දිය යුතුව තිබිණි.

වෙළඳ පොළ ආර්ථිකයක් හා ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වයක් සසඳන්නට අපට සිදු වන විට ද ඇති වන්නේ ඒ සමාන තත්ත්වයකි. වෙළඳ පොළ ආර්ථිකයක් ක්‍රියා කරන්නේ කෙසේ ද යන්න පමණක් නොව ආණ්ඩුවේ තීරණ ගන්නේ කෙසේ ද යන්න ගැන ද අපි පරිස්සමෙන් විමසා බැලිය යුත්තෙමු.

වෙළඳ පොළවල් පරිපූර්ණ නැත. වෙළඳ පොළ අසාර්ථක වීම් ගැන ගත හැකි උදාහරණ ගැන අපි පසුව සාකච්ඡා කරමු. කෙසේ වෙතත්, වෙළඳ පොළක ප්‍රතිඵලයට වැඩි යමක් ආණ්ඩුවේ ප්‍රතිපත්ති මගින් ලබාගත හැකි ය යන නිගමනයට ස්වයංක්‍රියව පැමිණීමට එය හේතු නොවිය යුතු ය. ඒ වෙනුවට එයින් තත්ත්වය වඩාත් නරක් විය හැකි ය. වෙළඳ පොළ ආර්ථිකයකට ආණ්ඩුවේ මැදිහත් වීම සාධාරණීකරණය කිරීමේ උත්සාහයේ දී මූලික කරුණ නිතර ම පාහේ නොතකා හරිනු ලබයි.

'ආණ්ඩුව අසාර්ථක වීම' පිළිබඳ න්‍යාය සංවිධානය වී ඇත්තේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති මගින් එහි අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී ඇත්තේ කුමක් නිසා ද යන්න පැහැදිලි කිරීම සඳහා ය. දේශපාලන තීරණ ගැනීමේ ක්‍රියාවලියට ප්‍රශ්න ගණනාවකට මුහුණ දීමට සිදු වෙයි. වියදම් හා ප්‍රතිලාභ ගණනය කිරීමේ අපහසුතාවය, කාලය හා අවකාශය පිළිබඳව විස්තරාත්මක දැනීමක් නොමැති වීම, විශේෂ වාසි සොයන කණ්ඩායම් විසින් ප්‍රතිපත්තිය හැසිරවීමට උත්සාහ දැරීම ආදිය මෙයට ඇතුළත් ය.

වෙළඳ පොළේ ප්‍රතිඵල හා ආණ්ඩුවේ මැදිහත් වීම් සසඳා බැලීමට නම්, ආණ්ඩුවේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ වියදම් ද අප විසින් සැලකිල්ලට ගත යුත්තේ ය. (දෙවන ගායකයාට ද ගායනයට ඉඩ දීම) ඇත්තෙන් ම අප එය කළ විට 'වෙළඳ පොළ අසාර්ථකයි. ආණ්ඩුව භාවිත කරන්න' යන සම්මත තර්කය බිඳ වැටෙයි.

**වෙළඳ පොළ අසාර්ථක වීම් විසඳන්නට ආණ්ඩුවලට බැරි ඇයි ?**

'වෙළඳ පොළ අසාර්ථක වීම්' සම්බන්ධයෙන් ඇති සම්මත ආකාර තුනක් වන, ඒකාධිකාර, බාහිර බලපෑම් සහ පොදු භාණ්ඩ ගැන කෙටියෙන් සලකා බැලීම ආණ්ඩුවල මැදිහත් වීම් මගින් මතු වන ඇතැම් ප්‍රශ්න පෙන්වා දීමට අපට උපකාරී වෙයි.

**ඒකාධිකාර**

ඒකාධිකාරයක් වීමත් සමග භාණ්ඩයක හෝ සේවාවක හෝ එක ම සපයුම්කරු ලෙස එයට තම නිෂ්පාදිතයේ අවසන් මිල සම්බන්ධයෙන් පාලනයක් හිමි වන බවට තර්ක කෙරේ. එය එම බලය උපයෝගී කොට ගෙන නිෂ්පාදනය සීමා කරමින් තමන් ලබා

දෙන භාණ්ඩයේ හෝ සේවාවේ හෝ මිල ඉහළ  දමනු ඇත. වෙනත් ආදේශක නැති නිසා, ඒකාධිකාරයෙන් මිලදී ගැනීම හැරුණු විට පාරිභෝගිකයන්ට ඇති තෝරා ගැනීම් සීමිත ය. තරඟයක් තිබුණා නම් ඔවුන්ට ගෙවන්න වන මිලට වඩා ඉහළ  මිලක් ගෙවීමට ඔවුන්ට සිදු වෙයි.

මේවා සාමාන්‍යයෙන් නිර්මාණය වන්නේ ආණ්ඩුවේ බලයෙන් වන නිසා ප්‍රධාන ප්‍රශ්නය වන්නේ ඒකාධිකාර යනු 'වෙළෙඳපොළේ අසාර්ථකත්වයක්' ලෙස දැකීමයි. අනෙක් අයට තරඟ කිරීමේ අවස්ථා නොදී යම් පාර්ශ්වයන්ට ඒකාධිකාරී අයිතිය ලබා දෙන්නේ ආණ්ඩු විසිනි . වෙනත් වචනවලින් කිවහොත්, ඒකාධිකාර සාමාන්‍යයෙන් වෙළඳ පොළ ආර්ථිකයන්හි නිෂ්පාදිතයන් නොවේ. බොහෝ අවස්ථාවල දී එය  විශේෂ වාසි සොයන කණ්ඩායම්වලට ආණ්ඩුව දෙන වරප්‍රසාදවල ප්‍රතිඵලයකි.

**බාහිර බලපෑම්**

බාහිර බලපෑම් යනු එක් පාර්ශ්වයක් විසින් එම කාරණය පිළිබඳව තීරණ ගැනීමේ හැකියාව නැති වෙනත් පාර්ශවයක් මත පටවන වියදම් හෝ ප්‍රතිලාභයි. ඍණ හා ධන බාහිර බලපෑම් ලෙස ආර්ථික විද්‍යාඥයෝ මේවා වෙන්  කොට දක්වති.

ඍණ බාහිර බලපෑම්  සඳහා සම්භාව්‍ය උදාහරණය වන්නේ පරිසර දූෂණයයි. මගේ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන ක්‍රියාවලිය වෙතින් මා මගේ අපද්‍රව්‍ය බැහැර කරන ගංඟාව දූෂණය විය හැකි ය. පහළට ගසා ගෙන යන අපද්‍රව්‍ය මගින් මගේ අසල්වැසියන්ගේ වගා විනාශ විය හැකි ය. පරිසර දූෂණය සඳහා වන මගේ තීරණයේ මුළු හානිය ගෙවීමට මට සිදු නොවන නිසා පරිසර දූෂණයේ. ඍණ බාහිර බලපෑම වැඩියෙන් කිරීමට මා පෙළඹෙනු ඇත.

ධන බාහිර බලපෑම් මගින් සිදු වන්නේ මෙහි ප්‍රතිවිරුද්ධ ඵලයය. මගේ තීරණයේ වියදම් කිසිවක් ගෙවීමට ඔවුන්ට සිදු නොවුණ ද වෙනත් අයට මගේ තීරණය ක්‍රියාවට නැගීමෙන් ප්‍රතිලාභ අත් වෙයි.

උදාහරණයක් ලෙස අධ්‍යාපනය ගනිමු. මා වැඩියෙන් අධ්‍යාපනය ලබා සිටින තරමට ප්‍රජා ජීවිතයට වැඩියෙන් දායකත්වයක් ලබා දීමට මට හැකියාව ලැබෙයි. කෙසේ වෙතත් ප්‍රතිලාභ මට වඩා හිමි වන්නේ ප්‍රජාවට නම්, එයට ගෙවීමට සිදු වන්නේ මට නම් අධ්‍යාපනයේ දී අවනිෂ්පාදනය වීමට මා ක්‍රියා කරනු ඇත.

න්‍යායට අනුව නම්, සෘණ බාහිර බලපෑම් ඇති කරන ක්‍රියාකාරකම් මත බදු පැන වීමෙන් හා ධන බාහිර බලපෑම් ඇති කරන ක්‍රියාකාරකම් සඳහා සහනාධාර ලබා දීමත් මගින් මෙම ප්‍රශ්නය නිවැරදි කිරීමේ හැකියාව ආණ්ඩුවට ඇත. එම ක්‍රියා මගින් සමස්තයක් ලෙස සමාජයට ලැබෙන ප්‍රතිලාභ උපරිම වන ලෙස බදු සහ සහනාධාර මට්ටම් තීරණය කිරීම ඔවුන්ට කළ හැකි ය.

කෙසේ වෙතත් මෙම විසඳුමේ දී උපකල්පනය කරන්නේ අදාළ වියදම් හා ප්‍රතිලාභ මැනීමේ හැකියාව ආණ්ඩුවට ඇති බවය. ඒ සම්බන්ධයෙන් බරපතල ප්‍රශ්නයක් ඇත.

පළමුවැනිව ක්‍රියාවක හානිය හෝ ප්‍රතිලාභ හෝ හරියට ම දන්නේ එමගින් කෙලින් ම බලපෑමට ලක් වන උදවිය පමණකි. මෙහි තේරුම නම් අවශ්‍ය තොරතුරුවලට ප්‍රවේශ වීමේ හැකියාව නැති නිසා ආණ්ඩුවේ ඕනෑ ම විසඳුමක් අසාර්ථක විය හැකි වීමයි. (උදාහරණයක් ලෙස බදු හෝ සහනාධාරවල උචිත මට්ටම තීරණය කිරීම)

බාහිර බලපෑමක් සම්බන්ධ ගැටුමක් සමතයකට පත් කර ගැනීම සම්බන්ධයෙන් එයට අදාළ පාර්ශ්ව අතර ගිවිසුමකට එළඹිය හැකි ය. ගංගාව දූෂණයට ලක් කරන කර්මාන්ත ශාලාව එයට දෙන වටිනාකමට වඩා පිරිසිදු ගංගාවේ පැවැත්ම මට වටින්නේ නම්, එය දූෂණය නොකිරීම සඳහා කර්මාන්ත ශාලාවට ගෙවීමට මට හැකි ය. එබඳු අවස්ථාවල දී ආණ්ඩුව එයට මැදිහත් වීම අවශ්‍ය නොවේ.

**පොදු භාණ්ඩ**

'වෙළඳ පොළ අසාර්ථකත්වය' ගැන අපගේ අවසන් උදාහරණය පොදු භාණ්ඩයි. ඇතැම් භාණ්ඩ වෙළඳ පොළට සැපයීමට ලාභ උපයන ව්‍යාපාරවලට ඇත්තේ අඩු දිරි ගැන්වීමකි. මෙය සිදුවන්නේ ගෙවීම් නොකරන අය ඉවත් කිරීම කළ නොහැකි වීම සහ භාණ්ඩය පරිභෝජනය මගින් අනෙක් අය භාණ්ඩය පරිභෝජනය නොවළක්වන නිසා ය.

මේ සඳහා සාමාන්‍ය උදාහරණවලට, නීතිය ක්‍රියාත්මක කිරීම, ජාතික ආරක්ෂාව සහ පිරිසිදු වාතය වැනි පාරිසරික භාණ්ඩ ඇතුළත් ය. මෙම පොදු භාණ්ඩ සඳහා ලාභ නම් දිරි ගැන්වීම නොමැති නිසා ආණ්ඩුව විසින් ම ඒවා ලබා දීමට ක්‍රියා නොකරන්නේ නම් ඒවායේ අවසැපයුමක් සිදු විය හැකි ය.

එසේ වුව ද පොදු භාණ්ඩ ලෙස ආණ්ඩුව සපයන බොහෝ දේ අර්ධ වශයෙන් හෝ වෙළඳ පොළ මගින් සැපයිය හැකි ය. උදාහරණ ලෙස, පෞද්ගලික ආරක්ෂක සේවා මගින් නීතිය ක්‍රියාත්මක කිරීම සහ කුලියට ගත් සටන්කරුවන් මගින් ආරක්ෂාව (කුලී හේවායින්) ගත හැකි ය. ගෙවීම් නොකරන අය ඉවත් කිරීම සඳහා ඉඩ ලැබෙන සුදුසු දේපළ අයිතිය ලබා දීමේ නීතී ඇත්නම් ලාභ උපයන ව්‍යාපාර මගින් පාරිසරක භාණ්ඩ පවා සැපයිය හැකි ය. පොදු භාණ්ඩ සැපයීමට ආණ්ඩු දරන උත්සාහයන් ආණ්ඩුවල අසාර්ථක බව පිළිබඳ න්‍යායෙන් හදුනාගත් ප්‍රශ්නවලට ගොදුරු වීමේ හැකියාව තවමත් පවතින බව ද අප අමතක නොකළ යුතු ය.

## වෙළඳ පොළ ප්‍රශ්න විසඳන්නන් ලෙස

ඒකාධිකාර, බාහිර බලපෑම් සහ පොදු භාණ්ඩ සම්බන්ධයෙන් අප කළ කෙටි විමසා බැලීම තුළින් පෙන්නුම් කළේ 'වෙළඳ පොළ අසාර්ථක වීම්' ලෙස පෙනී යන දේ නිවැරදි කිරීමට ආණ්ඩුවේ උත්සාහයන් නිතර ම නොමග යන සුලු බවයි. ප්‍රතිපත්ති සම්පාදකයන් වැඩි වශයෙන් විශ්වාස කරන තරම් ඇත්තෙන් ම වෙළඳ පොළ නරක නැත්තේ ඇයි ද යන්න පිළිබඳව ආර්ථික විද්‍යාඥයන් හේතු දක්වා ඇත.

වෙළඳ පොළට එය විසින් ම නිවැරදි වීමට ඇති සැබෑ විභවය මේ දක්වා අපි නොතකා හැරියෙමු. අද අකාර්යක්ෂමතාවයන් හෙට දිනයේ ලාභ ලැබීමේ අවස්ථාවන් ය. මෙම මුලික පරිඥානය නොතකා හැරීම ආණ්ඩුවේ මැදිහත් වීමට පක්ෂපාත වීමකි.

ප්‍රතිපත්ති සම්පාදකයින් ආර්ථිකය දෙස බලන්නේ එක මොහොතක පැතිකඩක් ලෙස වන අතර සොයා බලන්නේ ඔහුගේ හෝ ඇගේ පරිපූර්ණ නිර්ණායක වෙළඳ පොළ මගින් ඉටු වී තිබේ ද යන්නයි. ඒ වෙනුවට ආර්ථිකය දෙස බැලිය යුතු වන්නේ කාලයත් සමග දිග හැරෙන චලනය වන සිතුවමක් වශයෙනි. වෙනත් වචනවලින් කිවහොත්, එය චලනය වෙමින් පවතින සහ පරමාදර්ශී තත්ත්වයට පත් නොවූ නමුත් ප්‍රශ්න විසදන සහ තත්ත්වය වර්ධනය කරන ව්‍යවසායකත්ව ක්‍රියාකාරකම් වශයෙනි.

බොහෝ ආර්ථික විද්‍යාඥයන් හා දේශපාලන විද්‍යාඥයන් විසින් ආණ්ඩුවේ විසඳුම් සම්බන්ධයෙන් ප්‍රයෝගික විවේචන මාලාවක් සංවිධානය කොට ඇත. රෝම අධිරාජ්‍යයා පිළිබඳ අපේ කතාවෙන් පයින් ගසන්නේ මෙතනටයි. දේශපාලනයේ දී තෝරා ගැනීම් සැබවින් ම කරන ආකාරය විමසා බැලීමේ දී පෙනෙන්නේ අප දෙවන ගායකයාගේ ගායනයට ද සවන්දිය යුතු බවයි. අප එසේ කළ යුතු වන්නේ වෙළඳ පොළ ආර්ථිකයක දී තීරණ ගැනීම සඳහා  යොදා ගන්නා එම මුලධර්ම ම භාවිතා කරමිනි. පර්යේෂණවල මෙම අංශය හඳුන්වනු ලබන්නේ මහජන තේරීම් වශයෙනි.

## ආණ්ඩුවේ අසාර්ථකත්වයට හේතු

දේශපාලන තීරණ ගැනීම සම්බන්ධයෙන් ආර්ථික විග්‍රහයන්හි දී උපකල්පනය කරන්නේ, ආණ්ඩුවේ ඇතුළේ  සිටියත්, පිටත සිටියත් මහජනයා මූලික වශයෙන් හැසිරෙන්නේ එකම ආකාරයකට බව යි. ඡන්දපොළවල සහ කොන්ග්‍රසයේ හෝ පාර්ලිමේන්තුවේ සභාවක සිටින්නේ සහ සිල්ලර වෙළඳසලක හෝ සමාගම් අධ්‍යක්ෂ  මණ්ඩල කාමරයක හෝ සිටින්නේ එක ම පිරිසකි.

මේ පුද්ගලයින් සම්පූර්ණ පවුකාරයින් නොවන අතර සම්පූර්ණ ශාන්තුවරයන් ද නොවේ. ඒ අය ඔබ සහ මා වගේ ම අයයි. ඔවුන්ට අරමුණු සහ සැලසුම් ඇති අතර ඔවුන්ගේ අරමුණු හා සැලසුම් හැකි තාක් ඵලදායි ලෙස සාර්ථක කර ගැනීමට ඔවුහු තමන්ට ඇති සම්පත් භාවිතා කරති.

දේශපාලනයේ දී අපට දෙපැත්තක් ඇත. එනම් ආණ්ඩුවේ සේවා ඉල්ලුම්කරුවන් (ඡන්දදායකයින්) සේම සේවා සපයන්නන් (දේශපාලනඥයන්) වශයෙනි. දේශපාලනය පරිපූර්ණ ලෙස සිදුවන්නේ නම්, එවිට ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති මගින් ඡන්දදායකයන්ගේ බලාපොරොත්තු හරියට ම පිළිබිඹු විය යුතු ය. වෙනත් ආකාරයකින් කිවහොත්, ඡන්දදායකයන්ගේ මනාප දේශපාලන ක්‍රියාකාරීත්වය තුළට ඇතුළත් කළ  යුතු වන අතර අනෙක් පැත්තෙන් එළියට එන ප්‍රතිපත්ති මගින් එදාට තිබෙන ජනප්‍රිය මනාපය පිළිබිඹු විය යුතු ය. එවිට අප කැමති ආණ්ඩුව අපට ලැබෙයි.

දේශපාලනය ගැන මෙම සරල දැක්මෙන් යථාර්ථය පැහැදිලි වන්නේ නැත. එබඳු පරමාදර්ශී තත්ත්වයකට පත් වන්නට අපගේ ආණ්ඩුවලට නොහැකි වන්නේ ඇයි?

අප දැනටමත් තර්ක කර ඇත්තේ වියදම් (හානි) සහ ප්‍රතිලාභ ගණනය කිරීමට ආණ්ඩුවලට නොහැකි බවටයි. එමෙන් ම ආණ්ඩු ක්‍රියාත්මක වන්නේ වෙළඳ පොළ මිල ගණන් මගින් ලබා දෙන වෙලාව හා ස්ථානය ගැන සහ ලාභ හා පාඩු මගින් ඇති කරන විනය ගැන අවබෝධයකින් තොරව ය. මූලික මට්ටමක දී, වෙළඳ පොළට කරන ප්‍රතිපත්තිමය මැදිහත් වීම් පවතින්නේ අඳුරේ අතපත ගෑමක් වශයෙනි. විශේෂ වාසි සොයා යන පීඩන කණ්ඩායම් දේශපාලන තීරණ ගැනීමේ දී කරන බලපෑම ගැන ද අපි යන්තම් සඳහන් කිරීමක් කළෙමු. දැන් අපි එය ටිකක් විමසා බලමු.

## ඡන්දදායකයන් හා වාසි සොයන කණ්ඩායම්

ඡන්දය සොයන ව්‍යවසායකයින් ලෙස දේශපාලනඥයන් දෙස ප්‍රයෝජනවත් ලෙස බැලිය හැකි ය. අර්ථ දැක්වීම අනුව දේශපාලනඥයන්ට අවශ්‍ය වන්නේ ඡන්ද සහ තම මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයට ගෙවීමට මුදල් ය. ඔහුට මෙම ඡන්ද හා දායකත්වයන් ලබා ගත නොහැකි වුවහොත් ඔහුට තේරී පත්විය නොහැකි වෙයි.

ඡන්දයක් එන විට දේශපාලනඥයන් උත්සාහ දරන්නේ ඡන්දදායකයන්ගේ සහය ලබා ගැනීමටයි. මෙය කිරීම සඳහා ඔවුන් කෙටි කාලීන ප්‍රතිලාභ ගැනත් වියදම් දිගු කාලයකට පැතිරීමටත් අවධානය යොමු කරනු ඇත. උදාහරණයක් ලෙස, මැතිවරණයට පෙර ජනප්‍රිය ව්‍යපෘති සඳහා ආණ්ඩුවේ වියදම් වැඩි කිරීමට ඔවුන් ක්‍රියා කරනු ඇත්තේ එහි ප්‍රතිඵලය වන්නේ දිගු කාලීන ලෙස බදු වැඩි කිරීම බව නොතකා ය.

දේශපාලනඥයන් දන්නා දෙයක් නම් බොහෝ ඡන්දදායකයන් ඡන්දය ගැන කරදර නොවන බව හා දේශපාලන ප්‍රශ්න ගැන වැඩියෙන් ඉගෙනීමට කාලය යෙදවීම වැදගත් බව බොහෝ ඡන්දදායකයින් නොසිතන බවයි. මෙම අසංවිධානාත්මක කණ්ඩායම්වලට වෙනස්ව විශේෂිත ප්‍රශ්නයක් ගැන දන්නා සහ විශාල අවධානයක් යොමු කරන විශේෂ වාසි සොයන ඡන්දදායක පිරිසක් ද වෙති.

අඩු දැනුමක් ඇති ඡන්දදායක විශාල පිරිසට හෝ කොහොමටත් ඡන්දය නොදෙන පිරිසට අවධානය යොමු කිරීමට තම ශක්තිය යෙදවීමෙන් එතරම් පලක් නොවන බව දේශපාලනඥයෝ දනිති. හොඳින් සංවිධිත හා හොඳින් තොරතුරු දත් විශේෂ වාසි සොයන කණ්ඩායම්වල ප්‍රතිලාභ ගැන අවධානය යොමු කරමින් අන් සියලු දෙනා මත වියදම පැටවීමෙන් ඔවුන්ට වැඩි ම ප්‍රතිලාභ ලැබිය හැකි ය.

දේශපාලනයේ අසාර්ථක වීමට හේතු දෙකක් අපි දැන් හඳුනා ගනිමු. එනම් දේශපාලනඥයන්ගේ ළඟ බැලීමේ නැඹුරුව හා පුළුල් ජනතාවගේ පුළුල් වුවමනාවන්ට හානි කරමින් විශේෂ වාසි සොයන කණ්ඩායම්වල ප්‍රතිලාභ ගැන අවධානය යොමු කිරීමත් ය. නමුත් එය ඊටත් නරක ය.

තමන් කැමති ප්‍රතිපත්ති සම්මත කර ගැනීම සඳහා උත්සාහ කිරීමට මෙම විශේෂ වාසි සොයන කණ්ඩායම් බොහෝ විට විශාල සම්පත් ප්‍රමාණයක් භාවිත කරයි. දේශපාලනඥයන්ට බලපෑම් කිරීමේ උත්සාහය සඳහා ඔවුන් විශාල කාලයක් සහ ධනයක් වැය කිරීමට ඉඩ ඇත. මෙය හඳුන්වනු ලබන්නේ 'කුලී ඉල්ලීම' වශයෙනි. තමන්ගේ ම හැසිරීම් සම්බන්ධයෙන් වන ආණ්ඩුවේ ඕනෑ ම නීතියක් තමන්ගේ පාලනය යටතට ගැනීම සහතික කර ගැනීම සඳහා ඔවුන් උත්සහ දරනු ඇත. මෙය බොහෝ විට හඳුන්වනු ලබන්නේ නීති සම්බන්ධයෙන් 'අල්ලා ගැනීමේ න්‍යාය' වශයෙනි.

විශේෂ සැලකීම් සඳහා විශේෂ වාසි සොයන කණ්ඩායම් කරන මෙබඳු මෙහෙයුම් ආර්ථික විද්‍යාඥයන් හඳුන්වන්නේ මහා බර (deadweight) හානියක් වශයෙනි. සමස්තයක් ලෙස එයින් කිසිදු වටිනාකමක් නිපදවන්නේ නැත. එමගින් සම්පත් වියදම් කරන්නේ අන් අය වෙතින් සම්පත් ඉවත් කර ගැනීම සඳහා පමණකි.

**දේශපාලනයට එරෙහිව වෙළඳ පොළ**

ආර්ථික ප්‍රශ්න නිවැරදි කිරීමට ආණ්ඩු අසමත් වීමට තවත් හේතුවක් වන්නේ දේශපාලන භාණ්ඩවල ස්වභාවය වෙළඳ පොළ භාණ්ඩවලට වඩා වෙනස් වීමයි. වෙළඳ පොළ ආර්ථිකයක දී අපට වෙන වෙන ම භාණ්ඩ මිලදී ගත හැකි ය. නිල් කමිසයක්, කාකි කලිසමක්, රතු ඇඩම් ස්මිත් කර පටියක්, සහ නිල් බ්ලේසරයක් (ආර්ථික විද්‍යාඥයන්ගේ නිල ඇඳුම) අපට මිලදී ගත හැකි ය.

දේශපාලනයේ දී අපට බල කෙරෙන්නේ භාණ්ඩ මිටියක් මිලදී ගැනීමට ය. අප එක් දේශපාලනඥයකුගේ සෞඛ්‍ය ප්‍රතිපත්තියට කැමති විය හැකි ය. නමුත් වෙනත් අයකුගේ විදෙස් ප්‍රතිපත්තියට කැමති විය හැකි ය. මෙම භාණ්ඩ වෙන වෙන ම තොරා ගැනීමේ හැකියාවක් අපට නැත. මේ නිසා ඡන්දදායකයන්ගේ මනාපය හා ආණ්ඩුවේ ප්‍රතිපත්ති අතර තවත් විශාල වෙනස්කම් ඇති කරයි.

වෙළඳ පොළ ආර්ථිකයක ඇති බලගතු ලක්ෂණයක් වන්නේ, ව්‍යාපාරයක් විසින් පාරිභෝගික ඉල්ලුම තෘප්තිමත් නොකරන්නේ නම්, එයට එම ප්‍රතිචාරය ක්ෂණිකව ලැබෙයි. එයට කරන දේ වෙනස් කරන්නට හෝ එසේ නැත්නම් බංකොලොත් ලබන්නට හෝ සිදු වෙයි. වෙළඳ පොළ එයට සහභාගී වන්නන් විනය ගත කරයි. ලාභ හා පාඩු පිළිබඳ ක්‍රමයක් වන වෙළඳ පොළ ආර්ථිකයක් තුළ එහි ක්‍රියාකාරීත්වය සඳහා පාඩු යන සාධකය ඉතා වැදගත් වෙයි.

ලාභ හා පාඩු යාන්ත්‍රණයක් මගින් විනයගත වනවා වෙනුවට දේශපාලනඥයන් විනයගත වන්නේ ඡන්දපොළෙනි. එසේ වුව ද ඡන්දපොළ සෙමින් ක්‍රියාත්මක වන අතර නොපැහැදිලි ය. මෙය මැනිය හැකි එක් මිම්මක් නම් නැවත පත් වන දේශපාලනඥයන්ගේ ඉහළ ප්‍රතිශතයයි. දේශපාලනඥයන්ගේ පිරිවැටුම ව්‍යාපාරවලට වඩා ඉතා අඩු ය.

මහජන තේරීම යන විග්‍රහයෙන් හෙළිදරවු වන ආණ්ඩුවේ අසාර්ථක වීම් ගැන තවත් බොහෝ උදාහරණ ගැන අපට කතා කළ හැකි ය. අපගේ ප්‍රයෝජනය සඳහා, ආණ්ඩුවේ අසාර්ථක වීම් ගැන ප්‍රධාන කරුණු තුනක් අපි හඳුනා ගනිමු.

- මුල්‍යමය වශයෙන් පාඩු සහ ප්‍රතිලාභ සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති ගණනය කිරීමේ නොහැකියාව
- ලාභ හා පාඩු නොමැති වීම හේතුවෙන් ඉල්ලුමට ප්‍රතිචාර දැක්වීමක් නොමැති වීම
- අසංවිධානාත්මකව සහ තොරතුරු නොදැන සිටින ඡන්දදායක විශාල සංඛ්‍යාවකට හානි කරමින් ප්‍රතිලාභ ලබා ගන්නා විශේෂ වාසි සොයන පීඩන කණ්ඩායම්වල බලපෑම

## වෙළඳ පොළට ක්‍රියාත්මක වීමට ඉඩ දෙන්න

පරමාදර්ශී තත්ත්වයට ළඟා වීමට වෙළඳ පොළවල් අසමත් විය හැකි ය. එසේ වුව ද අප ස්වයංක්‍රීයව ආණ්ඩුව වෙත හැරිය යුතු බව එයින් අදහස් වන්නේ නැත. ඒ වෙනුවට 'දෙවන ගායකයාට ද ගායනයට ඉඩ දෙන්න' යන උපදේශය පිළිපැද්ද විට අපට බොහෝ විට පෙනී යන්නේ ආණ්ඩුවේ මෙහෙයවීම යන විකල්පය මගින් තත්ත්වය වඩාත් නරක් කරන බවයි.

අප ජීවත් වන්නේ පරිපූර්ණ විසඳුම් බලාපොරොත්තු විය නොහැකි ලෝකයක ය. සමාජ ක්‍රම අතර තෝරා ගැනීමක් කරන විට, අපට හැම විට ම කටයුතු කරන්නට සිදු වන්නේ වැරදි ව්‍යවසායකයන් (වෙළඳ පොළ) හා අවුල් සහගත නිලධාරීන් (ආණ්ඩුව) අතර ය. වෙළඳ පොළවල් අසාර්ථක වනවා මෙන් ම ආණ්ඩු ද අසාර්ථක වෙයි. එසේ වුව ද, වෙළඳ පොළ අසාර්ථක වීමට වඩා හානිකර වන්නේ ආණ්ඩුව අසාර්ථක වීම බව විශ්වාස කිරීමට අපට හොඳ හේතු ඇත.

දෙවැනි ගායකයාට ගායනයට ඉඩ දීම පමණක් නොව, පළමුවෙන් ඇති වන හැඟීම මත කිසි ම එක් ගායකයකු ගැන තීරණ නොගැනීමට ද අපි පරිස්සම් විය යුත්තෙමු. ඒ වෙනුවට අප කළ යුතු වන්නේ වෙනස් වන තත්ත්වයන්ට අනුගත වීමට වෙළඳ පොළට ඇති හැකියාව දෙස බැලීමයි. දේශපාලනයට වඩා වෙනස්ව වෙළඳ පොළේ දී අද ප්‍රශ්නවලින් නියෝජනය වන්නේ හෙට ඇති වන ලාභ ලැබීමේ අවස්ථාවනය. වෙනත් අවස්ථාවන් වචනවලින් කිවහොත්, වෙළඳ පොළවල් අසාර්ථක වෙයි. අසාර්ථක වීම විසඳීමට වෙළඳ පොළ අසාර්ථක වීම විසඳීමට යොදා ගන්න.

**වැඩිදුර කියැවීම්**

*Boettke" Peter J'" Paul Heyne" David L' Prychitko ^2009& The Economic Way of Thinking ^12th edition&" New Jersey( Prentice Hall'*

*Mitchell" William C' and Randy T' Simmons ^1994& Beyond Politics( Markets" Welfare" and the Failure of Bureaucracy" Colorado( Westview Press'*

*Wagner" Richard E' ^1989& To Promote the General Welfare( Market Processes Vs' Political Transfers" San Francisco( Pacific Research Institute'*

*Friedman" Milton and Rose Friedman ^1990& Free to Choose" New York( Harvest Books'*

*Hayek" Friedrich A' ^2007& The Road To Serfdom( Text and Documents - The Definitive Edition" Chicago( University Of Chicago Press'*

*Hazlitt" Henry ^1988& Economics in One Lesson( The Shortest and Surest Way to Understand Basic Economics" New York( Three Rivers Press'*

# 7

# ලිංගිකත්වය, මත්ද්‍රව්‍ය සහ නිදහස: ආණ්ඩුවේ තහනම්වලට එරෙහිව කරුණු දැක්වීම

# ලිංගිකත්වය, මත්ද්‍රව්‍ය සහ නිදහස: ආණ්ඩුවේ තහනම්වලට එරෙහිව කරුණු දැක්වීම

ජෝන් මෙඩෝක්රෝෆ්ට් විසිනි

එක් සැන්දෑවක ඔබ රාත්‍රී ආහාරය සඳහා වාඩි වී සිටිනවා යයි සිතන්න. ඔබ වයින් බෝතලයක් විවෘත කරන විට දොරට තට්ටු කරන හඬක් ඇසිනි. ඔබ දොර ඇරිය විට දුටුවේ ඔබගේ අසල්වැසියන් එළියේ සිටගෙන සිටින බවයි. ඔබ තවදුරටත් මත්පැන් බීම නොකළ යුතු බව ඔවුන් තීරණය කළේ යයි ඔවුහු ඔබට කියති. ඔබගේ වයින් රාජ සන්තක කරන ඔවුන් ඔබට කියන්නේ ඔබ නැවත බිව්වොත් ඔබට දඩ ගසන බව සහ සමහරවිට ඔබව සිර ගත කරන්නටත් ඉඩ ඇති බවයි.

බොහෝ දෙනා සිතන්නේ එබඳු හැසිරීමක් කෝපයට හේතු වන බවයි. අප මත්පැන් නොබී සිටිය යුතු බව අපට කියන්නට අපේ අසල්වැසියන්ට ඇති අයිතිය කුමක් ද ? එසේ වුව ද, යම් යම් දේ තහනම් කිරීමට ආණ්ඩු ක්‍රියා කළ විට ද, හරියට ම සිදු වන්නේ මෙයයි. මත්පැන්, දුම්කොළ හෝ වෙනත් මත්ද්‍රව්‍ය, ගණිකා වෘත්තීය, ඔට්ටු ඇල්ලීම හෝ බොක්සිං හෝ විය හැකි ය. ඇතැම් රටවල මේ සියල්ල තහනම් ය.

ඇතැම් අය කියනු ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදී ඡන්දයක ප්‍රතිඵලයක් ලෙස කරන්නේ නම් ආණ්ඩුවල තහනම් සාධාරණ බවයි. එසේ වුව ද, එබඳු ඡන්දයක් යනු, අප මුලින් ඉදිරිපත් කළ උදාහරණයේ පෙන් වූ පරිදි ම මහජනයා කළ යුත්තේ හා නොකළ යුත්තේ කුමක් දැයි ඔවුන්ගේ අසල්වැසියා ඔවුන්ට කීමට වැඩි දෙයක් නොවේ.

යම් යම් දේ තහනම් කිරීමේ නීති පුළුල් ලෙස පැතිරී ඇත. එම කටයුතුවලින් අන් අයට හානියක් සිදු නොවුව ද, ලෝකය පුරා ආණ්ඩු මහජනයාට කිරීමට අවශ්‍ය දේ කිරීමෙන් ඔවුන් වළක්වති. මෙම පරිච්ඡේදයෙන් කරන්නේ ආණ්ඩු යම් යම් දේ තහනම් කිරීම හරි ද? යන්න විමසා බැලීම හා ආණ්ඩු තහනම් හඳුන්වා දීමෙන් පසු ඇති වන ප්‍රතිවිපාක ගැන සොයා බැලීමයි.

## හානිය පිළිබඳ මූලධර්මය

සාමාන්‍යයෙන් තර්ක කරන්නේ යම් යම් දේ තහනම් කිරීම අවශ්‍ය වන්නේ හානි වළක්වා ගැනීම සඳහා බවයි. එනම් වෙනත් අයට සිදු වන හානි හෝ තහනමට ලක් කරන්නට යන ක්‍රියාවේ යෙදෙන තැනැත්තාට සිදු විය හැකි හානියයි. උදාහරණ ලෙස බොහෝ රටවල ගංජා, එක්ස්ටසි සහ කොකේන් තහනම් කොට ඇත්තේ භාවිතා කරන්නන්ට හා අන් අයට සිදු වන හානි වැළැක්වීම සඳහාය. ඇතැම් රටවල බොක්සිං තහනම් කොට ඇත්තේ ක්‍රීඩකයින්ගේ ආරක්ෂාව සඳහා ය. එක්සත් ජනපදයේ 1920 සිට 1933 දක්වා කාලයේ මත්පැන් තහනම් කොට තිබුණේ මත්පැන්වල ඇතැයි සිතූ නපුරේ හානියෙන් බොන අය සහ අනෙක් අය ආරක්ෂා කර ගැනීමට ය.

ස්වයං හානි වැළැක්වීමට තහනම් කිරීම 'හානි පිළිබඳ මූලධර්මය' ලෙස දන්නා අදහස බිඳ දමයි. 'හානිය පිළිබඳ මූලධර්මය' නම් අදහස මතු වන්නේ ජෝන් ස්ටුවර්ට් මිල් නම් නිදහස්වාදී දාර්ශනවාදියා 1859 දී ලියූ නිදහස ගැන (on liberty) නම් රචනාවෙනි. මිල් තර්ක කළේ නිදහස් සමාජයක ජනයා, ඔවුන් ඇතැම් විට තමන්ට ම හානි කර ගත්ත ද, ඔවුන් වෙනත් ජනයාට හානි සිදු නොකරන තාක් කල්, ඔවුන්ට කැමති දෙයක් කිරීමට නිදහස තිබිය යුතු බවයි. උදාහරණයක් ලෙස මෙයින් අදහස් වන්නේ, කෙනෙකුට ගංජා හෝ මත්පැන් හෝ ගැනීමට අවශ්‍ය වන්නේ නම්, ඔවුන් භෞතික වශයෙන් නැවැත්වීම අපට කළ නොහැකි බවයි. (එනමුත් එසේ නොකරන ලෙස ඔවුන්ට ඒත්තු ගැන්වීම අපට කළ හැකි ය.)

යම් කිසිවකුට කරන්නට අවශ්‍ය දෙයකින් ඔවුන් වැළැක්වීමට භෞතික වශයෙන් අප ක්‍රියා කරන්නේ නම් එයින් අදහස් වන්නේ එම ක්‍රියාව කුමක්දැයි ඔවුන් දන්නවාට වඩා හොඳින් අප දන්නා බවයි. ප්‍රශ්නය වන්නේ මෙම තර්ක ක්‍රමය යොදාගෙන ඕනෑ

ම දෙයක් තහනම් කිරීමට හැකි වීමයි. ස්වයං හානිකර බව වෙනත් අය හිතන දෙය කිරීමෙන් මහජනයා වැළැක්වීම දුම්බීම, තෙල් සහිත ආහාර ගැනීම හෝ වීඩියෝ ක්‍රීඩා කරමින් විශාල කාලයක් ගත කිරීම ආදී සියල්ල තහනම් කළ හැකි ය.

අවයන් හානිකර බව අප සිතන දේ කිරීමෙන් මහජනයා වැළැක්වීමට අප භෞතික වශයෙන් ක්‍රියා කරන්නේ නම්, ඉතා ඉක්මනින් අප තවදුරටත් නිදහස් සමාජයක ජීවත් නොවන තත්ත්වයකට පත් වනු ඇත. ඒ වෙනුවට අප සිටිනු ඇත්තේ ආණ්ඩුව විසින් බොහෝ දේ තහනම් කොට හෝ සීමා කොට ඇති සමාජයක ය. මෙය දෘඪ හා රෙජිමේන්තුගත සමාජයක් වනු ඇති අතර එහි ජීවත් වීම එතරම් ප්‍රීතිදායක නොවනු ඇත.

## තහනම් කිරීමේ ප්‍රතිවිපාක

තහනම් කිරීම් මගින් දේවල් ඉතා ස්වල්පයකට පමණක් ඉඩ ලැබෙන නිදහස් නොවූ සමාජයක් ගොඩ නැගෙනවාට අමතරව තහනම් කිරීම මගින් අනිටු ප්‍රතිවිපාක රාශියක් ද ඇති වෙයි.

## තහනම් මගින් වෙළඳ පොළ අපරාධකාරයින් අතට භාර දෙයි.

යම් යම් දේ තහනම් කොට ඇති සැමවිට ම ඒවා නීති විරෝධී ලෙස සපයමින් ලාභ ගැනීමට අපරාධකාරී සංවිධාන උත්සා දරති. භාණ්ඩයක නිෂ්පාදන වියදම හා අවසන් විකුණුම් මිල අතර පරතරය තහනම මගින් වැඩි කරන අතර එයින් සිදු වන්නේ භාණ්ඩ හා සේවා නීති විරෝධී ලෙස සැපයීමේ අනතුර භාර ගැනීමට සූදානම් තැනැත්තන්ට අති විශාල ලාභ ලැබීමට හැකියාව ලැබීමයි.

උදාහරණයක් ලෙස එක්සත් ජනපදයේ මත්පැන් තහනම පැවති කාලයේ මත්පැන් හා නීති විරෝධී මත්පැන් පානය සඳහා ස්ථාන සැපයීමෙන් අති විශාල මුදලක් උපාය ගැනීමට අපරාධ කල්ලිවලට අවස්ථාව ලැබිණි. ප්‍රතිඵලයක් වශයෙන්, කල්ලි නායක අල් කැපෝන් වැනි බොහෝ අපරාධකරුවන් මෙම කාලයේ දී විශාල ධනවත්තු බවට පත් වූහ.

මත්පැන් තහනම 1933 දී ඉවත් කිරීමෙන් පසු සංවිධානාත්මක අපරාධකරුවෝ කොකේන් වැනි ඉතිරි තහනම් මත්ද්‍රව්‍ය වලට යොමු වූහ. එයින් නැවතත් අති විශාල ලෙස මුදල් උපයන්නට විය. 1989 දී ෆෝබ්ස් සඟරාව සඳහන් කළේ කොලොම්බියාවේ මත්ද්‍රව්‍ය ජාවාරම්කාර පැබ්ලෝ එස්කොබා ලෝකයේ හත්වන ප්‍රධාන ධනපතියා බවයි. ඔවුන් ඇස්තමේන්තු කොට තිබුණේ ඔහුගේ මත්ද්‍රව්‍ය ජාවාරම් ජාලයේ වාර්ෂික අදායම ඩොලර් බිලියන 80ක් බවයි.

## දැනටමත් අනතුරුදායක ක්‍රියාකාරකම්වල අනතුර තහනම් කිරීමෙන් ඉහළ යයි

තහනම් භාණ්ඩ හා සේවා සැපයීම නීති විරෝධී වෙළඳ පොළට විතැන්වීම නිසා දැනටමත් අනතුරුදායක ක්‍රියාකාරකම්වල අනතුර තහනම් කිරීම නිසා වැඩි වෙයි. උදාහරණයක් ලෙස, මත්ද්‍රව්‍ය අපරාධයක් ලෙස සැලකීමෙන් එච්.අයි.වී. හෙවත් ඒඩ්ස් පැතිරීම වැඩි වී ඇත. කෙනෙකු නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිත කරන්නකු බවට අන් අයගේ අවධානයට ලක් නොවී පිරිසිදු කටු ලබා ගැනීම ඉතා දුෂ්කර නිසා භාවිත කරන්නෝ කිලුටු කටු නැවත නැවත භාවිතා කරති.

ඊටත් වඩා, අධි මාත්‍රාවක් ගැනීමට සහ විෂ වීමට ඉඩ ඇති පරිදි පිරිසිදු බව හෝ හරියට ම ඇති ප්‍රමාණය නොදැන මිලදී ගැනීමට භාවිත කරන්නන්ට සිදු වන නිසා කොකේන් සහ හෙරොයින් වැනි මත්ද්‍රව්‍ය තහනම් කිරීමෙන් මත්ද්‍රව්‍ය භාවිතයේ අනතුරුදායක බව වැඩි කරයි.

## තහනම නැති විට අපරාධකරුවන් නොවන තැනැත්තන් ද තහනම නිසා අපරාධකරුවෝ බවට පත් වෙති

තහනම් කිරීම් මගින් 'සම්මුතික අපරාධ' ලෙස හඳුන්වනු ලබන අපරාධ වර්ගය ඇති කරයි. එනම් එම අපරාධකාරී ක්‍රියාවට සම්බන්ධ සියලු දෙනාට ම එයට සම්බන්ධ වීමේ අවශ්‍යතාවය ඇති නිසා සැබෑ වින්දිතයකු නැති වර්ගයේ අපරාධයි. වෙනත් තත්ත්ව යටතේ නීතිගරුක පුරවැසියෝ ද මෙමගින් අපරාධකරුවෝ බවට පත් වෙති. උදාහරණයක් ලෙස හෙට මත්පැන් තහනම් කළහොත්, බඳුනක් යට හෝ තම වයින් තබා ගැනීමට හදන හෝ තම බියර් බෝතලය ශීතකරණය පිටුපස සැඟ වීමට හෝ උත්සාහ දරන ඕනෑ ම කෙනෙක් නිරායාසයෙන් ම අපරාධකාරයෙක් බවට පත් වෙයි.

සාමාන්‍ය තත්ත්වයේ දී නීතිගරුක පුරවැසියන්ව සිටින ජනයා අපරාධකරුවන් කිරීමේ බලපෑම සම්පූර්ණයෙන් ම මත්ද්‍රව්‍ය සම්බන්ධ ප්‍රචණ්ඩ නොවූ වැරදි සඳහා ඇමෙරිකානු සිරගෙවල්වල සිටින දහස් ගණනක් ජනයාගෙන් පෙනී යයි. මෙලෙස දඬුවම් ලබා සිටින වැඩි දෙනා තරුණයින් වන අතර හොඳ රැකියාවක යෙදීමට ඔවුන්ට ඇති අවස්ථාවන්ට දරුණු ලෙස හානි වී ඇත්තේ ඔවුන් සිරගතව සිටීම හේතුවෙනි.

**මහජනයාට හානිකර හැසිරීම්වලින් ඉවතට නීතිය ක්‍රියාත්මක කිරීමේ සම්පත් හරවා යැවීමට තහනම් හේතු වෙයි.**

ඕනෑ ම තහනමක් ක්‍රියාත්මක කිරීම වියදම් සහිත ය. නීති විරෝධී ක්‍රියාකාරකම්වල යෙදෙන උදවිය හඳුනා ගැනීම, අත් අඩංගුවට ගැනීම, නඩු පැවරීම, සහ දඬුවම් කිරීම යන සියල්ලට මුදල් වියදම් කළ යුතු ය. උදාහරණයක් ලෙස, 2006 දී, එක්සත් ජනපද මත්ද්‍රව්‍ය නීති බලාත්මක කිරීමේ පරිපාලනයේ වාර්ෂික වියදම ඩොලර් බිලියන 2.4කි. තහනම් මගින් සිදු වන්නේ එය නැති විට තිබෙනවාට වඩා ආණ්ඩු විශාල වීම හා එය නැති විට දීට වඩා බදු ඉහළ යාමයි.

තහනම් මගින් සමාජය මත අවස්ථා වියදමක් පටවයි. එනම් තහනම ක්‍රියාත්මක කිරීමට කළ වියදම වෙනත් කටයුත්තක් සඳහා යෙදවුවේ නම් නිෂ්පාදනය කළ හැකි වන භාණ්ඩ හා සේවා ප්‍රමාණයයි. උදාහරණයක් ලෙස බොහෝ මත්ද්‍රව්‍ය තහනම් කිරීම නිසා දැනට නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදවන මුදලින් විශාල ප්‍රමාණයක් වැය වන්නේ සම්මුතික අපරාධ වැළැක්වීමට හා ඒවාට දඬුවම් දීම සඳහා ය. මෙය ද අවස්ථා වියදමක් වන්නේ මෙම මුදල් සැබෑ වින්දිතයන් සිටින මිනීමැරුම් හෝ සොරකම් වැනි අපරාධ වැළැක්වීම සඳහා යොදාගත හැකිව තිබූ නිසා ය,

**තහනම් කිරීම් මගින් මහජන නොදැනුවත්කම වැඩි කරයි**

සමහරුන් කියන්නේ බොහෝ දෙනාට තමන්ගේ ක්‍රියාවන්ගේ ප්‍රතිවිපාක ගැන සම්පූර්ණ අවබෝධයක් නැති නිසා තහනම් අවශ්‍ය බවයි. නමුත් මෙම තර්කය දෝෂ සහිත වන්නේ තහනම්වල ස්වභාවය විසින් ම මහජනයාගේ නොදැනුවත් භාවය වැඩි කරන නිසා ය. උදාහරණයක් ලෙස බොක්සිං නීති විරෝධී කොට ඇති තැන්වල නීතියට පිටින් සටන්වල යෙදෙන ජනයාට බොක්සිංවල ඇති අනතුර ගැන විශ්වාස කළ හැකි තොරතුරු ලබා ගැනීමට තිබෙන අවස්ථා අඩු ය.

**තහනම් කිරීම් සම්පූර්ණයෙන් ම පාහේ ක්‍රියාත්මක නොවන අතර හැමවිට ම වාගේ සිදුවන්නේ අපේක්ෂිත  ප්‍රතිඵලයට ප්‍රතිවිරුද්ධ දේ සිදු වීමයි**

තහනම් සාර්ථක වන්නේ නම් ඉහත සඳහන් කළ වියදම් සියල්ල වටිනා බව සිතිය හැකි ය. එසේ වුව ද සාක්ෂි මගින් පෙනී යන්නේ තහනම් සාර්ථක වන්නේ කලාතුරකින් බව හා සාමාන්‍යයෙන් ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵල ලබාදෙන බවයි.

විනෝදාත්මක මත්ද්‍රව්‍ය තහනම හොඳ උදාහරණයකි. එක්සත් ජනපදයේ 1937 සිට ගංජා තහනම් කොට ඇත. ඕලන්දයේ 1970 සිට එයට ඉඩ ලබා දී ඇති අතර අද වන විට බලපත්‍ර ලත් කෝපි වෙළඳසල්වලින් ඒවා නිදහසේ මිල දී ගත හැකි ය. 1997 වන විට එක්සත් ජනපදයේ වයස අවුරුදු 12 හෝ ඊට වැඩි ජනගහනයෙන් 33%ක් තම ජීවිත කාලය තුළ ගංජා පාවිච්චි කොට ඇත. ඊට ප්‍රතිවිරුද්ධ ලෙස ඕලන්දයේ වයස අවුරුදු 12 හෝ ඊට වැඩි ජනගහනය අතරින් තම ජීවිත කාලය තුළ ගංජා පාවිච්චි කොට ඇති සංඛ්‍යාව 16%කි.  ඉහළ  වයස් කාණ්ඩ පරීක්ෂා කරන විට මෙම වෙනස අඩු වුව ද, සාක්ෂි මගින් පෙනී යන්නේ එක්සත් ජනපදයේ ගංජා භාවිතය ඕලන්දයට වඩා වැඩි බවයි.
ප්‍රචණ්ඩ අපරාධ මර්දනය කිරීමේ දී පිස්තෝල හා අනෙක් ගිනි අවි තහනම් කිරීම ද එලෙස ම නිෂ්ඵල ය. උදාහරණයක් ලෙස අයර්ලන්ත සමුහාණ්ඩුව ගිනිඅවි තහනම් කළේ රටේ වසරකට සිදුවන මිනීමැරුම් සංඛ්‍යාව 10කට අඩුව පැවති 1971 දී ය. 1995 සිට වසරකට මිනීමැරුම් 38කට අඩුවෙන් සිදු වූ වසරක් නොවූ අතර 2005 දී  සිදු වූ සම්පූර්ණ මිනීමැරුම් සංඛ්‍යාව 54කි.

රටේ මිනීමැරුම් සංඛ්‍යාව ජනගහනය 100,000කට 10ක්ව පැවති 1974 දී ජැමෙයිකාව තුවක්කු තහනම් කළේ ය . එතැන්  සිට මිනීමැරුම් අනුපාතය දිගින් දිගට ඉහළ  ගිය අතර 1995 සිට එය 100,000කට 31කට වඩා අඩු වුයේ නැත. තුවක්කු පාලනයෙන් ප්‍රචණ්ඩ අපරාධ අඩු වන බවට සාක්ෂි නැත. ඒ වෙනුවට එමගින් සහතික කෙරෙන්නේ තුවක්කු තිබෙන්නේ අපරාධකරුවන් අතේ පමණක් බවයි.

තහනම් හා පාලනයන් හැමවිට ම පාහේ අසාර්ථක වීමට හේතු ගණනාවක් ඇත. එක් හේතුවක් නම් තමන් අවටින් ක්‍රමයක් සොයා ගැනීමට මහජනයා උත්සාහ දැරීමයි. දුම්කොළ සඳහා බදු පැනවීම සිගරට් සොරෙන් ගෙන ඒමට  සහ ව්‍යාජ ලෙස නිපදවීමට

හේතු වෙයි. මත්ද්‍රව්‍ය තහනම් කිරීමේ ප්‍රතිඵලය වන්නේ විශාල නීති විරෝධී සැපයුම් ජාල ඇති වීමයි. ගණිකා වෘත්තීය තහනම් කළ විට අවස්ථාව  උදා වන්නේ 'මසාජ්' හා 'පරිචාරිකා' සේවාවන්ට ය. යම් දෙයක් තහනම් කිරීමට ආණ්ඩුව නීති සම්මත කළ පමණින් ඒවා අහෝසි වීමක් සිදු වන්නේ නැත.

එමෙන් ම, තහනමක් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා යම් මට්ටමක ආණ්ඩුවේ වියදමක් සහ නිදහස් සමාජයක දී පිළිගත නොහැකි ලෙස මහජනයාගේ ජීවිතවලට මැදිහත් වීමක් ද අවශ්‍ය වෙයි. මත්ද්‍රව්‍ය විරෝධී සටන සඳහා එක්සත් ජනපද රජය වසරකට ඩොලර් බිලියන ගණනක් වැය කරන අතර දහස් ගණනක් පුරවැසියෝ සිරගත කෙරෙති. එසේ වුව ද මත්ද්‍රව්‍ය හැම තැනම ලබාගත හැකි ය. ඇමෙරිකාවේ නීති විරෝධී මත්ද්‍රව්‍ය සැපයුමට සැලකිය යුතු බලපෑමක් කිරීම සඳහා ගෙවීමට සිදුවන මිල (වචනයේ සියලුම අර්ථවලින්) සිතා ගැනීමට අපහසු ය.

එමගින් පිළිතුරු සොයන්නේ සමාජ ප්‍රශ්නයක හේතුවට නොව එහි රෝග ලක්ෂණවලට වීම නිසා ද තහනම් අසාර්ථක විය හැකි ය. උදාහරණයක් ලෙස, තුවක්කු පාලනය ප්‍රචණ්ඩ අපරාධවලට විසඳුමක් නොවේ. නීති විරෝධී ලෙස තුවක්කු සපයා ගැනීමට ප්‍රචණ්ඩ අපරාධකරුවන්ට හොඳට ම හැකියාව ඇති අතර පිහි භාවිතයෙන් වැනි වෙනත් ක්‍රමවලින් ද මිනිසුන්ට හානි කිරීමට හෝ මරා  දැමීමට ඔවුන්ට හැකියාව ඇත. ප්‍රචණ්ඩ අපරාධ අඩු කිරීම සඳහාඅපරාධකරුවන් එක් වර්ගයක ආයුධ භාවිතය වැළැක්වීමට උත්සාහ දැරීමට වඩා බුද්ධිමත් ප්‍රවේශයක් අවශ්‍ය වෙයි.

තහනම් මගින් එයින් නවත්වන්නට හදන හැසිරීම ම වර්ධනය කරන බව ද පෙනී ගොස් ඇත. උදාහරණයක් ලෙස එක් ඇමෙරිකානු අධ්‍යයනයකින් පෙන්නුම් කර ඇත්තේ ගැටවරයින්ට සිගරට් විකිණීම සීමා කරමින් ගැටවර වියේ දී දුම්බීම නැවැත්වීමට දැරූ උත්සාහය නිසා එහි හරියට ම ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵලය ඇති වී තිබෙන බවයි. සිගරට් විකිණීම සඳහා සීමා කිරීම් වැඩියෙන් හඳුන්වා දුන් නගරවල ගැටවරයන් අතර දුම්බීම අලුතින් කිසිදු නීතියක් හඳුන්වා නොදුන් නගරවලට වඩා ඉහළ  ගොස් තිබිණි. ගැටවර වියේ මත්පැන් පානය අඩු කිරීම සඳහා සැලසුම් කළ පාලනයන්හි දී මෙන් ම වේග සීමා පහත හෙළා වාහන අනතුරු අඩු කිරීමට උත්සහ කිරීමේ දී  ද මෙබඳු ම ප්‍රතිඵල ලැබී ඇත.

තහනම් මගින් මෙම ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵල ලැබෙන්නේ හරියට ම කුමන හේතුවක් නිසා ද යන්න සම්පූර්ණයෙන් පැහැදිලි නැත. මෙය ඇතැම් විට 'තහනම් පලතුරු බලපෑම' විය හැකි ය. එනම්, තහනම් කර ඇති ක්‍රියාකාරකම්, විශේෂයෙන් ම තරුණ ජනයාට වඩාත් ආකර්ෂණීය වීමයි.

## නිදහස සහ පෞද්ගලික වගකීම්

වෙනත් ජනයාට හානි නොවන සියලු ක්‍රියා නීත්‍යානුකූල විය යුතු බවට වන දර්ශනයට සාක්ෂිවලින් ආධාර සැපයෙයි. මෙයින් අත්‍යවශ්‍යයෙන් ම අදහස් වන්නේ මත්ද්‍රව්‍ය භාවිතය හා ගණිකා වෘත්තීය වැනි ක්‍රියාකාරකම් අප අනුමත කරන බව නොවේ. ඒ වෙනුවට එයින් අදහස් වන්නේ මහජනයා කරන දේ එයින් අන් අයට හානියක් සිදු නොවන තාක් කල් ඔවුන්ගේ පෞද්ගලික තෝරා ගැනීමක් විය යුතු ය යන්න අපගේ විශ්වාසය බවයි.

ජනයා යම් යම් දේ නොකළ යුතු බව විශ්වාස කිරීමත් සමග එම ක්‍රියාකාරකම නීත්‍යානුකූල විය යුතු බව විශ්වාස කිරීම ද සිදු කළ හැකි ය. සරලව එහි අදහස වන්නේ මහජනයාගේ ක්‍රියාවන් අන් අයට හානි නොකරන අවස්ථාවල දී ඔවුන් තමන්ගේ ම සදාචාර තෝරා ගැනීම් සිදු කළ යුතු බව අපගේ විශ්වාසය බවයි.

නිදහසේ මූලධර්මය මත පදනම් වූ නිදහස් සමාජයක් වන්නේ, අප මත්පැන් පානය කළ යුතු ද, දුම්බීම හෝ වෙනත් මත්ද්‍රව්‍ය භාවිතා කළ යුතු ද, ගණිකා වෘත්තියේ, සූදු කෙළියේ හෝ බොක්සිං ක්‍රීඩාවේ යෙදිය යුතු ද කියා තීරණය කිරීමට අන් අයට ඉඩ නොලැබෙන සමාජයකි. ඒ අයුරින් ම එයින් අදහස් වන්නේ අන් අය ගැන තීරණ ගැනීමට අපට ද නොහැකි බවයි. තමන්ගේ ම තොරා ගැනීම් කිරීම එක් එක් තැනැත්තාගේ කාර්යයකි. මහජනයාට වගකීම් පැවරුණු විට, ඔවුන් වගකීමෙන් යුතුව ක්‍රියා කරනු ඇත. නිදහස් සමාජයක පදනම වන්නේ එයයි.

## වැඩිදුර කියැවීම්

*Filley" Dwight ^1999& zForbidden Fruit( When Prohibition Increases the Harm it is Supposed to Reduce'" The Independent Review" 3" 3" 441-51' Online at (http($$www'independent'org$pdf$tir$tir_03_3_filley'pdf*

*Meadowcroft" John ^Ed'& ^2008& Prohibitions" London( Institute of Economic Affairs' ' Online at http($$www'iea'org'uk$record' jsp@ID}429&type}book*

*Mill" John Stuart ^1859$1985& On Liberty" London( Penguin Classics Edition' ' Online at http($$www'bartleby'com$130$*

# 8

# රජය නොමැතිව සුභසාධනය

# රජය නොමැතිව සුභසාධනය

**ක්‍රිස්ටියන් නීමීටිස් විසිනි**

ආණ්ඩුවේ සුභසාධන ක්‍රම ගොඩ නගා ඇත්තේ දුප්පතුන්ට, රෝගීන්ට, වැඩිහිටියන්ට හා රැකියා විරහිතයන්ට ආධාර කිරීම සඳහා ය. දේශපාලනඥයන්ගේ විශ්වාසය වී ඇත්තේ මෙම කණ්ඩායම්වලට සම්පත් මාරු කිරීමෙන් දුප්පත්කම අවසන් වන බව හා සමාජයේ සමානත්වය වැඩි වන බවයි.

නමුත් ඔවුන් වැරදි ය. ආර්ථිකයට මෙන් ම එයින් ආධාර කිරීමට සැලසුම් කොට ඇති අයගේ යන දෙඅංශයෙන් ම ගත් කළ ආණ්ඩුවේ සුභසාධනය විනාශකාරී ය. බටහිර රටවල බදු ඉතා ඉහළ  මට්ටමක පැවතීමට හේතුව එයයි. මුදල්වලින් අඩක් තරම් ප්‍රමාණයක් වියදම් කරන්නේ රජයයි. දිළිඳු බවේ සිරවුණු විශාල  සංඛ්‍යාවක් එම රටවල සිටිති. සෞඛ්‍ය වැනි ක්ෂේත්‍රවල ඇතැම් විට ඉතා අඩු ප්‍රමිතියේ සේවා සපයයි.

**දිළිඳු බවේ උගුල**

සුභසාධන රාජ්‍යයයේ “සමාජ ආරක්ෂණ දැල” ලෙස හඳුන්වන දෙය බොහෝ ජනයා සඳහා මකුළු දැලක් වී ඇත. උදාහරණයක් ලෙස එක්සත් රාජධානියේ වැඩ කිරීමේ හැකියාව ඇති බොහෝ දෙනා  ඇතුළත් දශ ලක්ෂ පහක් වැඩ කරන වයසේ ජනයා වැඩ නොමැතිව සිටීමේ දීමනා ලබති. එම සංඛ්‍යාවෙන් අඩකට වැඩි පිරිසක් වසර ගණනාවක් තිස්සේ මෙය කරති.

සුභසාධන ප්‍රතිලාභ මත දිගු කාලීන ලෙස යැපීම සියලු ම බටහිර රටවල දකින්නට ලැබෙන ප්‍රශ්නයකි. ලන්ඩන්හි හැක්නී, බර්ලින්හි නොව්කොලන් හෝ පැරිසියේ ච්ලිච් - සෝස් - බෝයිස් වැනි ආණ්ඩුවේ නිවාස ක්‍රමවල බොහෝ නිවැසියන් වාසය කරන්නේ සමාන්තර විශ්වයන්හි ය. ඔවුන් සමාජයේ අන් අය සමග ගුරුත්වාකර්ෂණ නියම බෙදා ගන්නා නමුත් සමාජ හා ආර්ථික නීති ඔවුන්ට බලපාන්නේ නැත.

සමාන්තර විශ්වයෙන් පිටත දී ජනයාට තම වැඩ කිරීමේ උත්සාහය දියුණු කරගත හැකි වුවහොත්, සුදුසුකම් වැඩි දියුණු කර ගතහොත්, වැහි දවස් සඳහා මුදල් ඉතිරි කළහොත් සහ සමාජ ජාලය පවත්වා ගෙන ගියහොත්, ඔවුන්ට සාමාන්‍යයෙන් තම ආර්ථික තත්ත්වය වර්ධනය කරගත හැකි වෙයි. මෙම අනෙක් විශ්වය තුළ දී, එම ක්‍රියාකාරකම්වලට දඬුවම් හිමි වෙයි.

සුළු ප්‍රමාණයේ මුදල් ඉපැයීමක් හෝ ඉතිරි කිරීමක් හෝ සුභසාධන ප්‍රතිලාභ ඉවත් කිරීමට හේතුවක් වෙයි. සහකරුවකු සමග එහා මෙහා යාම පවා ගෙවීම් නවතා දැමීමට හේතු විය හැකි ය. සුභසාධන මකුළුවාගේ දැලේ පැටලීම නිසා ජනයාට නැති වන්නේ විධිමත් සුදුසුකම් පමණක් නොවේ. වැඩ කිරීම සමග සම්බන්ධ වූ සමාජ පුරුදු ද නැති වෙයි.

රැකියාවකින් ඉවත්වීම එතරම් කරදරයකින් තොරව කළ හැකි වුව ද, නැවත බැඳීමට එරෙහිව බාධක ගොඩ නගා ඇත. රැකියා නැතිව සිටීමේ ප්‍රතිලාභ බොහෝ විට නුපුහුණු ශ්‍රමිකයකුගේ මට්ටමේ ගෙවීමක් ලබා දෙයි.

සුභසාධන ප්‍රතිලාභ ඉතා පහළ මට්ටමක වන බවට තර්ක කරන අය බලන්නේ මුදලින් කරන ගෙවීම් ගැන පමණකි. නමුත් එය ප්‍රශ්නයෙන් අඩක් පමණකි. සුභසාධන භුක්ති විඳින උදවියට සාමාන්‍යයෙන් වටිනා ප්‍රතිලාභ හිමි වෙයි. එනම් නොමිලේ හෝ අඩු මිලට ලැබෙන නිවාස ආදියයි.

වැඩ කිරීමට සුදානම් අයට ද, ආණ්ඩුව විසින් නිර්මාණය කොට ඇති අති විශාල බාධකවලට මුහුණ දීමට සිදු වෙයි. අවම වැටුප් සහ දැඩි කම්කරු නීති මගින්

කම්කරුවන් බඳවා ගැනීමේ අනතුර සහ වියදම ඉහළ නංවයි. ආණ්ඩුවේ පාලනයන් මෙන් ම ඉහළ බදු, මහජනයාට තමන්ගේ ම ව්‍යාපාර ආරම්භ කිරීම ද ඉතා අමාරු තත්ත්වයට පත් කරයි.

එබැවින් මහජනයා තමන් සඳහා සපයා ගැනීම නවතන සීමා කිරීම් අවසන් කිරීම සඳහා ප්‍රබල හේතු ඇත. මෙහි තෙරුම වන්නේ සුභසාධන ගෙවීම් සඳහා නිදහස් වෙළඳ පොළ විකල්ප හඳුන්වා දීම හා ශ්‍රම බලකායට ඇතුළු වීමට තිබෙන බාධක ඉවත් කිරීමත් ය.

ආණ්ඩුව මත රඳා පවතිනවා වෙනුවට විරැකියාවේ, රෝගී වීමේ හෝ අබාධිත වීමේ අනතුරට එරෙහිව මහජනයාට තමන් ම රක්ෂණ ක්‍රමවලට ඇතුළත් විය හැකි ය. රක්ෂණ සමාගම්, වෘත්තීය සමිති සහ ස්වේච්ඡා සංවිධාන අදායම් නැති වීමේ අනතුර ආවරණය කරනු ඇත. රැකියා නැති අයට රැකියා ලබා ගැනීමට උදවු වීම සහ අවශ්‍ය අවස්ථාවල දී පුහුණුව සැපයීමත් ඔවුන්ගේ මුල්‍යමය ප්‍රතිලාභ සඳහා වනු ඇත.

වැඩ නොකර අනුන්ගෙන් ජීවත් වීමට කැමැත්තෙන් සිටින උදවියට වෙනුවට, අවංක ලෙස ම රැකියා අපේක්ෂා කරන අය අතට ගෙවීම් ලැබීම ඔවුන් විසින් සහතික කරනු ලැබේ. එමනිසා රැකියා විරහිතයන්ට රැකියා ලබා ගැනීමට ආධාර කිරීමේ දී පෞද්ගලික සුභසාධන වඩාත් ප්‍රතිඵලදායක වෙයි.

රක්ෂණ ක්‍රම මගින් ආවරණය නොවන සිදුවීම්වල දී ඵලදායි රාජ්‍ය නොවන විකල්ප සැපයීමට පෞද්ගලික පුණ්‍යායතනවලට හැකියාව ඇත. එක් එක් තැනැත්තන්ගේ අවශ්‍යතා පිළිබිඹු වන ලෙස ආධාර ක්‍රම සකස් කිරීමට ඔවුන්ට හොඳ හැකියාවක් ඇත. රජයේ සුභසාධන ක්‍රමවල දී ප්‍රධාන ප්‍රශ්නයක් වන ව්‍යාජ ඉල්ලීම් තොරා ඉවත් කිරීම ඔවුන්ගේ වඩාත් පෞද්ගලික ප්‍රවේශය නිසා පහසු වෙයි. අවාසනාවකට පුණ්‍යායතනවලට මෙම වටිනා කාර්යය කිරීම ඉතා අමාරු වී ඇත්තේ ආණ්ඩුවේ පාලනයන් හා ඉහළ බදු නිසා ය.

## වැඩිහිටි ප්‍රතිපාදන

දිළිඳු බවේ උගුලේ ඇති ප්‍රශ්න ආණ්ඩුවේ වැඩිහිටි ප්‍රතිපාදන මගින් පිළිබිඹු වෙයි. රජයේ විශ්‍රාම සහ ප්‍රතිලාභ මගින් මහජනයා තමන් වෙනුවෙන් ඉතිරි කිරීම අධෛර්යමත් කරයි. නරක ම දේ නම්, ආණ්ඩුවේ වැඩසටහන්වල ඉහළ යන වියදම මගින් බොහෝ බටහිර රටවල් බංකොලොත් වීමේ තර්ජනයට දැන් මුහුණ දී සිටියි.

හැම දෙනාට ම විශ්‍රාම වැටුප් ලබා දීමට ආණ්ඩු පොරොන්දු දී ඇතත් ඔවුන්ගේ පොරොන්දු ඉටු කිරීම සඳහා මුදල් වෙන්කර තැබීම හෝ සම්පත් මිලදී ගැනීම හෝ ඔවුන් කර නැත. යථාර්ථය නම් වෙනත් ඕනෑ ම සුභසාධන වැඩසටහනක් මෙන් ම රජයේ විශ්‍රාම වැටුප් ද ගෙවන්නේ දැන් එකතු කරන බදුවලින් බවයි.

මෙයින් අති විශාල අසාධාරණයක් සිදු වෙයි. ලබා ගන්නා මුදල හා බදු ලෙස ගෙවූ මුදල අතර ඇත්තේ අඩු සම්බන්ධතාවකි. ඒ වෙනුවට එය තීරණය කරන්නේ දේශපාලනඥයන් විසින් වන අතර එය සිදු වන්නේ දේශපාලන හේතු මුල්කර ගෙන ය. ඡන්ද ලබා ගැනීම සඳහා දේශපාලනඥයෝ බලගතු කණ්ඩායම්වලට විශේෂ අනුග්‍රහ දක්වති.

ඊට සම්පූර්ණයෙන් වෙනස් ව නිදහස් සමාජයක ජනයා කරන්නේ වැඩ කරන වයසේ දී ඉතිරි කර මුදල් එකතු කර වයස්ගත කාලයේ එම මුදල් භාවිත කිරීමයි. ඉතාම දිගු කාල පරිච්ඡේදයක් තිස්සේ ඉතිරි කිරීම් සිදු වන නිසා, බොහෝ දෙනා කරනු ඇත්තේ එක් ආකාරයක හෝ වෙනත් ආකාරයක දේපළ මිලදී ගෙන, එයින් ලැබෙන ආදායමේ ප්‍රතිලාභ ලබා ගැනීමයි. කොටස්, බැඳුම්කර, දේපළ සහ සමහර විට තමන්ගේ ම නිවසක් සදහා වැනි ආයෝජන එකතුවක් කිරීමට ජනයා ක්‍රියා කරනු ඇත.

මහජනයාගේ විශ්වාස විශාල ලෙස එකිනෙකට වෙනස් වන නිසා, ඔවුන්ගේ ඉතිරි කිරීම් හා ආයෝජන උපායමාර්ග ද එලෙස ම වෙනස් වනු ඇත. ඒ අතර ඉස්ලාම් මූලධර්ම මත ක්‍රියාත්මක අරමුදල් තිබිය හැකි ය . පුනර්ජනනීය බලශක්තිය සහ කාබනික ගොවිතැන සඳහා ආයෝජනය කළ 'හරිත අරමුදල' තිබිය හැකි ය. එමෙන් ම, ප්‍රාදේශීය

ලැදියාවකින් ආයෝජන අවස්ථා ලබා දෙන 'ප්‍රාදේශීය ප්‍රජා අරමුදල්' ද තිබිය හැකි ය. කාරණය කුමක් වුවත්, තමන්ගේ පෞද්ගලික තත්ත්වයන්ට සහ ලැදියාවන්ට හොඳින් ම ගැළපෙන ආකාරයට ප්‍රතිපාදන සකස් කර ගැනීමේ හැකියාව මහජනයාට ඇත. වැඩිහිටි සාමය සඳහා ඉතිරි කිරීමට මහජනයාට උපකාර කිරීම සඳහා එකිනෙකට වෙනස් අරමුණු, උපායමාර්ග සහ මූලධර්ම ඇති විවිධාකාර සංවිධාන ඇති වීමට නිදහස් වෙළඳ පොළ ප්‍රවේශය මගින් ඉඩ ලැබෙයි. ලාභ උපයන විශ්‍රාම අරමුදල්, රක්ෂණ සමාගම් සහ බැංකු සඳහා පැහැදිලිව ම ඉඩ ඇත.

නමුත් මෙම ක්ෂේත්‍රයේ ඉතා ම ප්‍රබලව තිබූ ලාභ නොලබන ස්වේච්ඡා සංවිධාන, දිගු කාලීන ප්‍රතිපාදන අනවශ්‍ය බවට පත් කළ සුභසාධක රාජ්‍යය මගින් ඉවතට තල්ලු කරනු ලැබී ය. මිත්‍රත්ව සමාජ, සමුපකාර ඉතිරි කිරීමේ බැංකු, සහ වෘත්තීය සමිති විසින් ඇති කරන යෝජනා ක්‍රම ආදියට විශාල වෙළඳ පොළක දිනාගත හැකි වනු ඇත. අඩු ආදායම්ලාභීන්ට පවා, කාලයක් යන විට සැලකිය යුතු විශාල ධනයක් උපයා ගැනීමට හැකි වනු ඇත.

සුභසාධනයෙන් දේශපාලනය ඉවත් කිරීමට පෞද්ගලික වැඩිහිටි ප්‍රතිපාදන උපකාර වනු ඇත. බරපතල ආර්ථික හා සමාජ ප්‍රතිවිපාක ඇති කරන දේශපාලන අනුග්‍රහයන් වර්තමානයේ පවතින ක්‍රම මගින් දිරි ගන්වයි. නිදහස් වෙළඳ පොළ විකල්ප මගින් ඉතිරි කිරීම්, දිගු කාලීනව කල්පනා කිරීම සහ මහන්සි වී වැඩ කිරීම දිරි ගන්වයි.

**සෞඛ්‍ය සේවා**

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ද ප්‍රතිසංස්කරණවල බරපතල අවශ්‍යතාවයක් පවතියි. ආණ්ඩුව විසින් පවත්වාගෙන යන සෞඛ්‍ය සේවා ක්‍රමවල ප්‍රතිඵලය වී ඇත්තේ දිගු පොරොත්තු ලැයිස්තු හා රෝගීන්ට දුර්වල සේවයක් ලැබීමයි. හොඳ ම උදාහරණය බ්‍රිතාන්‍යයේ ජාතික සෞඛ්‍ය සේවයයි.

ඇමරිකා එක්සත් ජනපදය වැනි, බොහෝ රටවල පෞද්ගලික හා රජයේ සෞඛ්‍ය සේවාවල එකතුවක් ක්‍රියාත්මක වුව ද, සෞඛ්‍ය ක්ෂේත්‍රය දැඩි පාලනයකට ලක් කොට ඇත. එහි ප්‍රතිඵලය ලෙස නිදහස් වෙළඳ පොළ තරඟයේ සම්පූර්ණ ප්‍රතිලාභ රෝගීන්ට හිමිවන්නේ නැත. සේවා ලබාදීමේ වියදම් ඉහළ යාමත්, නවීනතම ප්‍රතිකාරවලට අවස්ථා අහිමි කිරීමත් ආණ්ඩුවේ පාලනය නිසා සිදු වී තිබේ. බද්ධ කරන අවයව වෙළඳාම හෝ නව ඖෂධ භාවිතය වැනි ජීවිත ආරක්ෂා කරන ක්‍රියාකාරකම් පවා සම්පූර්ණයෙන් තහනම් කර තිබෙන අතර එය සෑම වර්ෂයක ම විශාල පිරිසක් මිය යෑමට වක්‍ර ලෙස හේතු වී තිබේ.

නිදහස් සමාජයක, විවිධ වෛද්‍ය දර්ශන අතර, විවිධ ආචාරධර්මමාලා අතර, ඖෂධවල ආරක්ෂිත බව සහ වෛද්‍යවරුන්ගේ වෘත්තිය සුදුසුකම් ඇගයීමේ විවිධ ක්‍රම පිළිබඳව, ආදී  විවිධ මට්ටම් රාශියක දී තරඟකාරීත්වය ඇති විය හැකි ය. විවිධ වර්ගයේ සෞඛ්‍ය සේවා සපයන්නන් අතර තරඟයක් පැවතිය හැකි අතර විවිධ වර්ගයේ ආයතන රාශියක් එකට පැවතිය හැකි ය.

මෙය වියදම් අඩු කිරීමටත්, නවතම ප්‍රතිකාරවලට ඉක්මනින් ප්‍රවේශය ලබා ගැනීම සහතික කිරීමටත් හේතු වෙයි. රෝගීන්ට සලකනු ඇත්තේ පාරිභෝගිකයන්ට වශයෙන් වන අතර සේවා  සැපයුම සිදු වනු ඇත්තේ  වෛද්‍යවරුන්ගේ හෝ සෞඛ්‍ය නිලධාරීන්ගේ වුවමනාවන් අනුව නොව රෝගීන්ගේ අවශ්‍යතා අනුව ය.

ලාභ උපයන රක්ෂණ සමාගම්, ආරෝග්‍යශාලා සමූහ ආදිය  තරඟකාරී වෙළඳ පොළෙ පැහැදිලි ලෙස තහවුරු වනු ඇත. එසේ වුව ද, සුභසාධක රාජ්‍යය ඔවුන්ට වල කපන්නට පෙර ලාභ නොලබන, ස්වේච්ඡා සංවිධාන රාශියක් ද සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රයේ ක්‍රියාත්මකව තිබූ බව අමතක කළ යුතු නැත.

මිත්‍රත්ව හෝ සහෝදරත්ව සමාජ, සමුපකාර සහ වෘත්තිය සමිති මගින් රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කොට තිබිණි. බොහෝ විට, ආරෝග්‍යශාලා පිහිටුවන ලද්දේ ස්වාධින, පුණ්‍ය හෝ අධ්‍යාපනික ආයතන වශයෙනි. නිදහස් සමාජයක සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රය නැවත වරක් එම විවධත්වය ඇති කර ගැනීමට නොහැකි වීමට හේතුවක් නැත.

නූතන සුභසාධන රාජ්‍යය තුළ සෞඛ්‍ය සම්පන්න ජීවන ක්‍රම තෝරා ගැනීමේ ප්‍රතිඵල ලෙස ඇති වන වියදම් අඩු වීමේ වාසිය අදාළ තැනැත්තාට ලැබෙන්නේ නැත. එබැවින් ආණ්ඩුව එම හිඩැස පුරවන්නට හදන්නේ ප්‍රචාරක ව්‍යාපාර, 'පව් බදු' සහ බරපතල පාලන නීතිවලිනි.

ඉහත පැහැදිලි කළ විකල්ප ක්‍රමවේද අනුව, සෞඛ්‍යට අදාළ පුරුදු සඳහා රක්ෂණ සමාගම් මිලක් නියම කිරීමට ඉඩ ඇත. දුම්බීම නවතන්නට හෝ ව්‍යායාම ආරම්භ කරන්නට කිසිවකු හිරිහැරයට ලක් නොවනු ඇත. කෙසේ වෙතත්, ඔවුන්ගේ සෞඛ්‍යය රක්ෂණ ගෙවීම් අඩු කර ගැනීමට, ඔවුන් එසේ කිරීමට තීරණය කරනු ඇත.

**සුභසාධන ක්‍රම අවශ්‍ය ඇයි ?**

ආණ්ඩුවේ සුභසාධනයේ අසාර්ථකත්වය, බදු මුදල් විශාල ලෙස යොදවා මෙම ක්‍රම පවත්වාගෙන යාම පිළිබඳ ප්‍රශ්නයක් මතු කරයි. ජීවිතයේ විවිධ අනතුරුවලට එරෙහිව තමන්ගේ ආරක්ෂාව සපයා ගැනීමට හා අමාරු කාලවල දී පිහිට වීම සඳහාත් මහජනයාට කුමන හෝ එක් ක්‍රමයක් වෙනුවට තරඟකාරී ක්‍රම දුසිම් ගණනක් හෝ සිය ගණනක් නොතිබිය යුත්තේ ඇයි ?

වෙනත් සෑම තැනක දී ම පිළිගත නොහැකි යයි සැලකෙන රජයේ පාලනයේ මට්ටම් ගණනාවක් පැවතගෙන යාමට සුභසාධනය සම්බන්ධයෙන් විශේෂ වූ කිසිවක් නැති බව පැහැදිලි කරුණකි.

උදාහරණයක් ලෙස, 'බ්‍රිතාන්‍ය විවේක ක්‍රමය'යයි යමක් නැත. ඇමෙරිකන්, ප්‍රංශ හෝ ජර්මන් ක්‍රම ද නැත .මේ හැම තැනක ම, මහජනයාට තම නිදහස් කාලය ගත කිරීමට ක්‍රම විශාල සංඛ්‍යාවක් ඇත 'විවේක කාල කර්මාන්තය' ලෙස සරලව හැඳින්විය හැකි දෙය කිසිවකු විසින් නිර්මාණය කළේ නැත. එය ඉබේ පරිණාමය වී ය.

තමන්ට විනෝද විය හැකි හෝ නිදහසේ ගත කළ හැකි ක්‍රම මහජනයා සොයති. තම ප්‍රදේශයේ ජනයාට විනෝද විය හැකි ක්ෂේත්‍ර පිළිබඳ ඉඟි ව්‍යවසායකයන් සතු වන අතර ඔවුහු සිනමා ශාලා, රාත්‍රී  සමාජ ශාලා හෝ සංචාරක ආයතන ගොඩ නගති. සමහර ආයතන අසාර්ථක වෙයි . සමහර ඒවා  සාර්ථක වෙයි.

කුමන හෝ එක් තනි ක්‍රමයක් වෙනුවට අපට දකින්නට ලැබෙන්නේ එකී නෙක සමග අන්තර් ක්‍රියා කරමින් හා තරඟ කරමින් පවතින එකිනෙකට වෙනස් වෙළඳ ආකෘතිවල වර්ග රාශියකි. මෙම සංකීර්ණ ව්‍යුහය දිගින් දිගට පරිණාමය වෙමින් සහ එහි හැඩය වෙනස් කර ගනිමින් පවතියි . නව ව්‍යපාරික අදහස්  සඳහා එය පරීක්ෂණ භූමියකි.

අපගේ නිදහස් කාලය වෙනත් අකාරයකට සංවිධානය කළ යුතු බව කිහිප දෙනෙක් කියති. එසේ වුව ද, සම්භාව්‍ය ලිබරල්වාදී හෝ නිදහස්වාදී ඉදිරි දර්ශනය අනුව එය ද 'බ්‍රිතාන්‍ය සෞඛ්‍ය සේවයක්' හෝ 'ප්‍රංශ විශ්‍රාම ක්‍රමයක' තිබිය යුතු බව කීම මෙන් ම විකාරයක් පමණකි.

**තෝරා ගැනීම සහ තරඟය මුදා හැරීම**

ආණ්ඩුවේ සුභසාධන ක්‍රමවලට නිදහස වෙළඳ පොළ  විකල්පයට නිදහස් තෝරා ගැනීම සහ අනවරත තරඟය ඇතුළත් විය යුතු ය. මෙය රජයේ සුභසාධනයට වඩා ඵලදායි වීමට ප්‍රධාන හේතු ගණනාවක් ඇත.

- තරඟකරුවන් වෙත තම පාරිභෝගිකයන් අහිමි වීමේ තර්ජනයට නිරන්තරයෙන් මුහුණ දෙන සේවා සපයන්නන්ට තම නිෂ්පාදිතයේ ගුණාත්මක බව දියුණු කිරීමේ සහ / හෝ මිල අඩු කිරීමේ ප්‍රබල දිරි ගැන්වීමකට මුහුණ දෙයි.

- මහජනයාගේ අවශ්‍යතා සහ ප්‍රර්ථනා ආණ්ඩුව සැබවින් ම දන්නේ නැත. පෞද්ගලික ව්‍යවසායකයින් සතුව ද මෙම දැනුම ඇත්තේ නැත.  එසේ වුව ද, ලාභය හා පාඩුව මගින් දිගින් දිගට ප්‍රතිපෝෂණය ඔවුන්ට ලබා දෙමින් වෙළඳ පොළ  ඔවුන්ගේ අදහස් පරීක්ෂාවට ලක් කරයි.

- ආණ්ඩුව මහජනයාගේ ප්‍රාර්ථනා දන ගත්තත්, ඒවා කොතරම් හොඳින් ඉටු කළ හැකි ද යන්න ගැන දැනුමක් එයට නැත. මෙම දැනුම වෙළඳ පොළ තුළින් සොයාගත යුතු ය. පෞද්ගලික අවශ්‍යතා සපුරාලන හොඳ ම ක්‍රමය නිරන්තරයෙන් සොයා ගන්නා පරීක්ෂා කිරීමේ හා වැරදීමේ ක්‍රියාවලියක් ලෙස වෙළඳ පොළ ක්‍රියා කරයි.

ආණ්ඩුවේ සුභසාධන ක්‍රම අසාර්ථක වීමේ හේතු පැහැදිලි කිරීමට මෙම තර්ක උපකාරී වෙයි. ඔබ ජනසතු සෞඛ්‍ය සේවයක් මෙහෙයවන බවත්, ආයෝජනය කිරීම සඳහා ඔබට තවත් රන් පවුම් දශ ලක්ෂයක් ලබාදුන් බවත් සිතන්න. රෝගීන් වඩාත් කැමති වන්නේ රෝග වැළැක්වීමේ ප්‍රතිකාර වලට ද, අලුත් ඖෂධවලට ද නැතහොත් වඩා හොඳ ශල්‍යාගාර පහසුකම්වලට ද, යන්න ඔබ දැනගන්නේ කෙලෙස ද ? එමෙන් ම එම ප්‍රතිකාර ලබාදිය යුත්තේ රෝහල් සායන තුළ ද, නැතහොත් නිදහස් වෘත්තික වෛද්‍යවරුන් ද ? පැහැදිලි ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් සහිත පරීක්ෂණ භූමියක් නොමැති බැවින්, ඔබට කරන්නට සිදුවන්නේ එක්කෝ දැනුවත් අනුමාන කිරීමක යෙදීමයි. නැතහොත් වෘත්තිකයන්ගේ උපදෙස් මත රැඳීමටයි. ජනසතු කර්මාන්ත තමන්ගේ පාරිභෝගිකයන්ගේ නොව සේවකයන්ගේ අවශ්‍යතා සැපිරීමට කටයුතු කරන තත්ත්වයක් තුළ දී, දෙවන ක්‍රමය යොදාගත් විට 'සැපයුම්කරුගේ ග්‍රහණයට ගොදුරු වීමේ ඉඩකඩ විවෘත වෙයි.

එබැවින් තරඟකාරීත්වයේ ශක්තිය මුදා හැරීම මගින් සුභසාධන භාණ්ඩවල විවිධත්වය ගුණාත්මක බව සහ දැරිය හැකි බව විශාල ලෙස ඉහළ නැංවිය හැකි ය .එය ආණ්ඩුවේ සිට පුද්ගලයන් වෙත ස්ථිර ලෙස බලය මාරු වීමක් ද වෙයි. දේශපාලනඥයන්ගේ පොරොන්දු මත රඳා පවතිනවා වෙනුවට තමන්ගේ ජීවිතවල ඉරණම තමන් අතට ගැනීමට මෙමගින් පුද්ගලයින්ට අවස්ථාව සැලසෙයි. සහෝදරත්වය සහ අන්‍යෝන්‍ය ආධාරය සඳහා ස්වේච්ඡා ප්‍රජා සංවිධාන ගොඩ නගා ගැනීමට ද පුද්ගලයින්ට මෙමගින් නිදහස හිමි වෙයි.

රාජ්‍යයට සුභසාධනයේ කාර්යයක් ඉටුකිරීමට අවශ්‍ය නම්, තමන්ට ම වූ රක්ෂණ ක්‍රම මිලදී ගැනීමට දිළිඳු ජනයාට හැකි වන ලෙස මුදල් හුවමාරුවකට එය සීමා විය යුතු ය. පුද්ගලික සමාගම් ,ස්වේච්ඡා සංවිධාන සහ පුණ්‍යායතන ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීම වැළකීමට ආණ්ඩුව තම බලය භාවිත නොකළ යුතු ය. සුභසාධන රාජ්‍යයට කරන විවේචනය බොහෝ විට පටලවා ගන්නේ දිළිඳු ජනයා ගැන අනුකම්පාවක් නැතිකම වශයෙනි. ඇත්තෙන්ම දිළිඳු ජනයාට ඉහළ ම ප්‍රතිලාභ හිමි වන්නේ නිදහස් වෙළඳ පොළ ප්‍රතිසංස්කරණවලින් ය. ආණ්ඩුවේ සුභසාධන අසාර්ථක වන විට අඩු ම බලපෑමට ලක් වන්නේ ධනවත් ජනතාවයි. ඔවුන්ට හැම විට ම වඩා හොඳ විකල්ප ලබා ගත හැකි ය. තෝරාගැනීමේ හා තරඟයේප්‍රතිලාභ ලබා ගැනීමේ අවස්ථා හිමි විය යුත්තේ අවාසිදායක තත්ත්වයේ සිටින්නන්ට ය.

### වැඩිදුර කියැවීම්


*Ashford, Nigel (1993) 'Dismantling the Welfare State: Why and How', Political Notes No. 86, London: Libertarian Alliance. . Online at: http://www.libertarian. co.uk/lapubs/polin/polin086.pdf*

*Bartholomew, James (2006) The Welfare State We're In, London: Politicos.*

*Chalupnícek, Pavel and Dvorák, Luka (2009) 'Health Insurance Before the Welfare State: The Destruction of Self-Help by State Intervention', The Independent Review, 13, 3, 367-387. . Online at : http://www.independent.org/ publications/tir/article.asp?a=714*

*Evans, Helen (2008) Sixty Years On: Who Cares for the NHS?, London: Institute of Economic Affairs. . Online at: http://www.iea.org. uk/record. jsp?ID=435&type=book*

*Micklethwait, Brian (1991) 'How and how not to demonopolise medicine', Political Notes No. 56, London: Libertarian Alliance. . Online at: http://www.libertarian.co.uk/lapubs/polin/polin056.pdf*

*Niemietz, Kristian (2007) 'From Bismarck to Friedman', Economic Affairs, 27, 2, 83-87.*

*Seldon, Arthur (ed) (1996) Re-Privatising Welfare: After the Lost Century, London: Institute of Economic Affairs*

# 9

# බැංකුකරණය, උද්ධමනය සහ අවපාතය

# බැංකුකරණය, උද්ධමනය සහ අවපාතය

**ඇන්තනි ජේ. එවන්ස් විසිනි**

*ඔබගේ වෙලාව සංඥාකරණ ඔරලොසුව හැඩ වුණේ උදේ 7.00 ට වන අතර ඔබට හිස කරකැවිල්ල සෑදී තිබිණි. ඔබ නිවසට පැමිණියේ පැය කිහිපයකයට පෙර වන අතර සතියේ දිනක රාත්‍රියේ මෙතරම් බී මත් වීම ගැනු පසුතැවිල්ලක් ද වී ය. නාන කාමරයට ගොස් ඉක්මනින් නා ගත්තද අවුල් සහගත බව දිගට ම දැනෙන්නට විය. ඔබට දැන් දරුණු හිසේ කැක්කුමක් දැනෙන්නට යන බවත්, ඔක්කාරය ඇති වෙමින් තිබෙන බවත් දැණිනි. නමුත් ඇඳ අසල අඩක් නිම වූ විස්කි බෝතලයක් තිබෙනු දැක ඔබ පුදුමයට පත් වී ය. තව ටික වේලාවක් ගත කිරීමට උගුරු කිහිපයක් ප්‍රමාණවත් වනු ඇත. ඔබට අවශ්‍ය වන්නේ දිනය ගත කිරීමට පමණකි. බෝතලය ඔබගේ සාක්කුවේ දාගෙන ඔබ දොර වෙත පිය මනිනු ඇත.*

1920 ගණන්වල ජර්මනිය, රොබර්ට් මුගාබේගේ සිම්බාබ්වේ, බුෂ් හා ඔබාමා යටතේ ඇමෙරිකාව හා නව කම්කරු පක්ෂය යටතේ බ්‍රිතාන්‍යයේ පොදු දේ කුමක් ද?

පිළිතුර නම් ආර්ථික ප්‍රතිපත්තිය දේශපාලන අරමුණු වෙනුවෙන් මෙහෙයවීමෙන් බැංක ක්‍රමය හා ආණ්ඩුව අතර ඇති වූ ව්‍යසනකාරී සම්බන්ධතාවයයි.

මූල්‍ය අර්බුදය පොදු දෙයක් වු අතර ආර්ථික ස්වයං විනාශය සඳහා වු මෙම ක්‍රියාවලියේ අවිධි තුනකි.

එනම් ආණ්ඩුවේ ණය, උද්ධමනය හා අවපාතයයි. ඉතිහාසය පුරා හා ලෝකය පුරා මෙය දක්නට ලැබිණි. මෙවා නිතිපතා සිදුවීම් ලෙස ද ඔබට හැඳින්විය හැකි ය. දැන් අපි මේ එක් එක් අවධියක් ගැන සලකා බලමු.

**ආණ්ඩුවේ ණය**

මුදල් වියදම් කිරීමට අපි සියලු දෙනා කැමැත්තෙමු. එමෙන් ම අපගේ ම මුදල් වියදම් කරනවාට වඩා අන් අයගේ මුදල් වියදම් කිරීමට අපගේ ඉතා වැඩි කැමැත්තක් ඇත. යුද්ධ සඳහා, සෞඛ්‍ය සේවා සඳහා, රජයේ වැඩ සඳහා ආදී කුමකට වුව ද ආණ්ඩුවේ වියදම් සඳහා ඇත්තේ අනන්ත වූ ආශාවක් වැන්නකි. දේශපාලකයන්ට වියදම් කිරීමට අවශ්‍ය වීම දේශපාලනයේ යථාර්ථයයි. (6 පරිච්ඡේදය බලන්න)

වියදම් පියවා ගැනීමේ සම්ප්‍රදායික ක්‍රමවේදය වුයේ බදු ආදායමයි. එසේ වුව ද එය ජනප්‍රිය නැත. බදු වැඩි වන විට මහජනයා කෝප විය හැකි ය. එබැවින් ණය මගින් වියදම් පියවා ගැනීමෙන් ඔබගේ කරදර අඩු වෙයි. (එමෙන්ම ඔබ නැවත පත් වීමේ ඉඩකඩ වැඩි වෙයි) බදු ගෙවන්නන්ට ඇත්තේ කෙටි දුර දැක්මක් වන නිසා වියදම් ආපසු ගෙවීම අනාගත පරපුරට භාරදිය හැකි ය.

ආණ්ඩු මුදල් ණයට ගන්නේ ආයෝජකයන්හට බැඳුම්කර විකිණීමෙනි. යම්කිසි නිශ්චිත කාලයක් තුළ පොලියක් ද සමග ආයෝජකයන්ගේ මුදල් ගෙවීමට ආණ්ඩුව බැඳී සිටින නිසා මේවා ක්‍රියාත්මක වන්නේ ණය ස්වරූපයෙනි. ආණ්ඩුවේ ක්‍රියාකාරකම්වලට මුදල් සපයා ගැනීමට මෙය ඉතා ම බලවත් කි.

ණය ගැනීමේ ඇත්ත බලය ආණ්ඩු පළමුවරට තේරුම් ගත්තේ ඉතාලි පුනරුදයෙනි. වෙනත් ආයතනවලට මෙන් නොව ආණ්ඩුවලට බදු අය කිරීමේ බලය හිමි ය. එම නිසා ඔවුන් ගත් ණයක් ආපසු නොගෙවීමට ඇති අවස්ථා සාපේක්ෂ වශයෙන් අඩු ය.

එසේ වුව ද බැඳුම්කර ද සීමා කිරීම්වලට යටත් ය. විශාල ප්‍රමාණයක ණය ගත හොත්, ආණ්ඩුවට ණය ගෙවා ගත නොහැකි වන බවට ආයෝජකයා තුළ බියක් හට ගත හැකි ය. රජයේ මුදල් ලබා ගැනීමේ දෙවැනි ක්‍රමය එන්නේ මෙහි දී ය. බදුකරණය හා ණය ගැනීම මෙන් නොව මෙය පෙනෙන්නේ ඉතා අඩුවෙනි.

පෞද්ගලික ව්‍යවසායකයන් ආණ්ඩුවේ බැඳුම්කර මිලදී නොගන්නා විට, එක්සත් ජනපදයේ ෆෙඩරල් රිසර්ව් හෝ බ්‍රිතාන්‍යයේ බෑන්ක් ඔෆ් එන්ග්ලන්ඩ් වැනි මහ

බැංකුවකට ඒ වෙනුවට එම මිලදී ගැනීම කළ හැකි ය. මෙහි දී සිදු වන්නේ රජයේ එක අංශයකින් අනෙක් අංශයට මුදල් ලබා දීමයි. ඓතිහාසික සියලුම ප්‍රධාන මහා උද්ධමනවලට හේතු වූයේ මෙයයි. 1920 ගණන්වල ජර්මනියේ දී, මේ දිනවල සිම්බාබ්වෙහි දී සිදු වන ලෙස මිල ගණන් වෙනසේ ඉහළ යාම සහ ආර්ථිකයන් බිඳ වැටීමට හේතු වුයේ මෙයයි.

මේ ආකාරයේ භයානක තත්ත්වයක් ඇති වීම වැළක්වීම සඳහා සංවර්ධිත රටවල් බොහෝමයක සිදු කොට තිබෙන්නේ මධ්‍යම බැංකු ස්වාධීන කිරීමයි. ආණ්ඩුවේ ණය පියවීමට මුදල් මවන ලෙස මධ්‍යම බැංකුවලට නියෝග කිරීමට දේශපාලනඥයන්ට ඉඩ නොතැබී ම ඉතාම වැදගත් ය.

එසේ වුව ද මුදල් සැපයුම තවමත් රජය සතු වන අතර තවමත් දේශපාලන කාරණයකි. මුදල් සැපයුම දිනපතා දේශපාලනඥයන්ගේ පාලනයට නතු වී නොතිබුණ ද ආණ්ඩුවේ ප්‍රතිපත්ති අනුගමනය කිරීමට මධ්‍යම බැංකුවලට දිගට ම සිදුවෙයි. ආර්ථිකය උද්ධමනයට ලක් කොට තම ණයවල වටිනාකම අඩු කිරීමට ක්‍රියා කිරීම තවමත් ආණ්ඩුවල වාසිය පිණිස ම වෙයි. අපට උද්ධමනකාරී කාලයක ජීවත් වීමට සිදුව තිබෙන්නේ මේ නිසා ය. මෙම ප්‍රශ්නය දැන් අපි තරමක් විස්තරාත්මකව විමසා බලමු.

**උද්ධමනය**

දශ ලක්ෂපතියකු වීමට ඔබ වියදම් කිරීමට සූදානම් මුදල කොපමණ ද? රන් පවුම් 100කට අඩු මුදලකට ඔබට ඉන්දුනීසියානු රුපියා දශ ලක්ෂයකට වඩා මිල දී ගත හැකි ය. (මෙය ලියන මොහොත වන විට), එසේ වුව ද ඔබට අවශ්‍ය වුයේ එය නොවිය හැකි ය.

මුදල් ගැන තේරුම්ගත යුතු ප්‍රධාන කාරණයක් නම් අප එහි වටිනාකම නියම කරන්නේ එක දෙයකින් බවයි. එනම් මිලදී ගැනීමේ හැකියාවයි. ඔබට එයින් කොපමණ දේ මිලදීගත හැකි වන්නේ ද යන්න අපි දැන ගන්නා තුරු දශ ලක්ෂපතියකු වීම එතරම් වැදගත් නැත.

උද්ධමනය යනු මුදලේ වටිනාකම අඩු වීමයි. එමෙන් ම ඕනෑම භාණ්ඩයක් සම්බන්ධයෙන් මෙන් ම මෙය සිදුවීමේ ප්‍රධාන හේතුව සැපයුමයි. උදාහරණයක් ලෙස මුදල් වැඩිපුර

තිබෙනවා නම් සහ එය වියදම් කිරීමට ඇත්තේ පෙර තිබූ භාණ්ඩ ප්‍රමාණයට ම නම් එම භාණ්ඩවල මිල ඉහළ යනු ඇත. ආර්ථික විද්‍යාඥ මිල්ටන් ෆ්‍රීඩ්මන් කළ ප්‍රසිද්ධ ප්‍රකාශය වන “උද්ධමනය යනු හැම විට ම හා හැම තැනක දී ම මුල්‍යමය සංසිද්ධියකි.” යන්නෙන් ඔහු අදහස් කළේ මිල ඉහළ යාමට ප්‍රධාන හේතුව මුදල් සැපයීම ඉහළ යාම බවයි.

එක්සත් රාජධානියේ මුදල් සැපයුම පාලනය කරන්නේ බෑන්ක් ඔෆ් එන්ග්ලන්ඩ් ආයතනයයි. මුද්‍රණය කරන මුදල් ප්‍රමාණය කොපමණ ද? ඒ අනුව බැංකුවල ණය දීමට වෙන් කළ හැකි මුදල් ප්‍රමාණය කොපමණ ද? යන්න තීරණය කරන්නේ එම බැංකුවයි. මෙය ඉතා ම සමාජවාදී ලෙස ඔබට පෙනී යනු ඇත. මුදල් සැපයුමෙහි ඒකාධිකාරී බලය සහිත බෑන්ක් ඔෆ් එන්ග්ලන්ඩ් රජය සතු ආයතනයකි.

මෙය හැම විට ම එලෙස පැවතුනේ නැත. 1946 පමණ වන තෙක් එය පැවතියේ පෞද්ගලික ආයතනයක් වශයෙනි. 1694 ට පෙර එවැන්නක් තිබුණේ නැත. එසේ වුව ද මුදල් තිබිණි. ඇත්තෙන්ම එකල “නිදහස් බැංකුකරණයේ” කොටස් තිබිණි. (රජය මුදල් සැපයුම පාලනය නොකළ) මෙයට ඉතාම ප්‍රසිද්ධ 19 ශත වර්ෂයේ මුල් භාගයේ ස්කොට්ලන්තයයි. එම සිදුවීම්වල දී තමන්ගේ ම බැංකු නෝට්ටු මුද්‍රණය කිරීමට පෞද්ගලික බැංකුවලට ඉඩ තිබුණු අතර ඒ අතරින් සුදුසු තෝරා ගැනීමකට පාරිභොග කයන්ට අවස්ථාව තිබිණි.

ඇත්තෙන් ම බැංකුකරණයේ නිදහස් වෙළඳ පොළක් තවදුරටත් පවතින්නේ නැත. බැංකුවල මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ බලය මධ්‍යම බැංකුවලට ලබා දී ඇත. අර්බුද අවස්ථාවක එයින් ඔවුන්ට ණය ලබා දීම සිදු කරයි. බැංකු කරණයේ නව ක්‍රමයක් බිහි වී ඇත. තම පාරිභෝගිකයන්ගේ මුදල් බේරා ගැනිමට නොහැකි වූ බැංකු බේරා ගැනීමට රජය පොරොන්දු වී ඇත. කණගාටුවට කරුණක් ලෙස මෙම ක්‍රමය තුළ අනතුරුදායක තීරණ ගැනීමට බැංකු දිරි ගන්වා තිබේ. ඔවුන් ඔට්ටු අල්ලා දිනුවහොත් ලාභය ඔවුන්ට තබා ගත හැකි ය. කෙසේ වෙතත් ඔවුන් පරාජය වුවහොත් මධ්‍යම බැංකුව හා ආණ්ඩුව තමන් බේරා ගන්නා බව ඔවුහු දනිති.

මධ්‍යම බැංකු මුදල් පාලනය කරන ප්‍රධාන ක්‍රමය නම් පොලී අනුපාතයයි. ඔවුන්ට බලපෑම් කළ හැකි ප්‍රධාන අනුපාත තුනක් ඇත. ඔබ මෙම මධ්‍යම බැංකුවක ප්‍රධානියා

යැයි සිතන්න. ඔබට හැසිරවිය හැකි දේවල් තුනක් ඇත. පළමු වැන්න නම් ''අන්තර් බැංකු අනුපාත නැතහොත් වාණිජ බැංකු එකිනෙක බැංකු අතර මුදල් ණයට ගැනීම්වල දී ගෙවන පොලී අනුපාතයයි.

මුදල් සැපයීම පාලනය කරන්නේ මධ්‍යම බැංකුවෙන් නිසා සංසරණයේ ඇති මුදල් ප්‍රමාණය වෙනස් කරමින් විශේෂිත ''මිලක් ඉලක්ක කිරීමට ඔබට හැකි ය. මෙය හඳුන්වන්නේ මූල්‍ය ප්‍රතිපත්තිය වශයෙනි. එනම් පොලී අනුපාතවලට බලපාන ලෙස මුදල් සැපයුම හැසිරවීමයි. අපට දැන ගන්නට ලැබෙන්නේ පොලී අනුපාත මධ්‍යම බැංකුව විසින් නියම කළ බව වුව ද එය ආවරණයක් පමණි. ඇත්ත වශයෙන් ම සියල්ල තීරණය වන්නේ මුදල් සැපයුමෙනි. හානිය සිදු වන්නේ උද්ධමනය වශයෙනි.

## අවපාතය

උද්ධමනයේ ප්‍රධාන ප්‍රතිවිපාකය සමස්ත මිල මට්ටමේ ඉහළ යාම බවට බොහෝ ආර්ථික විද්‍යාඥයෝ එකඟ වෙති. භාණ්ඩ කූඩයක ගිය වසරේ මිල වූයේ කුමක්දැයි බලා එහි මේ වසරේ මිල සන්සන්දනය කළහොත් එන වෙනස මගින් උද්ධමනයේ නියම මිනුම ලබා ගත හැකි ය. (පාරිභෝගික මිල දර්ශකය)
මෙම ක්‍රමයේ තිබෙන දුර්වලතාවයක් වන්නේ එය අසම්පූර්ණ නියදියක් වීම යි. එමගින් සියලු භාණ්ඩවල මිල ඉහළ  යාම සම්පූර්ණයෙන් ලබා ගත නොහැකි ය. අපගේ දත්ත මගින් ආර්ථිකයේ ඇත්තේ අඩු උද්ධමනයක් (2%ක් යැයි සිතමු) බව පෙන්නුම් කළ ද ආර්ථිකයේ උද්ධමනය සිදු වූ කොටසක් අපට මග හැරුණා විය හැකි ය. (උදා: නිවාස)

මිල මට්ටම් ඉහළ යාම නරක  දෙයක් වීමට හේතු ගණනාවක් ඇත. අප දැනටමත් දුටු පරිදි විශාල ලෙස ණය ගන්නා අයට (ආණ්ඩු වැනි) උද්ධමනය හොඳ දෙයක් වන්නේ එමගින් ඔවුන්ගේ ණයේ වටිනාකම අඩුවන නිසා ය. එසේ වුව ද ණය දෙන්නන්ට එය නරක දෙයකි. එයට හේතුව එයින් ඔවුන්ගේ ඉතිරි කිරීම්වල වටිනාකම අඩු වීමයි.

මිල වැඩි වීම මගින් ඇතැම් පුද්ගලයන් වඩා හොඳ තත්ත්වයටත් තවත් අය වඩා නරක තත්ත්වයටත් පත් වෙති. එමෙන් ම මෙමගින් අප උද්ධමනයේ තවත් ප්‍රතිවිපාකයක් වෙත ගෙන යයි. එය ඇත්තට ම තේරුම් ගත්තේ ආර්ථික විද්‍යාඥයන් කිහිප දෙනෙකු විසින් පමණකි. උද්ධමනය මගින් සමස්ත මිල ඉහළ  යන්නේ වුව ද ඒ මිල නැගීම් සියල්ල එක විට සිදු වන්නේ නැත. ඇතැම් මිල ඉහළ යාම් අනෙක් ඒවාට වඩා ඉක්මනින් සිදු වෙයි.

උද්ධමනයෙන් සිදු වන ප්‍රධාන හානිය නම් ආර්ථිකයේ සමස්ත ව්‍යුහය අවුල් කිරීමත්, එමගින් වේදනාකාරී නැවත සකස් කිරීම් (උදා: රැකියා විරහිත භාවය) නොවැළැක්විය හැකි තත්ත්වයට පත් කිරීමත් ය. මිල මගින් ඉතා වැදගත් කාර්යයක් ඉටු කරන්නේ එමගින් වෙළඳ පොළේ විකිණීමේ හා මිලට ගැනීමේ ක්‍රියාවලියේ නියැලී සිටින ජනයාට වැදගත් සංඥා ලබා දීම මගිනි. උද්ධමනය මෙම සංඥා විකෘති කරන අතර ප්‍රතිඵලයක් ලෙස ඇති වන්නේ අවුල් සහගත තත්ත්වයකි.

උදාහරණයක් ලෙස 2008 මූල්‍ය අර්බුද ගොඩනැගෙමින් පැවති කාලයේ ආධුනික දේපළ සංවර්ධකයන් නිවාස භාරගෙන ඉදිකර විකිණීම කළා විය හැකි ය. මාස ගණනාවක් වෙහෙසී වැඩ කිරීමෙන් හා ආයෝජනය කිරීමෙන් පසුව ඔවුන්ට ලාභයක් ලැබෙන්නට ඇත. එයට එක ම හේතුව වූයේ එම අතරවාරයේ නිවාස මිල ගණන් ඉහළ යාමයි. ඇත්තට ම සිදු වූයේ නිවාස සඳහා යෙද වූ දුලබ සම්පත් අපතේ යාමයි. උද්ධමනය මගින් ව්‍යාජ සාර්ථකත්වයක් පෙන්නුම් කළ ද උද්ධමනය වූ නිවාස මිල පහත වැටෙන විට වැරැද්ද පෙනී යන්නට විය. ඇත්ත ධනවත් බව විනාශ වී තිබිණි.

පොලී අනුපාත යනු ඉතිරි කිරීම් හා ආයෝජන සම්බන්ධීකරණය කරන මිලයි. වෙළඳ පොළ බලවේගවලට ක්‍රියා කිරීමට ඉඩ දුන් විට එමගින් ණයට දෙන්නන් හා ණයට ගන්නන් එකතු කිරීමත් වෙළඳ පොළ අනුපාතයන් නියම කිරීමත් සිදු වේ. පාරිභෝගිකයන් කෙතරම් ඉවසිලිවන්ත ද යන්න මෙයින් පෙනී යයි. අනාගතයේ වැඩි භාණ්ඩ ප්‍රමාණයක් සඳහා බලා සිටීමට ඔවුනගේ ඇති සූදානමේ තරම එය පෙන්නුම් කරයි.

එසේ වුවද , මධ්‍යම බැංකු මගින් මුදල් සැපයුම වැඩි කළ විට පොලී අනුපාත ද අඩු වේ. ඉතිරි කිරීම් ගැන පාරිභෝගිකයන්ට දඬුවම් දෙන අතර ණය ගැනීමට ව්‍යාපාර දිරිමත් කරයි. ප්‍රතිඵලය වන්නේ මහජනයා ඉතා අඩුවෙන් ඉතිරි කිරීම හා වැඩියෙන් පරිභෝජනය කිරීමයි. ආර්ථිකයේ සැබෑ ධනය වන ඉතිරි කිරීම්වල ප්‍රමාණය වෙනස් නොවන විට වටේ සංසරණය වීමට ප්‍රමාණවත් යමක් නොමැති වේ. ඇතැම් අවස්ථාවල දී පොරබැදීමක්, ණය හිරවීමක් ඇති වේ.

විලියම් මැක්චෙස්නි මාටින්ට අනුව මධ්‍යම බැංකුවක කාර්යය වන්නේ ''සාදයේ උනන්දුව වැඩි වෙන්න පටන් ගත් විට මිහිරි පැන් භාජනය ඉවතට ගැනීමයි. එසේ වුව ද, උද්ධමන කාලයේ එය වඩාත් සමාන වන්නේ වෙඩි තැබීමටයි.

මෙම පරිච්ඡේදය ආරම්භයේ සඳහන් කළ උපමා කතාව වෙත දැන් අපට නැවත පැමිණීමට හැකි ය. අප සියලු දෙනා දන්නා දෙයක් නම් කෙටි කාලීන පිළියම්වලින් කළ හැක්කේ හිසරදය ප්‍රමාද කිරීම පමණක් බවයි. හිසරදය බීමත් බවේ නොවැළැක්විය හැකි ප්‍රතිඵලයකි.

මෙහි දී සිදු වන්නේ සැබෑ ප්‍රශ්නයට විසඳුම් දීමක් නොවේ. කෘත්‍රිම උත්තරයක් පමණි. ප්‍රතිපත්ති සම්පාදකයෝ මෙම අතරමැදි තත්ත්වයට හැම විට ම මුහුණ දෙති. නමුත් දිගු කාලීන ලෙස සාර්ථකව සැලසුම් කිරීමට අපොහොසත් වෙති. ඇතැම් විට බෙහෙත් තිත්ත ය. එසේ වුව ද , දිගුකල් පවතින සනීපය ලැබෙන්නේ එයින් පමණකි.

ණය පියවීම සඳහා මුදල් නිර්මාණය අවශ්‍ය වන ආණ්ඩුවේ විශාල ණය ගැනීම් නිසා නිතිපතා ඇති වන උත්පාත අවපාත චක්‍රයක් අපට දැකිය හැකි වෙයි. වෙනත් වචනවලින් කිවහොත්, ආණ්ඩුවේ ණය, උද්ධමනය තුළින් මුදල් සෙවීම, ප්‍රතිඵලය ලෙස ඇතිවන අවපාතය වශයෙනි. මුදල් සැපයුමේ පාලනය දේශපාලනඥයන් සතු වන තාක්කල් මෙය මෙසේ ම සිදු වනු ඇත.

**වැඩිදුර කියැවීම්**

*Hayek" Friedrich A' ^2008& [1931] Prices and Production" Auburn" AL( Ludwig von Mises Institute' ' Online at( http($$mises'org$books$ pricesproduction'pdf*

*White" Lawrence H' ^2009& [1984] Free Banking in Britain( Theory" Experience" and Debate" 1800-1845" London( Institute of Economic Affairs' ' Online at( http($$www'iea'org'uk$record' jsp@ID}115&type}book*

*Woods" Thomas J' ^2009& Meltdown" Washington" D' C'( Regnery'*

# 10

# ආණ්ඩුවේ කාර්යභාරය

# ආණ්ඩුවේ කාර්යභාරය

**ස්ටීවන් ඩේවිස් විසිනි**

ඇත්තෙන් ම දේශපාලනයේ ප්‍රධානතම ප්‍රශ්නය වන්නේ ආණ්ඩු කළ යුත්තේ කුමක් ද? කුමන ප්‍රමාණයට ද? යන්නයි. වම හා දකුණ අතර බෙදුම් රේඛාව බොහෝ විට සපයන්නේ මෙමගිනි. (එසේ වුව ද අපට පෙනී යනු ඇති ආකාරයට කරුණු සිතනවාට වඩා බොහෝ සංකීර්ණ ය)

මෙයට පිළිතුරු රාශියක් දී ඇත. එක අන්තයක් නම් ආණ්ඩුව කළ යුතු කිසිවක් නැති බවයි. එනම් රාජ්‍යයක් නැති සමාජයක අපට වඩා හොඳින් ජීවත්විය හැකි බවයි. අරාජිකවාදීන් ලෙස හඳුන්වනු ලැබූ කුඩා නමුත් දැඩි මතයක සිටින කණ්ඩායමක් පසුගිය වසර දෙසීයක පමණ කාලය තුළ දැරූ ස්ථාවරය මෙයයි. කෙසේ වෙතත් එය ඉතා සුළුතරයකගේ අදහසකි. බොහෝ දෙනා සිතන්නේ එක හේතුවක් හෝ වෙනත් හේතුවක් නිසා ආණ්ඩුව නොවැළැක්විය හැකි සහ අවශ්‍ය ආයතනයක් බවයි.

සිත්ගන්නා සුලු කාරණය නම්, ඇතැම් පිරිසක් රජයක් අවශ්‍ය නැතැයි තර්ක කළ ද, ජීවිතයේ සියලූ අංශ සම්බන්ධයෙන් සියලූ දෙයට ආණ්ඩුව වගකිව යුතු බව කිසිවෙකු තර්ක නොකිරීමයි. මෙයට කිට්ටු ම තත්ත්වයට පත් වූයේ (රජයේ පාලනය උපරිම මට්ටමට තිබුණේ) කොමියුනිස්ට් හෝ ෆැසිස්ට් වර්ගයේ සර්ව අධිකාරීවාදී (totalitarian) රාජ්‍යයයි. දැනටත් පවතින කිට්ටු ම ස්වරූපය නම් උතුරු කොරියාවයි. කෙමර් - රූජ් පාලනය යටතේ කාම්බෝජය එය සැබෑවට ම සිදුවූ ස්ථානයයි. කෙසේ

වෙතත් බොහෝදෙනා සිතන්නේ ආණ්ඩුව කළ යුතු දෙයට සීමාවක් ඇති බව හා එය සියලු දේ නොකළ යුතු බවයි. එවිට තර්කය පවතින්නේ ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය සම්බන්ධ සීමාව ලකුණු කරන්නේ කොතරම් පුළුල් ලෙස ද කොතැනක ද යන්නයි.

## පුද්ගලික තෝරා ගැනීම හා දේශපාලන තෝරා ගැනීම

මෙය වඩාත් පැහැදිලි කර ගැනීමේ වෙනත් මාර්ගයක් තෝරා ගැනීම මෙහි ඇති ප්‍රශ්නයකි. මහජනයාට කළ හැක්කේ කුමක් ද? සම්පත් බැහැර කරන්නේ කෙලෙස ද? කියා තීරණය කරන පුළුල් ක්‍රම දෙකක් ඇත. එකක් නම් පුද්ගලයන්ගේ තීරණවලට එය භාර දීමයි. එය විශේෂිත පුද්ගලයෙකුගේ තනි තීරණයක් විය හැකි ය. එයට විකල්ප ලෙස ක්‍රීඩා සමාජ, වෘත්තීය සමිති, සමාගම් හෝ උදාහරණයක් ලෙස එක්ව රාත්‍රී ආහාරය ගැනීමට බැහැර යාමට තීරණය කරන අවිධිමත් කණ්ඩායමක් ලෙස පවා ස්වේච්ඡා පදනමෙන් මහජනයා සම්බන්ධ වන කණ්ඩායම් වශයෙන් සාමූහිකව එළඹෙන තීරණ ද මෙම පුද්ගල තීරණ යන්නෙන් අදහස් විය හැකි ය.

අනෙක් ක්‍රමය නම් ඒ මොහොතේ කැමැත්ත මගින් නොව සාමූහික ක්‍රමයක් මගින් නීතිමය ලෙස පුද්ගලයන් බැඳුනු හා සම්පත් බෙදාහරින ක්‍රමවේදයක් මගින් ක්‍රියාත්මක වීමයි. මෙය දේශපාලන ක්‍රියාවලියයි. ඡන්දය පාවිච්චි කිරීම මගින් ක්‍රියාත්මක කැමැත්තක් මෙහි ඇති බව ඔබ කියනු ඇත. එසේ වුව ද මොහොතක් කල්පනා කළ විට එය එසේ නොවන බව පෙනී යනු ඇත. දේශපාලන ක්‍රමය මගින් ඇති කරන නීති මගින්, ඡන්දය නොදුන් අයත්, බාල වයස්කරුවන් සහ පිටරට වාසය කරන්නන් වැනි ඡන්දය දිය නොහැකි අයත් යන සියලු දෙනා ම බැඳීමකට හසු කරයි.

මෙම වර්ගයේ දේශපාලන තෝරා ගැනීමක් හා පළමුව කියූ පෞද්ගලික තෝරා ගැනීමක් අතර වෙනස සරල උදාහරණයක් මගින් පෙන්නුම් කළ හැකි ය. පුද්ගල කණ්ඩායමක් එක්ව රාත්‍රී ආහාරය ගැනීමට බැහැර ගිය බව සිතන්න. පළමු සිදුවීමේ දී එක එක තැනැත්තා ආහාර වට්ටෝරුවෙන් තමන් කැමති ආහාරය තනි තනිව තෝරා ගනු ඇත. ආහාරය ගැන සාමූහිකව තීරණය කළ ද එයට සහභාගී නොවී වෙනත් තැනකට යන්න සෑම කෙනෙකුට ම නිදහස ඇත. ආහාරයේ සංයුතිය ඡන්දයකින් සාමූහිකව තීරණය කළා යයි සිතන්න. එවිට බහුතරයේ කැමැත්තට එකඟ වීමට සුළුතරයට සිදුවන අතර අඩු තරමින් බරපතල දඬුවමක් නොමැතිව ඉවත් වීමට හෝ

වෙනත් තැනකට යාමට හැකියාවක් නැත. මෙය ආණ්ඩුව මගින් ක්‍රියාත්මක දේශපාලන සාමුහික තීරණයට සමාන වෙයි.

## ප්‍රධාන විවාදය

එබැවින් ප්‍රශ්නය වන්නේ මෙයයි. ජීවිතයේ ක්ෂේත්‍ර කොපමණක් සහ සම්පත් බෙදී යාමේ කොතරම් ප්‍රමාණයක් දේශපාලන ක්‍රියාවලිය තුළින් තීරණය කළ යුතු ද? සහ කොපමණ ප්‍රමාණයක් පෞද්ගලික තෝරා ගැනීම විය යුතු ද ? උදාහරණයක් ලෙස අධ්‍යාපනයේ තෝරා ගැනීම් වැඩි ප්‍රමාණයක් සිදු වන්නේ පෞද්ගලික තීරණ මත නොව දේශපාලන ක්‍රියාවලිය මගිනි. වෙළඳසැල් සඳහා සත්‍ය වන්නේ එහි ප්‍රතිවිරුද්ධ දෙයයි. බොහෝ තෝරා ගැනීම් අවසානයේ තීරණය කරන්නේ පෞද්ගලික පාරිභෝගිකයන් විසින් වන අතර ටෙස්කෝ, වෝල්මාර්ට් වැනි සමාගම්වලට අවසානයේ සිදු වන්නේ ඔවුනට ප්‍රතිචාර දැක්වීමට යි.

මෙය ආණ්ඩුව කොතරම් විශාල විය යුතු ද යන ප්‍රශ්නය ම නොවේ. එහි දී ප්‍රශ්නය සමාජයේ සමස්ත නිෂ්පාදනයෙන් ආණ්ඩුව වියදම් කරන ප්‍රමාණය කුමක් ද ? යන්නයි. ක්‍රියාකාරකම් හා ජන ජීවිතයේ ක්ෂේත්‍ර සීමිත සංඛ්‍යාවක් ගැන පමණක් ආණ්ඩුවක් ක්‍රියාත්මක වනවා විය හැකි ය. කෙසේ වෙතත්, මෙම ක්ෂේත්‍ර සඳහා විශාල පිරිසක් ජනයා සේවයේ යෙදවීමට හෝ විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කිරීමට හෝ සිදු වී ඇත්තේ නම් එවිට එම අණ්ඩුව කරන්නේ වැඩ කිහිපයක් වුවත් ඔබට විශාල ආණ්ඩුවක් තිබිය හැකි ය. ඊට වෙනස්ව ජීවිතයේ බොහෝ අංශ පාලනය කරන හා ඒ ගැන තීරණ ගන්නා නමුත් එතරම් මුදලක් වියදම් නොකරන ආණ්ඩුවක් ඔබට තිබිය හැකි ය. වර්තමාන සිංගප්පූරුව එයට උදාහරණයකි. දැන් බ්‍රිතාන්‍යයේ තිබෙන ආණ්ඩුව විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරන (සමස්ත නිෂ්පාදනයෙන් අඩකට වඩා) අතර ජීවිතයේ බොහෝ අංශවලට බලපෑම් කරයි.

## වම සහ දකුණෙන් ඔබ්බට

සීමිත ආණ්ඩුවක් අවශ්‍ය අය සහ විශාල සහ පුළුල් ආණ්ඩුවක් අවශ්‍ය යැයි කියන අය අතර විවාදය ද හැම විට ම සරල නැත. විවාදය බොහෝ විට පවතින්නේ ඇතැම් දේට ආණ්ඩුව වගකිව යුතු බව කියන හා එසේ විය යුතු යැයි කියන ඇතැම් දේට එකඟ නොවන පිරිස් අතර වශයෙනි.

දේශපාලන තීරණ මගින් ආර්ථික ජීවිතයේ බොහෝ දේ පාලනය කළ යුතු නමුත් ලිංගික තෝරා ගැනිම් සහ ජීවන පැවැත්ම පිළිබඳ තීරණ ගැනීම පෞද්ගලික විය යුතු බව සිතන පිරිසක් සිටිති. එයට සම්පූර්ණ ලෙස ප්‍රතිවිරුද්ධව සිතන පිරිසකගේ අදහස වන්නේ ආර්ථික ජීවිතය පෞද්ගලික තෝරා ගැනීම මගින් පාලනය විය යුතු අතර සමාජ හා සංස්කෘතික ක්‍රියාකාරකම් ආණ්ඩුව සහ නීති මගින් මෙහෙයවිය යුතු බවයි. එසේ වුව ද, අචල "සාමූහිකවාදිනී" වන සමහරු සිතන්නේ ජීවිතයේ බොහෝ අංශ සාමුහික, දේශපාලන පාලනයකට යටත් විය යුතු බවයි. පෞද්ගලික තනි තීරණ ගැනීම උපරිම ලෙස පැවතිය යුතු බව සිතන වෙනත් අය "පුද්ගලවාදීහු" වෙති.

දැන් පෞද්ගලිකව තෝරා ගන්නා කාරණා වන බොහෝ දේ අතීතයේ දී පැවතියේ ආණ්ඩුවේ වගකීමට යටත්ව ය. ඉතා ම පැහැදිලි ක්ෂේත්‍රයක් නම් ආගමික විශ්වාස හා ඇදහීම් ය. වරෙක ආණ්ඩුවේ මූලික කාර්යයක් වු මෙය දැන් සම්පූර්ණයෙන් ම පෞද්ගලික සහ ස්වේච්ඡා  කාර්යයකි. තවත් අංශයක් නම් ඇඳුම් හා පරිභෝජනයයි. එමගින් විවාහ උත්සව වැනි දේට වියදම් කළ හැකි ප්‍රමාණ කොතෙක් ද යන්න රජය නියම කොට තිබූ අතර කෙනෙකුගේ සමාජ තත්ත්වය අනුව ඇඳිය හැකි ඇදුම් පිළිබඳ විස්තර කොට තිබිණි. මහජනයාට පැලඳිය හැකි හිස් වැසුම් හෝ පාවහන් වර්ග මොනවාදැයි තීරණය කරන තත්ත්වයට පවා ඔවුහු ගියහ. කෙසේ වෙතත් අප සිනා විය යුතු හෝ ස්වයං තෘප්තියට පත් වීම සිදුවිය යුතු නැත. කලෙක පෞද්ගලික තෝරා ගැනීම මත හෝ ස්වේච්ඡා  සාමුහික ක්‍රියාවක් හෝ  වූ  බොහෝ කාරණා දැන් ආණ්ඩුවේ වගකීමට යටත් වී ඇත. අධ්‍යාපනය එකකි. සෞඛ්‍යය තවෙකකි. තවත් ක්ෂේත්‍රයක් වන්නේ වැඩිහිටි ප්‍රතිපාදනයි. (8 වන පරිච්ඡේදය බලන්න) ජනතාවගේ ජීවන පැවැත්මේ තෝරා ගැනීම් ගැන පමණක් නොව ඔවුන්ට මව්පියන් වීමට ඉඩ දෙන්නේ ද යන්න ගැන පවා ආණ්ඩුවට අදහසක් තිබිය යුතු බවට බරපතල යෝජනා තිබේ. දෙවන ලෝක යුද්ධය හා ඊට පසු ආසන්න කාලයේ බොහෝ දෙනා තර්ක කළේ සලාක ක්‍රම මගින් ආණ්ඩුව ආපනශාලා හා ආහාර පාලනය කළ යුතු බවටයි.

**ආණ්ඩුවේ කාර්යභාරය තීරණය කිරීම**

එසේ නම් ජීවිතයේ කුමන ක්ෂේත්‍ර ගැන ආණ්ඩුව උනන්දුවක් දැක්විය යුතු ද යන්න ගැන තීරණය කිරීම සඳහා අපට යම් මුලධර්මයක් හෝ නීතිමාලාවක් තිබේ ද?

නැතහොත් විශේෂිත දේශපාලන අරගලයක විලාසිතා සහ ප්‍රතිඵල මත අප නිකම්ම රැඳී සිටිනවා ද?

නොවෙනස් පුද්ගලවාදී ස්ථාවරය වන්නේ සාමාන්‍යයෙන් සියලූ දේ තීරණය විය යුත්තේ පෞද්ගලික තෝරා ගැනීම් හා සවේච්ඡා  සහයෝගීතාවයෙන් බවයි. එයින් යම් වෙනසක් කිරීමට නම් ඒ සඳහා හේතු දැක්වීමක් අවශ්‍ය වෙයි. මෙහි දී කරුණු ඔප්පු කිරීමේ වගකීම පැවරී තිබිය යුත්තේ සාමුහික දේශපාලන තීරණ ගැනීම සහ ජීවිතයේ ඕනෑම ක්ෂේත්‍රයක ආණ්ඩුවේ කාර්යභාරය ගැන තර්ක කරන උදවියට ය. පෞද්ගලික තීරණ ගැනීමට ඉඩ දීම මූලික ස්ථාවරය විය යුතු බවට ප්‍රධාන කරුණු පහක්  ඉදිරිපත් කෙරෙයි.

- තමන්ගේ අවශ්‍යතා සම්බන්ධයෙන් හොඳ ම විනිශ්චයකරුවන් වන්නේ පුද්ගලයන් ය. එය කුමක් ද ?තමන්ට වැඩියෙන් වටින්නේ කුමක් ද? කියා ඔවුහු දනිති. ඔවුන්ගේ ම වටපිටාව ගැන හොඳින් ම දන්නේ ද ඔවුන් ය. තමන් ගැන හොඳින් ම දන්නේ තම සැමියන් බවට බොහෝ ස්ත්‍රීහු එකඟ වන නමුත් ඔවුන්ට තමන්ගේ ඇඳුම් මිලදී ගැනීමට ඉඩ දීමට සිහිනෙන්වත් සූදානම් නොවෙති. ඔබගේ දරුවන්ට ලැබිය යුතු අධ්‍යාපනය කුමක් ද? යන්න තීරණය කිරීමට පිටස්තරයකුට හෝ පිටස්තරයින් සමූහයකට හෝ ඉඩ දෙන්නේ ඇයි?

- පෞද්ගලික සංවර්ධනය හා සමෘද්ධිය ඇති වන්නේ ජනයාට තෝරා ගැනිමේ නිදහස සහ තමන් කරන තෝරා ගැනීම්වලින් ඉගෙන ගැනීමට ඉඩ දුන්නොත් පමණකි. ඔවුන්ට එම ඉඩ ලබා නොදෙන තරමට ඔවුන් ළමයින්ට සමාන තත්ත්වයෙන් සිටිනු ඇති අතර සංවර්ධනය නොවනු ඇත.

- සමාජ ප්‍රගමනයට හා සංවර්ධනයට වැඩි ම දායකත්වයක් ලබා දීමට හැකි වන්නේ පුද්ගලයන්ට තමා සඳහා කරන තෝරා ගැනීම් සඳහා හැකි උපරිම ලෙස ඉඩකඩ සලසා දීම මගිනි. නාවෝත්පාදනයේ හා නව සොයා ගැනීම්වලට මූලාශ්‍ර වන දෑ නිපදවන්නේ අසම්මත පුද්ගලයන් බව පරීක්ෂණවලින් හෙලි වී තිබේ.

- සාමූහික දේශපාලන තිරණ ගැනීමේ දී නොවැළැක්විය හැකි ලෙස අදහස් වන්නේ අන් අය කළ යුත්තේ කුමක්දැයි තීරණය කිරීමට විශේෂිත පුද්ගලයන් කණ්ඩායමකට බලය දීමයි. මෙය භයානක වනවා මෙන් ම සහ සදාචාරාත්මක

ලෙස සියලු දෙනා දූෂණයට ගොදුරු කිරීමකි. විශේෂයෙන් එයට ගොදුරු වන්නේ බලයේ සිටින පුද්ගලයන් ය. ඇක්ටන් සාමිවරයා කීවේ සියලුම බලය දූෂණයට හේතු වේ යනුවෙනි.

- අවසාන වශයෙන් සෑම සාක්ෂියක් ම ඇත්තේ පෞද්ගලික තෝරා ගැනීම් මත රඳා පැවැත්මට වඩා සාමූහික තීරණ ගැනීම සරල ලෙස අඩුවෙන් ඵලදායී බවටයි. එයින් පුද්ගලික අභිලාෂ අඩුවෙන් ඉටු වනවා පමණක් නොව විශාල සම්පත් නාස්තියක් ද සිදුවේ.

මෙයට ප්‍රතිවිරුද්ධ තර්කනයේ ප්‍රධාන අංග දෙකකි. පළමුවැන්න අප ඇත්ත වශයෙන් ම ළමයින්ට සමාන අභිලාෂයි. අපට හොඳ ම දේ අපි නොදනිමු. අපට ම තෝරා ගැනීමට ඉඩ දීමෙන් වන්නේ වැරදි තෝරා ගැනීම් සිදු වීමයි. එසේ වුවත්, පෙනෙන විදිහට ඇතැම් පුද්ගලයන් ළමයින් මෙන් නොවන අතර අපේ අනෙක් අයට හොඳ දේ තෝරා දීමට ද ඔවුන්ට හැකියාව ඇත. දෙවැනි කාරණය නම් සාමූහික සමාජ සත්ත්වයින් වන අපගේ පෞද්ගලික අනන්‍යතාව සහ පෞද්ගලික තෝරා ගැනීම යනු මිරිඟුවක් පමණක් බවයි. අප සියලු දෙනාට ම අවශ්‍ය එක ම දේවල් නිසා අපට තිබිය යුතු එම දේවල් මොනවාද කියා අපි සාමූහිකව තීරණය කළ යුත්තෙමු. මෙම සාමූහික තෝරා ගැනීම ක්‍රියාත්මක කළ හැකි යාන්ත්‍රණය වන්නේ ආණ්ඩුවයි.

මෙම වර්ගයේ තර්ක සත්‍ය මත හා පෞද්ගලික තෝරා ගැන්මට ඉඩ දීම ප්‍රායෝගික නොවන අවස්ථා ඉතා ස්වල්පයක් ඇත. එකක් විය හැක්කේ සාමූහික ජාතික ආරක්ෂාවයි. නීතියේ ප්‍රතිපාදන තවත් එකකි. කෙසේ වෙතත් මේවා සැලකිය යුතු වන්නේ සුවිශේෂී අවස්ථා වශයෙනි. ජීවිතයේ බොහෝ අංශ පෞද්ගලික තෝරා ගැනීම් මගින් මෙහෙයවිය යුතු අතර දේශපාලනයට හා ආණ්ඩුවට තිබෙන බල ක්ෂේත්‍රය තදින් ම සීමා කළ යුතු ය.

**වැඩිදුර කියැවීම්**


*Chodorov" Frank ^2007& One is A Crowd" Auburn" AL( Ludwig von Mises Institute' ' Online at( http($$mises'org$books$onecrowd'pdf*

*Higgs" Robert ^2005& Against Leviathan( Government Power and a Free Society" Oakland" California( Independent Institute'*

*von Humboldt" Wilhelm ^1993& The Limits of State Action" Indianapolis( Liberty Fund'*

*Mill" John Stuart ^2008& On Liberty" and Other Essays" Oxford( Oxford University Press'*

*Mises" Ludwig von ^2007& Bureaucracy" Indianapolis( Liberty Fund'-' Online at( http($$oll'libertyfund'org/*

රටක් ඉස්සරහට යන්න "නිදහස" අවශ්‍යයි. නිදහසේ හිතන්න, නිදහසේ අදහස් ප්‍රකාශ කරන්න, නිදහසේ ව්‍යාපාර කරන්න, නිදහසේ වෙළඳාම් කරන්න ජීවිතයේ හැම දේකටම නිදහස අපිට ඕන. 1948න් පසුව අපිට නිදහස ලැබුණට තවමත් අපිට නිදහස වගකීමෙන් පාවිච්චි කරන්න තිබෙන දැනුම ඉතාම අවමයි. බොහෝ වෙලාවට මහජන ප්‍රතිපත්ති සකස් වෙන්නේ සමාජයක් ඉදිරියට ගමන් කිරීමට "නිදහස" කියන සංකල්පයේ තිබෙන වැදගත්කම ගැන නොසළකමින්.

බොහෝ අයට "නිදහස" වගකීම් සහගතව භාවිතා කිරීමට ඇති දැනුම අඩු බව මහජන ප්‍රතිපත්ති සැකසීමේදී වගේම සමාජ සංස්ථාව ගොඩනැගීමේදී නිදහස ගැන අඩු අවධානයක් යොමු කිරීමට එක හේතුවක්.

"නිදහස" ගැන අවබෝධ කර කරගැනීමට "නිදහස මග" ඔබ කියවිය යුතුම පොතක්. සමාජය ගොඩනැගීමට නිදහස් අදහස් වල ඇති වැදගත්කම විවිධ මාතෘකා ඔස්සේ රචනා මාලාවක් ලෙස "නිදහස මග" ඔස්සේ ඔබට පිළිගන්වා තිබෙනවා. මේ පොතේ මුල් ප්‍රකාශණ අයිතිය ඇති ඇඩම් ස්මිත් (Adam Smith Institute) ආයතනයට මෙම පොතේ සිංහල පරිවර්තන අයිතිය අප වෙත ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වනවා. එලෙසම මෙම ග්‍රන්ථයේ මුල්ම සංස්කාරකවරයා වන ආචාර්ය රිචර්ඩ් වෙලින්ංස් මහතාටත් අපගේ ස්තූතිය පුදකරනවා.

මෙම ග්‍රන්ථයේ පරිවර්තන සම්බන්ධීකරණය සහ පරිවර්තනය සඳහා පහසුකම් සැලසූ නිදහස් සමාජයක් සඳහා වන එකමුතුවටත් (Network for a free soceity), පරිවර්තන සහය දැක්වූ We Translate ආයතනයටත්, ඇඩ්වොකාටා ආයතනයටත්, මෙම ග්‍රන්ථයට පෙරවදන රචනා කළ ආචාර්ය සරත් රාජපතිරණ මහතාටත්, එම ග්‍රන්ථය මුද්‍රණය කරන Ceylon Printers PLC ආයතනයත් අපගේ කෘතවේදීත්වය පළ පළ කරමු.

**නයිට් වොච්මන් සමාජය**
**(Nightwatchman Society)**

THE NIGHT WATCHMAN SOCIETY
SRI LANKA

© Nightwatchman Society
Web : https://www.nightwatchmansociety.org/

ISBN - 978-624-5481-00-2